# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2011

**ප්‍රධාන කාර්යාල :**

ජී-22, කෘෂිකර්ම අමාත්‍යාංශය,

ගොවිජන මන්දිරය,

අංක : 80/5, රජමල්වත්ත පාර,

බත්තරමුල්ල,

ශ්‍රී ලංකාව

**පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රය :**

ජයන්ති මාවත,

අනුරාධපුර,

ශ්‍රී ලංකාව

## <u>සභාපති වරයාගේ පණිවිඩය.</u>

කෘෂිකර්මාන්තය සහ පශ්චාත් අස්වැන්න පිළිබඳ විෂය දැනට ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අතිශය වැදගත් මාතෘකාවක් බවට පත්ව තිබේ. සෙසු ආසියානු රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව ඉහළ කෘෂිකාර්මික ඵලදායීතාවක් පෙන්නුම් කර තිබුණද පලතුරු සහ එළවළු වල පසු අස්වනු හානිය 30% - 40% වන අතර ධාන්‍ය හා මාංශ බෝග වල එය 10%- 15% වේ. මෙම හානිය සහ ඉහළ නිෂ්පාදන පිරිවැය යන හේතූන් නිසා කෘෂිකාර්මික නිෂ්පාදන වල වෙළඳපොළ මිල ඉතා ඉහළ අගයක් ගනී. එබැවින් කෘෂි බෝගවල පසු අස්වනු නාස්තිය අවම කර ගැනීමෙහිලා ප්‍රමුඛත්වය ලබාදීමට රජය ද තීරණය කර තිබේ.

පසු අස්වනු නාස්තිය අවම කර ගැනීම සහ කෘෂි නිෂ්පාදන වල ගුණාත්ම බව වැඩි දියුණු කිරීමේ අරමුණින් 2000 වර්ෂයේදී පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.පි.තා.ආ.) ස්ථාපිත කරන ලදී.මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉතා වැදගත් වූ පර්යේෂණ ව්‍යාපෘති, පුහුණු හා ව්‍යාප්ති වැඩසටහන් සහ සංවර්ධන වැඩ සටහන්, උපදේශන සේවා ආදී විවිධ වැඩසටහන් රාශියක් පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ක්‍රියාත්මක කර තිබේ. මේ සියළු කර්තව්‍යයන් පසු අස්වනු ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදු කරන ලදි. ඒවායේ ප්‍රතිඵලයක් ලෙස සුදුසු පසු අස්වනු තාක්ෂණයන් භාවිතා කිරීම කෙරෙහි වැඩි නැඹුරුවක් ඇතිවී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ කෘෂි ආහාර නිෂ්පාදනයේ අනාගත අභිවෘද්ධිය උදෙසා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් සපයනු ලබන සේවා ඉදිරියේ දී තවදුරටත් පුළුල් කිරීමට සැලසුම් කර තිබෙන අතර එහි ප්‍රතිලාභ රටේ සාමාන්‍ය ජනතාව විසින් භුක්ති විඳීමට අවකාශ සැලැස්වීම ආයතනයේ අපේක්ෂාව වන්නේය.

ජගත් පාලිත ජයවර්න,
සභාපති,
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

**අධ්‍යක්ෂවරියගේ පණිවිඩය**

ශ්‍රී ලංකාවේ වැඩිම අවධානයක් යොමු වන ක්ෂේත්‍රයක් වන කෘෂිකර්මාන්තයේ, කෘෂිකාර්මික බෝග වල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා විශාල කර්තව්‍යයක් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය සිදු කරයි. තත්ත්වය සහ පෝෂණ ගුණයන් ආරක්ෂා කර ගැනිම, අගය එකතු කිරීම සහ සැකසීම ආදී ක්ෂේත්‍රයන් පිළිබඳවද වර්තමානයේදී අවධානය යොමු කර ඇත. මෙම අරමුණු පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේද අරමුණු කොට ගෙන ඇත. ආයතනයේ පර්යේෂණයන් සහ සංවර්ධන වැඩසටහන් ඒ ඔස්සේ පෙළ ගස්සවා ඇත. මෙම කටයුතු බොහොමයක් ක්ෂේත්‍රයේ වර්තමානයේ පවතින ක්ෂේත්‍ර ගැටළු සහ ප්‍රමුඛතාවයක් දක්වන ක්ෂේත්‍රයන් සඳහා සිදු කෙරේ.

2011 වර්ෂයේදී ද පසු අස්වනු ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ ක්‍රියාකාරකම් පෙළගස්වා ඇත. ආහාරයට ගත හැකි ඉටි ආලේපන මගින් පළතුරු වල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම, භාවිතයට අහිතකර නොවන රසායනික ද්‍රව්‍ය (GRAS chemicals) භාවිතයෙන් පසු අස්වනු රෝග පාලනය කිරීම, ධාන්‍ය සහ අනෙකුත් කෘෂි බෝග සඳහා දැනට භාවිතා කරනු ලබන පසු අස්වනු තාක්ෂණයන් වැඩිදියුණු කිරීම සහ නව තාක්ෂණයන් හඳුන්වා දීම, විශේෂයෙන් ධාන්‍ය සැකසීම සහ පලතුරු සහ එළවළු පරිහරණය සහ ප්‍රවාහනය ඇතුළු පසු අස්වනු ක්ෂේත්‍රයේ වර්ථමාන තත්ත්වයන් ඇගයීම මෙම කර්තව්‍යයන්ගෙන් සමහරකි.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය අවධානය යොමු කරනු ලබන තවත් ක්ෂේත්‍රයක් වන්නේ තාක්ෂණ ප්‍රචාරණයයි. මේ යටතේ සංවර්ධන ව්‍යාපෘති ඇතුළු ප්‍රචාරණ වැඩසටහන් ගණනාවක් ආයතනය මගින් සිදු කරන ලදී. ග්‍රාමීය මට්ටමේ ගොවීන්, ගොවි කාන්තාවන්, විරැකියාවෙන් පෙළෙන්නන් සහ අනෙකුත් පාර්ශවකරුවන් මෙම වැඩසටහන් වලින් ප්‍රතිලාභ ලැබූහ.

තවද පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය එහි මානව සම්පත් සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන අතර ඒ ඔස්සේ අදාල පාර්ශවකරුවන් වෙත වඩා කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබා දීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා අවශ්‍ය පහසුකම් ලැබීමත් සමඟ රටේ පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේත් ශ්‍රී ලාංකික ප්‍රජාවගේත් උන්නතිය උදෙසා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය එහි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරයි.


ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න,

අධ්‍යක්ෂ ,

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ,

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
ජී - 22, කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
අංක 80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

31.03.2012

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා
කෘෂිකර්ම අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව - 2011**

වර්ෂ 1971 අංක 38 දරන මුල්‍ය පනතෙහි 14 (2) ඡේදය ප්‍රකාරව, වර්ෂ 2011 සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

ජේ. පී. ජයවර්ණ,
සභාපති,
පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

# පශ්වාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

# අධ්‍යක්ෂ මණ්ඩලය

| **නම** | **තනතුර** | **පැමිණීම** |
|---|---|---|
| ජගත් පාලිත ජයවර්ණ මහතා | සභාපති | දින 07 |
| නිනිඥ ගුණරත්න ගාල්ලගේ මහතා | උප සභාපති | දින 07 |
| ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මහතා | අධ්‍යක්ෂ | දින 06 |
| පාලිත ගොඩගමගේ මහතා | අධ්‍යක්ෂ | දින 07 |
| ආනන්ද අබේවික්‍රම මහතා | අධ්‍යක්ෂ | දින 07 |
| එන්.පී. සමීර හෙට්ටිආරච්චි මහතා | අධ්‍යක්ෂ | දින 07 |
| සුමනා යාපා මහත්මිය | අධ්‍යක්ෂ | දින 07 |

වර්ෂය තුළ පහත දිනවලදී රැස්වීම් පවත්වා ඇත.

2011.01.11, 2011.04.05, 2011.06.24, 2011.08.11, 2011.10.14, 2011.11.24, 2011.12.31

# විගණන සහ කළමනාකරණ කමිටුව

| නම | තනතුර | පැමිණීම |
|---|---|---|
| සුමනා යාපා මහත්මිය | ප.අ.පි.නා.ආ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි (සභාපති, විගණන සහ කළමනාකරණ කමිටුව) | දින 03 |
| ගුණරත්න ගාල්ලගේ මහතා | උප සභාපති | දින 03 |
| ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මිය | වැඩබලන අධ්‍යක්ෂ ප.අ.පි.නා.ආ. | දින 02 |
| ආර්.කේ.ජී.පී. රාමනායක මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)/ ගණකාධිකාරි ප.අ.නා.ආ. | දින 02 |
| ආර්.එම්.ඩී. රත්නායක මහතා | අභ්‍යන්තර විගණක - ප.අ.නා.ආ. | දින 03 |
| එම්.කේ.අයි. පද්මිණී මහත්මිය | සහකාර විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව<br>නිරීක්ෂක | දින 02 |
| කේ.එස්. දයාරත්න මහතා | විගණන අධිකාරි<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව<br>නිරීක්ෂක | දින 01 |
| ඩබ්ලිව්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>නිරීක්ෂක | දින 01 |

වර්ෂය තුළ පහත දිනවලදී රැස්වීම් පවත්වා ඇත.

2011.05.25, 2011.10.06, 2011.12.22

# අපගේ දර්ශනය

පසු අස්වනු තාක්ෂණය පිළිබඳ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය වීම

# අපගේ මෙහෙවර

වැඩිදියුණු කළ සහ යෝග්‍ය පසු අස්වනු තාක්ෂණයන්හි සංවර්ධනය, ව්‍යාප්තිය සහ වානිජකරණය තුළින් කෘෂි ව්‍යාපාර අංශයේ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම

# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

## වාර්ෂික වාර්තාව - 2011

### 1. සමාලෝචනය

කෘෂිකාර්මික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (ප.අ.පි.තා.ආ.) ධාන්‍ය, මාශ බෝග, තෙල් බෝග, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පළතුරු, එළවළු සහ කුළු බඩු බෝග සම්බන්ධයෙන් පසු අස්වනු තාක්ෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතෙහි ප්‍රතිපාදනයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1137/10 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2000 වර්ෂයේ ජූනි 19 වැනි දින පිහිටුවා ඇත. FAO/UNDP (ආහාර හා කෘෂිකර්ම සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ) සහයෝගීතාවය සමගින් 1976 වර්ෂයේ පිහිටුවන ලද වී අළෙවි මණ්ඩලයෙහි සහල් සැකසුම් පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයෙහි (RPRDC) කාර්යයන් පවරා ගෙන ඇත. සියලූ ක්ෂේත්‍රයන්හි බෝග සහ අස්වනු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්, එනම්, අස්වනු නෙළීම, ගබඩා කිරීම සහ සංරක්ෂණය, ප්‍රාථමික සහ ද්විතීයික සැකසුම්, නිෂ්පාදන සංවර්ධන, තත්ත්ව සහතික සහ අතුරුඵල ප්‍රයෝජනයට ගැනීම සිදූ කරනු ලබන ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනය ලෙස මෙම ආයතනය පිළිගැනේ.

### ආයතනයෙහි අරමුණූ

ගැසට් නිවේදනය මගින් ලබා දී ඇති බලතල අනුව, ශ්‍රී ලංකාවේ පසු අස්වනු තාක්ෂණ සංවර්ධනය සඳහා පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීමේ සහ ප්‍රමුඛත්වය ලබා දීමේ අභිමතාර්ථයෙන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නියෝජිතායන සමූහනය කිරීමේ සම්බන්ධීකාරක වශයෙන් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ක්‍රියාකාරී වෙතැයි අපේක්ෂා කෙරේ. කල් තබා ගත නොහැකි සහ කල් තබා ගත හැකි ආහාර බෝගයන්හි පශ්චාත් අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙය වීම තුළින් ආයතනය පහත සඳහන් අරමුණූ සාක්ෂාත් කර ගත යුතු වේ.

අ) වැඩිදියුණූ කළ, පිරිවැය ඵලදායි තාක්ෂණවේදයන් හඳුන්වා දීම තුළින් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි පශ්චාත් අස්වනු හානි වැළැක්වීම මගින් ඔවුන්ගේ අළෙවි අතිරික්තය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් වැඩි වනු ඇත. ජාතික මට්ටමේදී එවැනි වැඩ පිළිවෙළක් මගින් පරිභෝජනය සහ අවශ්‍ය ආහාර ද්‍රව්‍යයන්හි ප්‍රමාණාත්මක ඉහළ යැමක් ඇති වනු ඇත.

ආ) අවිධිමත් පසු අස්වනු පරිහරණය කිරීමේ, ගබඩා කිරීමේ සහ සැකසීමේ ක්‍රමවේදයන් යොදා ගැනීම හේතුවෙන් ධාන්‍ය, ක්ෂේත්‍ර බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදූ වන තත්ත්ව හානිය වැළැක්වීම තුළින් වෙළඳපළ කරා ලගා වන මෙම අත්‍යවශ්‍ය වෙළඳ ද්‍රව්‍යයන්හි තත්ත්වය

සැලකිය යුතු ලෙස ඉහළ නැංවේ. නිෂ්පාදනයෙහි තත්ත්වය වැඩි දියුණු වීම තුලින් ඔවුන්ගේ අගය එකතු කල නිෂ්පාදන තරඟකාරී වෙළඳපළ තුල වඩාත් වැඩි මිලකට අළෙවි කර ගැනීමට හැකි වීමෙන් කෘෂි කර්මාන්තයෙන් ඔවුන් උපයන ආදායම ඉහළ නංවා ගත හැකි වනු ඇත.

ඇ) අවිධිමත් පශ්චාත් අස්වනු ක්‍රමවේද යොදා ගැනීම තුළින් ධාන්‍ය, මාශබෝග සහ අනෙකුත් ආහාර බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගයන්හි සිදු වන පෝෂණ හානිය වැළැක්වීම සහ එමගින් දිවයිනෙහි පෝෂණ තත්ත්වයන් ඉහළ නැංවීම.

ඈ) අවාරයේදී වඩාත් වාසි සහගත මිල ගණන්වලට ගොවියන්ගේ නිෂ්පාදනයන් විකිණීම තුළින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා ගොවිපළ මට්ටමේ ගබඩා සහ සංරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම.

ඉ) කෘෂි පාරිභෝගික ද්‍රව්‍යයන්හි නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා අවම ශ්‍රමයක් යොදා ගන්නා වැඩිදියුණු කළ පශ්චාත් අස්වනු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

ඊ) ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමින් කෘෂි - පදනම් කර්මාන්ත ව්‍යාප්ත කොට ප්‍රවර්ධනය කිරීම.

උ) දේශීය ධාන්‍ය නිෂ්පාදනය සඳහා ඉහළ අළෙවි ඉල්ලුමක් ඇති කිරීම පිණිස ධාන්‍ය, මාශ බෝග, පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගවලින් සකස් කරන ආහාර පාරිභෝගිකයින් අතර ජනප්‍රිය කරවීම. ඉහළ පෝෂණ වටිනාකමක් සහිත මෙම ආහාර පරිභෝජනය ඉහළ යාම දිවයිනෙහි පෝෂණ තත්ත්වය වැඩිදියුණු වීමටද හේතු වනු ඇත.

***ප.අ.පි.තා.ආ. ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය***

***පර්යේෂණ ක්‍රියාකාරකම්***

2011 වර්ෂයේ පර්යේෂණ වැඩසටහනට අනුව, මූලික සහ ව්‍යවහාරික පර්යේෂණ යන දෙවර්ගයම, (පර්යේෂණ ප්‍රයත්නයන්ගෙන් ප්‍රමුඛත්වය ව්‍යවහාරික පර්යේෂණ වලට ලැබී තිබුනි) ඇතුළත්ව ආයතනයේ පර්යේෂණ ක්‍රියාකාරකම් පශ්චාත් අස්වනු කර්මාන්තය මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සඳහා අඛණ්ඩව සිදු කෙරුනි. 2011 වර්ෂය තුළදී පර්යේෂණ ව්‍යාපෘති 17ක් ආරම්භ කර ඇති අතර පර්යේෂණ ව්‍යාපෘති 18ක් 2010 වර්ෂයේ සිට කර ගෙන යනු ලැබේ. මෙම පර්යේෂණ සොයාගැනීම් පශ්චාත් අස්වනු ක්ෂේත්‍රයේ වැඩිදියුණුව සඳහා එම ක්ෂේත්‍රය තුළ ව්‍යාප්ත කිරීමට අමතරව, අධ්‍යයන ප්‍රතිඵල ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ, විවිධ විශ්වවිද්‍යාල මගින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ ජාත්‍යන්තර සඟරාවන්හි ප්‍රකාශයට පත් කර ඇත. 2010 වර්ෂයේ සිට පවත්වා ගෙන ආ (පහත පර්යේෂණ ව්‍යාපෘති) වර්ෂයේ පළමු කාර්තුව තුළ (2011 මාර්තු 31 දක්වා) කර ගෙන ගොස් සම්පූර්ණ කර ඇත.

a) ලික්ස් ප්‍රවාහනය සඳහා සුදුසු අසුරනයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

b) කෙසෙල් සඳහා ඇසුරුම් පද්ධතියක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

c) නැවුම් නිපැයුමක් ලෙස දෙහිගෙඩි වල ජීව කාලය (shelf life) දීර්ඝ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

d) පැහිරි කුලයේ පළතුරු සඳහා පරිභෝජනයට සුදුසු ඉටි ආලේපනයක් සකස් කිරීම

e) මඤ්ඤොක්කාවල පශ්චාත් අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම

f) පළතුරු අපද්‍රව්‍ය යොදා ගනිමින් පළතුරු විනාකිරි සහ විනාකිරි බීම වර්ග නිෂ්පාදනය කිරීම

g) ශ්‍රී ලංකාවේ මෑතකදී නිර්දේශ කළ සහ සාම්ප්‍රදායික සහල් ප්‍රභේදයන්හි භෞතික, රසායනික, පරිභෝජනය කිරීමේ සහ පිසීමේ තත්ත්වයන් ඇගයීම

h) තැම්බූ සහ අර්ධ වශයෙන් තැම්බූ සහල් ("ග්‍රාමීය සහල්"/ "බඩ බත්") වල පෝෂණීය පිසීමේ සහ පරිභෝජනය කිරීමේ තත්ත්වයන් සංසන්දනය කිරීම

i) තැම්බූ සහල්වල තත්ත්වය මත පෙඟවීමට යොදා ගන්නා ජලයෙහි තත්ත්වයෙහි බලපෑම

j) ගබඩාගත වී ආශ්‍රිත කෘමීන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ දැනට පවතින කෘමි නාශකවල සඵලත්වය සහ විෂ බව පරීක්ෂා කිරීම

k) සහල් පදනම් කර ගත් ශීත කළ අතුරුපසක් සංවර්ධනය කිරීම (සහල් අයිස් ක්‍රීම්)

l) බඩ ඉරිඟු පොතු හැරීම සඳහා පවතින පාවර යන්ත්‍රයෙහි කාර්යසාධනය ඇගයීම

m) ලොකු ලූණු සඳහා දැනට පවතින පශ්චාත් අස්වනු තත්ත්වයන් වැඩිදියුණු කිරීම තුළින් නිෂ්පාදන තත්ත්වය සහ ගබඩා ජීව කාලය වැඩිදියුණු කිරීම

n) කුරක්කන් නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා මධ්‍ය පරිමාණයේ නිෂ්පාදන ක්‍රියාවලියක් හඳුන්වා දීම

o) ගම්මිරිස්වලින් ගල් ඉවත් කිරීමේ යන්ත්‍රයක් නිර්මාණය කිරීම

p) සාදික්කා සඳහා වියළීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම

q) විවිධ වර්ගයේ කුළු බඩු නිෂ්පාදන සඳහා විවිධ වර්ගයේ කුළු බඩු ඇඹරීමේ යන්ත්‍රයන්හි ක්‍රියාකාරීත්වය ඇගයීම

r) තැම්බූ සහල් සඳහා මධ්‍ය පරිමාණයේ අප ජල පිරියම් යන්ත්‍රාගාරයක් සකස් කිරීම

**2011 වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති**

a) සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඇගයීම

b) සහල් පිටි කර්මාන්තය සඳහා බලශක්ති කාර්යක්ෂම අංශු අනුක්‍රමකයක් (particle grader) නිර්මාණය කිරීම

c) කුඩා පරිමාණයේ වී වේලන යන්ත්‍රයක් නිර්මාණය කිරීම

d) සහල් පිටිවල තත්ත්වය වැඩිදියුණු කිරීමේදී පූර්ව - ජෙලටිනීකරණයෙහි කාර්යභාරය

e) සහල් මෝල් කර්මාන්තයේ සහල් තැම්බීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

f) වානිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා ආහාරයට ගත හැකි පළතුරු ඉටි සකස් කිරීම

g) තක්කාලිවල පශ්චාත් අස්වනු රෝගාබාධ පාලනය සඳහා GRAS රසායන ද්‍රව්‍ය යොදා ගැනීම අධ්‍යයනය කිරීම

h) සුපිරි වෙළඳ සැල් සැපයුම් දාමය සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිතය:විෂය අධ්‍යයනයකි

i) ශ්‍රී ලංකාවේ තිබෙන තෝරා ගත් ඖෂධීය ශාක වල ප්‍රතිඔක්සිකාරක ගුණයන් හඳුනා ගැනීම සහ සහල් ආශ්‍රිත ඖෂධීය නිෂ්පාදන සකස් කිරීම

j) මුරුංගා (*Moringa Oleifera*) කොළ පදනම් කර ගත් පෝෂණ මුසුවක් සහ පාන් තැවරුමක් සකස් කිරීම

k) සහල් පදනම් කර ගත් නව කෙටි කෑම සකස් කිරීම

l) නව ready to serve පළතුරු නිෂ්පාදන සකස් කිරීම තුළින් අඩු භාවිතයෙන් යුත් පළතුරුවල වටිනාකම ඉහළ නැංවීම

m) කෙසෙල් සඳහා ඇසුරුම් ක්‍රමයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම

n) ලොකු ලූණු සඳහා දැනට පවතින පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම තුළින් නිෂ්පාදන තත්ත්වය සහ ගබඩා ජීව කාලය වැඩිදියුණු කිරීම

o) කුරක්කන් නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා මධ්‍ය පරිමාණයේ සැකසුම් ක්‍රියාවලියක් හඳුන්වා දීම

p) සාදික්කා සඳහා වියලීමේ යන්ත්‍රයක් සැලසුම් කිරීම සහ සකස් කිරීම

q) ශ්‍රී ලංකාවේ මෑතකදී නිර්දේශ කළ සහ සාම්ප්‍රදායික සහල් ප්‍රභේදයන්හි භෞතික, රසායනික, පරිභෝජනය කිරීමේ සහ පිසීමේ තත්ත්වයන් ඇගයීම

r) නිෂ්පාදන පිරිවැය පහත හෙළීම සඳහා පවතින නූඩ්ල්ස් සැකසුම් ක්‍රමවේදයෙහි (ප.අ.පි.තා.ආ.) වෙනස්කම් ඇති කිරීම

***සහයෝගිත්ව වැඩසටහන්***

උපාධි අපේක්ෂකයින් සඳහා කෘෂි ඉංජිනේරු සහ ආහාර / පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයන්හි අවසන් වසරෙහි පර්යේෂණ ව්‍යාපෘති ප.අ.පි.තා.ආ.යේදී පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම මගින් ජාතික විශ්වවිද්‍යාල සමඟ සහයෝගිත්ව පර්යේෂණ වැඩසටහන් සංවිධානය කිරීමට ප.අ.තා.ආ. සමත් වී ඇත. සමාලෝචිත වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ. පර්යේෂණ කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පේරාදෙණිය, වයඹ, සබරගමුව, රජරට සහ විවෘත විශ්වවිද්‍යාලවල සිසුන් 17 දෙනෙකු තම අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව සම්පූර්ණ කර ඇත.

***තාක්ෂණ ව්‍යාප්තිය***

ආයතනය මගින් සංවර්ධිත පසු අස්වනු තාක්ෂණයන් ඵලදායීව ව්‍යාප්ත කිරීම සඳහා, 2011 වර්ෂය තුළදී ප.අ.තා.ආ. පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති දිවයින පුරා පවත්වා ඇත. "අපි වවමු-රට නගමු" වැඩසටහන මගින් මෙම ව්‍යාපෘති සඳහා අරමුදල්සැපයිණි.

a) වැඩිදියුණු කළ ජංගම පළතුරු සහ එළවළු සිල්ලර අළෙවි හලක් හඳුන්වා දීම

b) ග්‍රාමීය මට්ටමින් කෘෂි-සැකසුම් ව්‍යාපාර (ධාන්‍ය සහ කුළුබඩු) ආරම්භ කිරීම

c) ග්‍රාමීය මට්ටමින් පළතුරු ආශ්‍රිත නිපැයුම් ක්ෂුද්‍ර ව්‍යාපාර ආරම්භ කිරීම

d) සහල් පිටි ඇඹරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීම

e) සහල් සැකසුම් ගම්මානයන්හි ක්‍රියාත්මක වන තෝරා ගත් කුඩා හා මධ්‍ය පරිමාණ සහල් ඇඹරුම් හල්වල පහසුකම් වැඩිදියුණු කිරීම

f) පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් භාවය ඇති කිරීම සහ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම

g) ගොවි මහතුන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවිපළ (on-farm) ගෘහස්ථ වී ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම

h) ග්‍රාමීය මට්ටමින් සහල් නිෂ්පාදන නිපැයුම් ක්ෂුද්‍ර ව්‍යාපාර ආරම්භ කිරීම

**පහත ව්‍යාපෘති සඳහා ප.අ.පි.තා.ආ. මගින් අරමුදල් සැපයිණි.**

a) ආදර්ශ ගම්මාන වැඩසටහන - 2011

b) ග්‍රාමීය ප්‍රදේශයන්හි කෘෂි පදනම් ක්ෂුද්‍ර ව්‍යාපාර හඳුන්වා දීම

c) පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන්

d) සහල් පිටි ඇඹරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීම

e) සහල් පිටි ඇඹරුම්හල්වල ඵලදායීතාව නැංවීම සඳහා සහල් ඇඹරුම් කර්මාන්තය යාන්ත්‍රීකරණය කිරීම දේශීයව නිෂ්පාදිත සහල් වැඩිදියුණු කිරීම

f) සහල් පිටි යොදා ගනිමින් නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා නූඩ්ල්ස් නිෂ්පාදන යන්ත්‍රයන්හි (ප.අ.පි.තා.ආ.) සැකසුම් ක්‍රියාවලිය වෙනස් කිරීම

g) ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම සහ සහල් පිටි ඇඹරුම් හල් වැඩිදියුණු කිරීම (ලෝක ආහාර වැඩසටහන)

### *පුහුණු ක්‍රියාකාරකම්*

ප.අ.පි.තා.ආ. පුහුණු ක්‍රියාකාරකම් නිෂ්පාදනය / ව්‍යාප්තිය දිශානත වන අතර, ධාන්‍ය, අල සහ බල්බ, පළතුරු සහ එළවළු වර්ගයන්හි පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියැලි රාජ්‍ය සහ පෞද්ගලික අංශ නියෝජිතායතනයන්හි නිෂ්පාදකයින්, සැකසුම්කරුවන්, වෙළඳ ව්‍යාපාරිකයන් සහ ව්‍යාප්ති සේවකයින්ගේ දැනුම ඉහළ නැංවීම උදෙසා ඉලක්ක කර ඇත. කෙසේවෙතත් සීමිත ප්‍රමාණයකට විශ්වවිද්‍යාල සහ අනෙකුත් ශාස්ත්‍රීය ආයතන සිසුන් සඳහා පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ අත්දැකීම් ලබාදෙමින් පර්යේෂණ දිශානත පාඨමාලා ද පවත්වා ඇත. 2011 වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ.හි පුහුණු කටයුතු සඳහා ඉල්ලුම සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂය තුළදී අධ්‍යයන චාරිකා ද ඇතුළත්ව නේවාසික පුහුණු පාඨමාලා 65ක් පවත්වා ඇති අතර පුද්ගලයින් 1029ක් පුහුණු කර ඇත.

### *ව්‍යාප්ති ක්‍රියාකාරකම්*

2011 වර්ෂය තුළදී ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් වන ක්ෂේත්‍ර මට්ටමින් තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ කාර්ය කරගෙන ගොස් ඇත. ගොවි මහතුන්, පළතුරු සහ එළවළු එක් රැස් කරන්නන් සහ වෙළඳ මහතුන් විශාල සංඛ්‍යාවකට ඵලදායී ව්‍යාප්ති ක්‍රියාකාරකම් ලබා දීම පිණිස දිවයින පුරා ක්ෂේත්‍ර මධ්‍යස්ථාන 09ක් පිහිටුවන ලදී. මෙම වැඩසටහන යටතේ අනුරාධපුර, අම්පාර, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, හම්බන්තොට (මයුරපුර), ගාල්ල, කුරුණෑගල (අඹන්පොළ) සහ මාතර ක්ෂේත්‍ර මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ති ක්‍රියාකාරකම් අම්පාර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් මයුරපුර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, නුවර එළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයන් නුවර එළිය ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, මහනුවර දිස්ත්‍රික්කය ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, ගාල්ල දිස්ත්‍රික්කය ගාල්ල ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින්ද, කුරුණෑගල දිස්ත්‍රික්කය අඹන්පොළ ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින් සහ මාතර දිස්ත්‍රික්කය මාතර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය මගින් ද ආවරණය කෙරිණි. අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ති ක්‍රියාකාරකම් අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර ව්‍යාප්ත ඒකකය මගින් සිදුකෙරේ. වව්නියාව, මන්නාරම සහ ත්‍රිකුණාමලය ඇතුළත් අනෙකුත් දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්ති ක්‍රියාකාරකම් අනුරාධපුර ප.අ.තා.ආ.යෙහි ව්‍යාප්ති අංශය මගින් සිදු කර ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදයේදී ප.අ.තා.ආ.යේ ව්‍යාප්ති වැඩසටහන් යටතේ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන්හි ගොවි මහතුන්, සැකසුම්කරුවන්, වෙළෙන්දන්, ව්‍යාප්ති සේවකයින් 5239 ක් පුහුණු කර ඇත.

### *උපදේශන සහ උපදේශක සේවාවන්*

ඍජුව හා වක්‍රව පසු අස්වනු ක්‍රියාකාරකම්හි නියැලෙන රාජ්‍ය හා පෞද්ගලික අංශ ආයතන මෙන්ම සමුපකාර අංශය මගින් ප.අ.පි.තා.ආ.යෙහි උපදේශන සහ උපදේශක සේවාවන් වඩ වඩාත් බලාපොරොත්තු වේ. මෙම සේවාවන් සැපයීම මගින්, නව සැකසුම් යන්ත්‍රාගාර කිහිපයක් පිහිටුවීම, පවතින යන්ත්‍රාගාර නවීකරණය කිරීම සහ සහල් ඇඹරුම් කරුවන්ගේ සහ ආහාර සැකසුම්කරුවන්ගේ එදිනෙදා මෙහෙයුම් ගැටලු විසඳීම සඳහා උපදේශන 111ක් සැපයීමට ආයතනය සමත් වී ඇත.

***තත්ත්ව පරීක්ෂාව***

රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මගින් ඔවුන්ගේ භෞතික හා රසායනික තත්ත්ව පරීක්ෂාව සඳහා ලැබෙන නියැදි විශ්ලේෂණය තුළින් දිවයිනෙහි කෘෂි / ආහාර නිෂ්පාදනයන්හි තත්ත්ව පාලනය පවත්වා ගැනීම සඳහා ආයතනය වැදගත් කාර්ය භාරයක් ඉටු කර ඇත. සමාලෝචිත කාල පරිච්ඡේදයේදී නියැදි 30 විශ්ලේෂණයට ආයතනය සමත් වී ඇත.

***ප්‍රකාශන***

2011 වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ.හි ක්‍රියාකාරකම් සහ නව තාක්ෂණයන් ප්‍රසිද්ධ කිරිම සඳහා ව්‍යාප්ති පත්‍රිකා සහ අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම සිදු කර ඇත. මෙම තත්ත්වය තුළ ව්‍යාප්ති පත්‍රිකා සහ අත් පත්‍රිකා 25,333ක් පුහුණුවන්නන් අතර බෙදා දී ඇත.

***යටිතල පහසුකම් සංවර්ධනය***

එහි අරමුණ සහ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම්, එනම් පසු අස්වනු තාක්ෂණයෙහි පර්යේෂණ, පුහුණුව, ව්‍යාප්තිය, උපදේශන/ උපදේශක සහ වෙනත් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන අතරම සමාලෝචිත කාල පරිච්ඡේදයේදී පර්යේෂණය සහ සංවර්ධනය සඳහා යටිතල පහසුකම් 16ක් වැඩිදියුණු කර ඇත.

***සාරාංශය***

මෙම වාර්තාව 2011 වර්ෂය තුළ ප.අ.පි.තා.ආ. ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් වන අතර, පසු අස්වනු තාක්ෂණ විෂයය පිළිබඳව සැලකිල්ලක් දක්වන පුද්ගලයින්ගේ උනන්දුව ඇති කිරීම සඳහා එය බැඳී සිටී.

## 2. පර්යේෂණ ක්‍රියාකාරකම්හි විශේෂතා

ප.අ.පි.තා.ආ.හි ප්‍රධාන ක්‍රියාකාරකම වන පර්යේෂණ, පසු අස්වනු කර්මාන්තය මුහුණ දෙන තාක්ෂණික ගැටළු විසඳීම කරා මෙහෙයවා ඇත. 2011 වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ. මගින් මෙහෙයවන ලද පර්යේෂණ වැඩසටහන්හි විශේෂතා සමහරක් පහත දක්වා ඇත.

### 2.1 සම්පූර්ණ කර ඇති පර්යේෂණ ව්‍යාපෘති

### 2.1.1 ධාන්‍ය සහ මාශ බෝගයන්හි පසු අස්වනු තාක්ෂණය

### 2.1.1.අ.සහල් පදනම් කර ගත් ශීත කළ අතුරුපස නිර්මාණය කිරීම (සහල් අයිස්ක්‍රීම් / සහල් ක්‍රීම්)

අයිස් ක්‍රීම් යනු සාමාන්‍යයෙන් කිරි සහ යොදය යොදා සාදන ශිත කළ අතුරුපසකි. ශ්‍රී ලංකාවේ ඇති විකල්ප කිරි ආශ්‍රිත නොවන ශීතකළ අතුරුපස සෝයා අයිස් ක්‍රීම් වන අතර කිරිසීනි (ලැක්ටෝස්) ආහාරයට ගත නොහැකි සහ වෙනත් හේතූන් නිසා කිරි ආහාර භාවිතා නොකරන පුද්ගලයින් සඳහා වඩාත් ජනප්‍රිය විකල්ප ශීතකළ අතුරුපස ද මෙය වේ. ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය බත් වන බැවින් සහ ඉහළ පෝෂණ

ගුණයක් සහිත ප්‍රධාන ධාන්‍යමය ආහාරය ලෙස එකිනෙකට වෙනස් පෝෂණ ගුණාංග දෙකක් සහිත සහල් පදනම් කර ගත් ශීතකළ අතුරුපස වර්ග සකස් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

වෙනස් පෝෂක සහ සංවේදක ගුණාංගයන්ගෙන් යුත් ඉතා ඉහළ තත්ත්වයේ මෘදු අයිස් ක්‍රීම් නිෂ්පාදනය සඳහා ප්‍රධාන සංඝටකයක් ලෙස සහල් පිටි යොදාගත හැකි බව ප්‍රතිඵලවලින් අනාවරණය වී ඇත. මෙම නව නිෂ්පාදනය, සහල්වල සෞඛ්‍ය සම්පන්න ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා නව මාවතක් සපයනවා ඇත.

### 2.1.1.ආ. තැම්බූ සහල් සඳහා මධ්‍ය ප්‍රමාණයේ අප ජල පිරියම් යන්ත්‍රාගාරයක් සකස් කිරීම

සහල් සැකසුම් කර්මාන්තය දිවයිනෙහි විශාලතම කෘෂි -පදනම් කර්මාන්තය වන අතර එය වෙනත් ඕනෑම කර්මාන්තයකට වඩා වැඩි වටිනාකමක් සහිත නිෂ්පාදන සිදු කරයි. කැකුළු සහ තැම්බූ වශයෙන් ප්‍රධාන වශයෙන් සහල් වර්ග දෙකක් දේශීය ප්‍රජාව අතර ජනප්‍රියව ඇත. පෙර පිරියම් වී ඇඹරීමෙන් ලැබෙන සහල් තැම්බූ සහල් ලෙස හඳුන්වනු ලැබේ. තැම්බූ ධාන්‍ය නිෂ්පාදනය සඳහා වේලීමෙන් පසුව ඇඹරීමට ප්‍රථම ජල-තාප පිරියම් කිරීම තැම්බීම (parboiling) යනුවෙන් හැඳින්වේ. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන වීවලින් 70% කට ආසන්න ප්‍රමාණයක් තැම්බීම සිදු කරනු ලැබේ. වී පෙඟවූ ජලය සහ දහයියා තැම්බූ සහල් ඇඹරීමේදී පරිසරයට නිකුත් වන ප්‍රධාන අපද්‍රව්‍ය දෙවර්ගයකි. වී මෙට්‍රික් ටොන් එකකින් ආසන්න වශයෙන් වී පෙඟවූ ජලය ඝන මීටර් 1.3ක් සහ දහයියා ටොන් 0.2ක් පරිසරයට මුදා හැරෙන අතර කිසිදු පිරියම් කිරීමකින් තොරව වී පෙඟවූ ජලය පරිසරයට මුදා හැරේ. මේ හේතුවෙන් ඇඹරුම් හල් අවට දුර්ගන්ධයක් පැතිර පවතී. මීට අමතරව දහයියා සහ අළු වැසි ජලය මගින් ජල මාර්ග කරා රැගෙන යනු ලැබේ. දුර්ගන්ධය අවම කිරීම සඳහා තැම්බීමට භාවිතා කරන ජලය සෑම පැය 10-12කට වරක් මාරු කරන ලෙස මෝල් හිමියන් වෙත උපදෙස් දී ඇත. සෑම පැය 12කට වරක් වී පොඟවන ජලය මාරු කළද මුදා හරින ජලයෙහි COD සහ BOD5 මට්ටම් මධ්‍යම පරිසර අධිකාරිය මගින් නියමකර ඇති අගයන්ට වඩා ඉහළ අගයක පවතී. එබැවින්, මෙම කර්මාන්තයෙහි පැවැත්ම අප ජලය සඳහා පිළියම් යෙදීම මත රඳා පවතී. එබැවින්, මෙම පර්යේෂණයේදී උත්පාදන ස්ථානයට පිළියම් යෙදීම මගින් අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීමට පිරිසිදු නිෂ්පාදන මූලධර්ම යොදා ගැනිණි. ක්‍රියාවලියෙහි අතුරු නිෂ්පාදන, (අපද්‍රව්‍ය) ආරම්භයේදී දහයියා ඉන්ධනයක් ලෙස බොයිලේරුව ක්‍රියා කරවීමටත් පසුව දහයියා අළු අප ජල පෙරනයක් ලෙසටත් යොදා ගනිමින් පාරිසරික විද්‍යාත්මක කාර්මික සංකල්පය යොදා ගැනිණි. අමතර වශයෙන් දහයියා දහනයෙන් ලැබෙන හුමාලය ස්වායු ප්‍රතික්‍රියාවට පහසුකම් සපයන ජෛවභ්‍රමක භ්‍රමණය කරවීම සඳහා අඩ වශයෙන් යොදා ගනු ඇත. පිරියම් ක්‍රියාවලිය අදියර දෙකකින් යුක්ත වේ. පළමු අදියරේදී භ්‍රමණය වන ජෛව contractors (RBC) හි සහායෙන් ස්වායු ජීර්ණය මගින් BOD5 අගයන් පහත හෙළනු ලබන අතර දෙවන අදියරේදී COD මට්ටම පහත හෙළීම සඳහා පෙර පිරියම් අප ජලය කාබන් පෙරනයක් තුළින් යවනු ලැබේ. පිළිවෙළින්, 98 මි.ලී/ලී සහ 1676 මි.ලී/ලී සිට 24 මි.ලී/ලී සහ 241 මි.ලී/ලී දක්වා COD සහ BOD5 හි පිරියම් ක්‍රියාවලිය අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙන බව ප්‍රතිඵල මගින් පෙන්වා ඇත. එබැවින් පිරියම් කළ ජලය වී පෙඟවීම සඳහා නැවත යොදා ගත හැක.

### 2.1.1.ඇ. තැම්බූ සහල්වල තත්ත්වය මත වී පෙඟවීමට භාවිතා කළ ජලයෙහි තත්ත්වයෙහි බලපෑම

තැම්බූ සහල්වල වෙළඳපොළ වටිනාකම, සහල් ඇටයේ සුදු ගතිය සහ තද ගතිය වැනි තත්ත්ව පරාමිති මත රඳා පවතී. තැම්බූ සහල්වල තත්ත්වයට බොහෝ සාධක දායක වුවද, පෙඟවීමට ගන්නා ජලයෙහි තත්ත්වය, ක්‍රියා පිළිවෙළ සහ හුමාලය වැද්දීමේ ක්‍රියා පිළිවෙළ තැම්බූ සහල්වල තත්ත්වය මත බලපෑම් ඇති කරනු ලැබේ. තැම්බීමේ පිරියම් සමාන වුවද ස්ථානයෙන් ස්ථානයට තැම්බූ සහල්වල තත්ත්වය වෙනස් වන බව නිරීක්ෂණය කර ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රදේශ අනුව පෙඟවීම සඳහා යොදා ගන්නා ජලය වෙනස් වේ. ශ්‍රී ලංකාවේ බොහොමයක් සහල් ඇඹරුම්හල් වල වී තැම්බීමේදී වී පෙඟවීම සඳහා යොදා ගන්නා ජල ප්‍රභවය

භූගත ජලය වේ. වියළි කලාපයේ පවතින භූගත ජලයෙහි කැල්සියම් කාබනේට (CaCO3) ක්ලෝරීන් අයන, නයිට්‍රේට (NO3) සහ ෆ්ලෝවොරයිඩ් අයන ද්‍රාව්‍ය බව නිරීක්ෂණය කර ඇත. එබැවින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේදී තැම්බූ සහල්වල තත්ත්වය මත ජලයෙහි රසායනික තත්ත්වයෙහි බලපෑමක් තිබේද යන්න ඇගයීම සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. BG-358 සහල් ප්‍රභේදය යොදා ගනිමින් පරීක්ෂණය පවත්වන ලදී.

පරීක්ෂණ ප්‍රතිඵල අනුව වී පෙඟවීමට ගන්නා ජලයෙහි CaCO3 සාන්ද්‍රණය තැම්බූ සහල් ඇටවල සුදු ගතියෙහි (වර්ණය) වෙනස්වීම මත පමණක් සැලකිය යුතු ලෙස බලපාන බව පෙනී ගොස් ඇත. වී පෙඟවීමට ගන්නා ජලයෙහි CaCO3 සාන්ද්‍රණය, සහල් ඇටයෙහි තද ගතිය, කැඩුනු සහල් ඇට ප්‍රතිශතය සහ නොකැඩුනු ඇට ප්‍රතිශතය වැනි අනෙකුත් සහල් තත්ත්ව පරාමිති මත සැලකිය යුතු බලපෑමක් ඇති කර නොමැත. ඉහළ සාන්ද්‍රණයකින් CaCO3 ඇති විටදී සහල් ඇටයෙහි සුදු ගතිය (වර්ණය) සැලකිය යුතු ලෙස වැඩිදියුණුවීමත් (ඉහළ යෑමක්) පෙන්නුම් කෙරේ. වී පෙඟවීමට ගන්නා ජලයෙහි ක්ලෝරීන් සාන්ද්‍රණය තැම්බූ සහල්වල ඇටයෙහි තද ගතියෙහි වෙනස් වීම සඳහා පමණක් සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර එය ඇටයෙහි සුදු ගතිය, කැඩුන ධාන්‍ය ප්‍රතිශතය සහ ප්‍රධාන සහල් ඵලදාවෙහි ප්‍රතිශතය වැනි අනෙකුත් සහල් තත්ත්ව පරාමිති සැලකිය යුතු ලෙස වෙනස් කිරීම සඳහා බලපෑමක් ඇති කර නොතිබිණි. වී පෙඟවීමට ගන්නා ජලයෙහි ක්ලෝරීන් අයන සාන්ද්‍රණය, සහල් ඇටයෙහි තද ගතිය වැඩිදියුණු කිරීමේ රටාවක් පෙන්නුම් කර නොමැත. කෙසේ වෙතත් භූගත ජලයෙහි ඇති සියලු රසායනිකවල සහසම්බන්ධිත බලපෑම ඒවායෙහි තනි තනි බලපෑමට වඩා වෙනස් විය හැක.

වී පෙඟවීමට ගන්නා ජලයෙහි කඨිනත්වය සහල් ඇටයෙහි තද ගතිය වෙනස් කිරීම සඳහා බලපෑම් ඇති කළ හැකි බැවින් කඨිනත්වය ලීටරයට මි.ලී.400ට වඩා අඩු එනම් භූගත ජලය වෙනුවට මතු පිට ජලය යොදා ගන්නා ලෙස සහල් මෝල් හිමිකරුවන් හට උපදෙස් ලබා දී ඇත. එලෙසම වී පෙඟවීමට ගන්නා ජලයෙහි අධික ක්ලෝරීන් සාන්ද්‍රණය සහල් ඇටයෙහි තද ගතිය වෙනස් කිරීම සඳහා බලපෑම් ඇති කළ හැකි බැවින් ක්ලෝරීන් අයන නොමැති ජලය වී පෙඟවීම සඳහා භාවිතා කරන මෙන්ද වී මෝල් හිමිකරුවන් හට උපදෙස් ලබා දී ඇත.

### 2.1.1.ඉ. ශ්‍රී ලංකාවේ මෑතකදී හඳුන්වා දුන් සහ සාම්ප්‍රදායික වී ප්‍රභේද සමහරක භෞතික, ඇඹරුම්, පිසීමේ, පරිභෝජනය කිරීමේ සහ පෝෂණ තත්ත්වය ඇගයීම

සහල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස වෙනස් සම්ප්‍රදායික සහල් ප්‍රභේදයන්ගේ සාපේක්ෂ ගුණාගුණ මත සහල් අභිජනනය කරන්නන්, සහල් මෝල් හිමියන් සහ පාරිභෝගිකයින් ඇගයීම, සහල් සැකසුම් ක්‍රියාවලි උසස් බවට පත් කර ගැනීම සහ පාරිභෝගිකයන් හට තොරතුරු සැපයීම ආදී වූ ඉලක්ක සමඟින් අනුරාධපුර ජයන්ති මාවතෙහි පිහිටි පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනයේ රසායනාගාරයේදී ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් ප්‍රභේද තුනක (පොක්කලි, පච්චපෙරුමාල්, මුරුන්ගාකායන්) භෞතික ගුණ, ඇඹරීමේ, පෝෂණය, පිසීමේ සහ පරිභෝජනයට ගැනීමේ තත්ත්ව ඇගයීමට ලක් කෙරිණි. පරීක්ෂා කරන ලද ප්‍රභේදයන් අතර දිගෙහි සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය කෙරිණි. වැඩිම දිගින් යුතු මි.මී. 8.93 ප්‍රභේදය මුරුන්ගාකායන් වූ අතර පොක්කලි ප්‍රභේදය අඩුම දිගින් මි.මී.7.40 යුක්ත විය. පරීක්ෂාවට භාජනය කළ ප්‍රභේද අතර සත්‍ය සහ නිකර ඝනත්වය, සච්ඡිද්‍රතාව සහ දෘඩතාවය වැනි අනෙකුත් භෞතික ගුණාංගයන්හි සැලකිය යුතු වෙනස්වීමක් පෙන්නුම් කෙරිණි.

මුළු සහල් අස්වැන්න සහ නොකැඩුනු සහල් අස්වැන්න මත සැලකිය යුතු විවිධ බලපෑම් නිරීක්ෂණය විය. මුළු සහල් අස්වැන්න දහයියා ප්‍රමාණය සමඟ පූර්ණ ඍණාත්මක සහසම්බන්ධයක් පෙන්නුම් කළේය. (r= -0.9). නොකැඩුනු සහල් අස්වැන්න ඍණාත්මක සහසම්බන්ධයක් (r = -0.6) පෙන්නුම් කළ අතර මුළු සහල් අස්වැන්න ධනාත්මක සහසම්බන්ධයක් (r =+0.57) පෙන්නුම් කළේය. ධාන්‍ය දෘඪතාවය සහ නොකැඩුනු සහල් අස්වැන්න අතර සුළු ධනාත්මක සහසම්බන්ධයක් (r=0.14) නිරීක්ෂණය විය. (මෙයට සමානව ධාන්‍ය දෘඪතාවය සහ කැඩුනු ප්‍රතිශතය අතර සුළු ඍණාත්මක සහසම්බන්ධයක් පවතී (r=-0.24))

පොක්කායි සහ මුරුන්ගාකායන් ප්‍රභේදයන්ට සාපේක්ෂව වැඩි ප්‍රෝටීන ප්‍රතිශතයක් (6.03%) පච්චපෙරුමාල් ප්‍රභේදයෙහි අන්තර්ගත වූ අතර අවම ප්‍රෝටීන ප්‍රතිශතය වාර්තා වූයේ මුරුන්ගාකායන් ප්‍රභේදයෙනි. ප්‍රෝටීන ප්‍රමාණය, මේද ප්‍රමාණයට ප්‍රබල ඍණාත්මක සහසම්බන්ධයක් (r = -0.8) පෙන්නුම් කළේය. සහල් ප්‍රභේද තුන සඳහා ලබා ගත් මේද ප්‍රමාණය නිවුඩු සහල්වල 2.98 – 3.56% දක්වාත් පාහින ලද සහල්වල 1.24 – 2.27% දක්වාත් වූ පරාසයක පැවතිණ. පරීක්ෂා කරන ලද ප්‍රභේද අතර මේද ප්‍රතිශතය සැලකිය යුතු ලෙස (⍰ = 0.05) වෙනස් විය. (නිවුඩු සහ පාහින ලද සහල්වල)පිසින කාලය මිනිත්තු 15.33 සිට 19.06 දක්වා වෙනස් වූ අතර වැඩිම කාලය මුරුන්ගාකායන් ප්‍රභේදයෙන්ද අවම කාලය පොක්කලි ප්‍රභේදයෙන්ද වාර්තා විය. පිසින කාලය සහ ධාන්‍ය දෘඪතාවය (r = 0.93) අතර ප්‍රබල ධනාත්මක සහසම්බන්ධයක් නිරීක්ෂණය විය. අතරමැදි ජෙලටිනීකරණ උෂ්ණත්වයක් සහිත සහල් (70-74$^{O}$C) කාණ්ඩයට පොක්කලි ප්‍රභේදය අයත් වූ අතර අනෙකුත් ප්‍රභේද දෙක (මුරුන්ගාකායන් සහ පච්චපෙරුමාල්) ඉහළ ජෙලටිනීකරණ උෂ්නත්වයක් සහිත සහල් (75 79$^{O}$C ) කාණ්ඩයට අයත් විය. ඉහළ ජල අවශෝෂණයක් 3.92g/g පොක්කලි ප්‍රභේදය පෙන්නුම් කළ අතර පච්චපෙරුමාල් ප්‍රභේදය අවම අගයන් 2.71g/g පෙන්නුම් කළේය. ප්‍රභේද තුනෙහි ජලය අවශෝෂණය සැලකිය යුතු ලෙසින් වෙනස් විය ( ⍰ = 0.05). පරීක්ෂා කරන ලද ප්‍රභේද අතර දික්වීමේ අනුපාතයෙහි ( ⍰ = 0.05) සැලකිය යුතු වෙනස්වීමක් දක්නට ලැබිණි. 1.47ක වැඩිම දික්වීමේ අනුපාතයක් පොක්කලි ප්‍රභේදයෙන් වාර්තා වූ අතර 1.34ක අවම දක්වීමේ අනුපාතයක් මුරුන්ගාකායන් ප්‍රභේදයෙන් වාර්තා විය.

වත්මන් අධ්‍යයනයේදී පරිමා ප්‍රසාරණයට 0.024 සිට 0.028 m/g දක්වා වූ පරාසයක වූ අතර ඉහළම පරිමා ප්‍රසාරණය මුරුන්ගාකායන් ප්‍රභේදය පෙන්වූ අතර අවමය පච්චපෙරුමාල් ප්‍රභේදයෙහි දක්නට ලැබිණි. පරීක්ෂා කරන ලද සියලුම සාම්ප්‍රදායික ප්‍රභේද ඉහළ ඇමයිලෝස් ප්‍රමාණයක් (>25%) සහිත කාණ්ඩයට වර්ග විය. ඇමයිලෝස් ප්‍රමාණය, ජලය අවශෝෂණය කර ගැනීම සමඟ ධනාත්මක සහසම්බන්ධයක් තිබිණි. (r = 0.57). ප්‍රතිඵලවලට අනුව උපරිම ඉහළ දුස්ස්‍රාවීතාවයක් (3100B.u) මුරුන්ගාකායන් ප්‍රභේදයේද එහි අවමය (1730B.u) පච්චපෙරුමාල් ප්‍රභේදයේද තිබිණි.

ඉහළම පාරිභෝගික කැමැත්ත ඇත්තේ පොක්කලි ප්‍රභේදය සඳහා වන බවද පච්චපෙරුමාල් සහ මූරුන්ගාකායන් සඳහා එය සමාන වන බවද සමස්ථ පිළිගැනිම්වලින් පැහැදිලිව පෙන්නුම් කෙරිණි. මෙම සොයා ගැනීම්, හෝමාගම බීජ වගා කරන්නන්ගේ සංගමයට සහ මීගමුව “**පරබෝව**” වෙත ලබා දෙන ලදී.

### 2.1.1.ඊ. වී ගබඩා ආශ්‍රිත කෘමීන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින කෘමිනාශකවල සඵලතාවය සහ විෂ බව පරීක්ෂා කිරිම

වී වල පමණක් ගබඩා හානිය 4-6% දක්වා වන බව ඇස්තමේන්තු කර ඇති අතර එයින් 80% කටම හේතු වන්නේ කෘමි හානි බව ඇස්තමේන්තු කර ඇත. බොහොමයක් කෘමි පාලන මාර්ගයන් අතරින්, වඩාත් බහුල සහ ප්‍රධාන ගබඩා කෘමීන් වන *Rhyzopertha dominica* (කුඩා ධාන්‍ය ගුල්ලා) සහ *Sitophilus oryzae* (සහල් කුරුමිණියා) පාලනය සඳහා ස්පර්ශ කෘමිනාශක යොදා ගෙන තිබිණි.

ශ්‍රී ලංකාවේ වාණිජ මට්ටමින් පුළුල් පරාසයක කෘමිනාශක පැවතිය ද ඇක්ටලික් (Actellic) (ක්‍රියාකාරි ද්‍රව්‍ය, Pirimi – phosmethyl) පුළුල් වශයෙන් යොදා ගෙන ඇති අතර වානිජ මට්ටමේ ධාන්‍ය එක්රැස් කරන්නන් අතර මේ වන තෙක් ජනප්‍රිය වෙමින් තිබිණි.

කෙසේ වෙතත් වර්තමානයේදී මෙම ජනප්‍රිය කෘමිනාශකයෙහි අධික මිලත් සපයා ගැනීමට අසීරු වීමත් හේතුවෙන් ඵලදායි කෘමි නාශකයක් ලෙස එය යොදා ගැනීම ගැටළුකාරී වී ඇත. එබැවින් ඇක්ටලික් වෙනුවට භාවිතා කළ හැකි ලියාපදිංචි සහ වර්තමානයේ පවතින කෘමිනාශක නියැදි, රසායනාගාර තත්ත්ව යටතේ ධාන්‍ය ගුල්ලා *Sitophilus oryzae* L. (Coleoptera: Curculionidae) සහ වී කුරුමිණියා *Rhyzopertha dominica* F. (Coleoptera:Bostrichidae) ට එරෙහිව ඵලදායිත්වය සහ විෂභාවය සඳහා පරීක්ෂා කරන ලදී. විශේෂ දෙකෙහි, අලුතින් මතු වූ සතියක් වයසැති වැඩිහිටි කෘමීන් පෙරහන් කඩදාසියක් මත තබා එක් එක් කෘමිනාශකයෙන් නිර්දේශිත මාත්‍රාවක් ඉසින ලද අතර පැය 3කට, 18කට සහ 24කට පසු එක් එක් විශේෂයෙහි මරණ ප්‍රතිශතය වාර්තා කරන ලදී.

විෂභාවය සැලකීමේදී, සෝල්ෆැක් - Solfac (Cyfluthrin), ට්‍රේසර්- Tracer (Spinosad) සහ ඇක්ටරා - Actara (Thiamethoxan) අවරෝහණ අනුපිළිවෙළින් ඉහළ ප්‍රතිඵල පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, ක්ෂීරපායීන් සඳහා විෂබව (LD50) සැසඳීමේදී සොල්ෆැක් ඉහළ විෂ සහිත කාණ්ඩයට ඇතුළත් වන අතර අනෙකුත් සියළු කෘමිනාශක මධ්‍ය විෂ සහිත කාණ්ඩයට ඇතුළත් විය. වී පරිභෝජනය කරනු ලබන්නේ මිනිසුන් විසින් වන බැවින් සොල්ෆැක් (Cyfluthrin) කෘමිනාශකය වී ගබඩා සඳහා කෘමිනාශකයක් ලෙස නිර්දේශ කළ නොහැක. එම නිසා, හිතකර ලෙස ක්‍රියා කළ කෘමිනාශක අතරින් ගැළපෙන කෘමිනාශකයක් තේරීමේදී, ක්ෂීරපායින් සඳහා විෂභාවය (LD50) , අවශේෂ සඵලත්වය මෙන්ම පිරිවැය ඵලදායිත්වය සැලකිමේදී ට්‍රේසර් (Spinosad) සහ ඇක්ටාරා (Thiamethoxan) වී ගබඩා කෘමීන්ට එරෙහිව භාවිතා කලහැකි කෘමිනාශක ලෙස නිර්දේශ කළ හැක. සොයා ගැනීම් නිරන්තරයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශ ගබඩා කළමනාකරුවන් වෙත දන්වා යවා ඇත.

### 2.1.2. අල සහ බල්බ වල පසු අස්වනු තාක්ෂණය

### 2.1.2.අ. මඤ්ඤොක්කාවල ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම

අලුත් මඤ්ඤොක්කා අල සාමාන්‍ය පරිසර තත්ත්වයන් මත ඉතා ඉක්මනින් නරක් වන අතර දින තුනකින් හෝ ඊට අඩු කාලයකදී අළෙවි කළ නොහැකි තත්ත්වයට පත් වේ. 80-90% ක පමණ අධික ආර්ද්‍රතාවක් යටතේ සෙල්සියස් අංශක 35$^{O}$C ක උෂ්ණත්වයක ගබඩා කිරීමෙන් නැවුම් තත්ත්වයේ තබා ගත හැක. එබැවින් අලුත් මඤ්ඤොක්කා අලවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සහ පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම මත ගබඩා තත්ත්වයන්හි බලපෑම ඇගයීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයන සිදු කරන ලදී.

ඇතුළත Mc-foil ඇතිරූ තුනී ලෑලි (plywood) පෙට්ටියක (දිගxපළලxඋස: සෙ.මී.75x60x60) මනාව වියළන ලද ගිනිතණ (*Panicum maximum)* තට්ටුවකින් (මි.මී. 15ක ඝනකමින් යුත්) මඤ්ඤොක්කා අල ආවරණය කර මාරුවෙන් මාරුවට ඇසිරීම මගින් (උෂ්ණත්වය සෙල්සියස් 35$^{O}$C , සා.ආ. 96-98%), යාන්ත්‍රික හානියකින්, පස් සහ වෙනත් ආගන්තුක ද්‍රව්‍යයන්ගෙන් තොර සහ මතු පිට තෙතමනය නොමැති

අලුත් මඤ්ඤොක්කා අල දින 21ක කාලයක් සාර්ථකව ගබඩා කර තබා ගත හැකි බව අනාවරණය කර ඇති අතර සාමාන්‍ය පරිසර තත්ත්ව යටතේ (උෂ්ණත්වය සෙල්සියස් $32^{0}C$ සහ සා.ආ. 71-77%) එම අලුත් මඤ්ඤොක්කා තබා ගත හැක්කේ දින 5කට වඩා අඩු කාලයකි.

## 2.1.2.ආ. නිෂ්පාදන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ලොකු ලූණු වල පසු අස්වනු ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ ලොකු ලූණුවල ගබඩා ජීව කාලය ඉහළනැංවීම සඳහා IPHT ලොකු ලූණු ගබඩාව සහ පදම් කිරීමේ ඒකකය වැඩිදියුණු කිරීම

ලොකු ලූණු (*Allium Cepa*) ශ්‍රී ලංකාවේ වැවෙන ප්‍රධාන එළවළු බෝගයක් වන අතර වියළි කලාපයේ සහ අතරමැදි කලාපයේ ප්‍රධාන වැදගත්කමක් දරන මුදල් බෝගයකි. ලොකු ලූණු නිෂ්පාදන මට්ටම සහ මිල ගණන් දේශීය ගොවියාගේ ආදායම් ඉහළ නැංවීමේ අතිවිශාල විභවයක් පෙන්නුම් කෙරේ. ලොකු ලූණුවලින් ලැබෙන ලාභය අර්තාපල් සහ මිරිස් වැනි අනෙකුත් ප්‍රධාන බෝගවලින් ලැබෙන ලාභයට වඩා ඉහළ අගයක් ගනී. (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව) ශ්‍රී ලාංකික ගොවි මහතුන් බොහොමයක්, සුදුසු පසු අස්වනු ක්‍රියාකාරකම් අනුගමනය නොකරන බැවින් ඉහළ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක හානි සිදු වේ. තවද වර්තමානයේදී ලොකු ලූණු වගා කිරීම කන්න අනුව සිදු කරන අතරම සුදුසු ගබඩා කිරීමේ ක්‍රමවේද ශ්‍රී ලංකාව තුළ නොමැත. එබැවින් අස්වනු නෙලන කාලයේදී පශ්චාත් අස්වනු හානිය ඉහළ මට්ටමක පවතී. ලොකු ලූණු සඳහා සුදුසු ගබඩා කිරීමේ ව්‍යුහයක් නොමැති වීම හේතුවෙන් වගා කිරීමෙන් මාස 3කට පසුව වෙළඳ පළෙහි දේශීය ලොකු ලූණු විකිණීමට නොමැත. එබැවින් ලොකු ලූණුවල ගබඩා ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා වැඩිදියුණු කළ පසු අස්වනු ක්‍රියාකාරකම් සහ පදම් කිරීමේ සහ සුදුසු ගබඩා කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම සඳහා මෙම අධ්‍යයනයෙන් අවධානය යොමු කෙරිණි.

දේශීය ලොකු ලූණු ගොවියන් වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණ ක්‍රියාකාරකම් අනුගමනය නොකිරීමෙන් ලොකු ලූණුවල ගබඩා ජීව කාලය කෙටි වී ඇත. මාස 06කට වඩා කාලයක් ලොකු ලූණුවල රාක්ක ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සහ පැළවීම, කුණුවීම සහ වියළීම වැනි ගබඩා කාලය තුළදී ඇති වන ගැටළු මැඩ පැවැත්වීම සඳහා ප.අ.පි.තා.ආ. ගබඩාගත ලොකු ලූණු පදම් කිරීමේ ව්‍යුහයක් සකස් කර ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇත. කෙසේ වුවද, සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වය පාලනය කිරීම සඳහා දහයියා දහනය කිරීම වැනි මෙහෙයුම් ගැටළු හේතුවෙන් ගොවීන් විසින් මෙම ව්‍යුහය ප්‍රයෝජනයට ගැනීම අසමත් වී ඇත.

සමාගමෙහි හෝ ගොවි මහතාගේ අවශ්‍යතාව අනුව නව ගබඩා ව්‍යුහය මෙට්‍රික් ටොන් 1 සිට 10 දක්වා පරිමාණයට සකස් කර ගත හැක. මෙහි ලූණු ගබඩා කිරීමට අවශ්‍ය පරිදි සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වය පාලනය කිරීමේ පහසුකම ඇත. නිවැරදි දැනුමක් නොමැති හේතුවෙන් දේශීය ගොවීන් විසින් මේරීමේදී නිවැරදි අවධියේදී අස්වනු නෙළීම, මූලික තේරීම, මුදුන් කැපීම, පදම් කිරීම, කර මුද්‍රා තැබීම සහ නැවත තේරීම වැනි යෝග්‍ය පසු අස්වනු ක්‍රියාකාරකම් අනුගමනය නොකෙරේ. හඳුනාගත් නව පසු අස්වනු තාක්ෂණයන් සහ දැනුම ගොවීන් වෙත ලබා දෙනු ලැබේ.

## 2.1.2.ආ. කැරට් මෘදු කුණුවීම සහ අනුගමනය කළ හැකි පාලන පියවර

කැරට්, ආර්ථික වශයෙන් වැදගත් එළවළු බෝගයක් වන අතර ඒ සඳහා ලොව පුරා ඉහළ පාරිභෝගික ඉල්ලුමක් පවතී. කෙසේ වෙතත්, බැක්ටීරියා මගින් ඇති කරන කැරට් මෘදු කුණුවීම ශ්‍රී ලංකාවේ පවතින ඉතා බරපතළ පසු අස්වනු රෝගයකි. එමගින් ගබඩා කිරීමේදී සහ ප්‍රවාහනයේදී බරපතළ හානි ඇති කළ හැකි වේ. පසු අස්වනු රෝග වැළැක්වීමේ මූලික උපක්‍රමය වන්නේ කෘත්‍රිම කෘමිනාශක භාවිතා කිරීම වේ. කෙසේ

වුවද, කෘමිනාශක භාවිතා කිරීමේ අවාසිදායක තත්ත්ව සම්බන්ධයෙන් වැඩිපුර සැලකිලිමත්වීම හේතුවෙන් ගබඩා රෝගාබාධ පාලනය සඳහා ආරක්ෂාකාරි පරිසර හිතකාමී විකල්ප ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා උනන්දුවක් ජනනය වී ඇත. මිලෙන් අඩුවීම, පාරිභෝගිකයන් විසින් පහසුවෙන් පිළිගැනීම, විෂ රහිත බව, ක්‍රියාකාරි සාන්ද්‍රණවලදී පාරිසරික බලපෑම අවම වීම සහ ආහාර කර්මාන්තයේදී සුලභව යොදා ගැනීම වැනි හේතූන් නිසා "ආරක්ෂාකාරි බවට සාමාන්‍යයෙන් නිරේදේශිත" (GRAS) රසායනික ද්‍රව්‍ය පසු අස්වනු රෝගාබාධ පාලනය සඳහා භාවිතා කිරීමට වර්තමානයේදී ලොව පුරා විශාල දැනුවත්වීමක් ඇති වෙමින් පවතී.

මෙම අධ්‍යයනයේදී වෙනස් සාන්ද්‍රණයන්ගෙන් යුත් සෝඩියම් බයිකාබනේට් සහ ඇමෝනියම් බයිකාබනේට් වැනි GRAS සංයෝග බැක්ටීරියා වර්ධනය මත ඇති කරන බලපෑම ඇගයීම සිදු කෙරිණි. (ගිල්වා තැබීමේ ප්‍රතිකාරකයක් ලෙස) ඇමෝනියම් බයිකාබනේට්හි බලපෑම සෝඩියම් බයිකාබනේට්හි බලපෑමට වඩා ප්‍රමුඛ වේ. ප්‍රතිකාර නොකළ අල සමඟ සැසඳීමේදී මෘදු කුණුවීමේ රෝගය 25%ක් දක්වා අවම කිරීමට ඇමෝනියම් බයිකාබනේට් 2% (wt/v) බල සහිත වී ඇත. එහි කර්මාන්තමය යෝග්‍යතාව අනාවරණය කරමින් මෙම ප්‍රතිකර්මය යෙදීම හේතුවෙන් පාරිභෝගික පිළිගැනීම වෙනස් නොවිණි.

### 2.1.3 කුළු බඩු බෝගයන්හි පසු අස්වනු තාක්ෂණය

### 2.1.3.අ. වෙනස් වර්ගවල කුළුබඩු නිෂ්පාදන සඳහා වෙනස් වර්ගවල කුළුබඩු ඇඹරුම් යන්ත්‍රයන්හි ක්‍රියාකාරිත්වය ඇගයීම

වාශ්පශීලී තෙල්, වර්ණය, අංශු ප්‍රමාණ පැතිරීම සහ නිෂ්පාදන පිරිවැය ආදිය රළු ගම්මිරිස් කුඩු සහ සියුම් ගම්මිරිස් කුඩුවල තත්ත්වය තීරණය කිරීම සඳහා සලකනු ලබන්නේ මෙම ගුණාංග පාරිභෝගික පිළිගැනීම හුවා දක්වන අතරම ඒ හේතුවෙන් වෙළඳ පළ මිලද තීරණය වන බැවිනි.

ගම්මිරිස් සැකසුම් යන්ත්‍ර දෙවර්ගය අතරින් පින් මිල් යන්ත්‍රය (pin mill), තනි යන්ත්‍රයක් ලෙස, කුඩු කරන ලද නිෂ්පාදනයෙහි අංශු ප්‍රමාණය අතින් ගත් විට ඉතා හොඳින් ක්‍රියා කර ඇත. කෙසේ වුවද ප්ලේට් මිල් යන්ත්‍රය (plate mill) සමඟ ඒකාබද්ධ කළ විට නිෂ්පාදන පිරිවැය සුළු ප්‍රමාණයකින් අඩු වේ. කුඩු කරන ලද තුනපහ, වට්ටෝරුවට අනුව වෙනස් ද්‍රව්‍යයන්ගෙන් යුක්ත වේ. පරීක්ෂා කරන ලද වට්ටෝරුවකට අනුව ඇඹරීම ඇගයීමට ලක් කෙරිණි. පරීක්ෂා කරන ලද වට්ටෝරුවෙහි ප්‍රතිශතයට අනුව තුනපහ කුඩුවල ඇඹරීම ඇගයීම සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය, කොත්තමල්ලි, දුරු සහ සූදුරු දෙවර්ගයෙන්ම, බදින ලද සහ නොබදින ලද භාවිතා කරන ලදී.

ප්ලේට් මිල් යන්ත්‍රය සහ පින් මිල් යන්ත්‍රය සංකලනයෙන් තුනපහ කුඩු ඇඹරීමේ ක්‍රමය සාර්ථක විය. පළමු අවස්ථාව සඳහා තහඩු මෝල්ද, මයික්‍රෝන 1000ක ප්ලේට් මිල් යන්ත්‍රය දෙවන සහ තුන්වන අවස්ථා සඳහාද යොදා ගැනීම තුනපහ කුඩු සැකසීමේ හොඳම සංකලනය විය.

### 2.1.3.ආ. වියළි කලු ගම්මිරිස්වල ගල් ඉවත් කිරීමේ යන්ත්‍රයක් සකස් කිරීම සහ ඇගයීම

ශ්‍රී ලංකාවේ ගම්මිරිස් අපනයන කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ අනවශ්‍ය ද්‍රව්‍ය විශේෂයෙන් ගල් සහ වැලි ඉහළ ප්‍රතිශතයකින් මිශ්‍ර වී තිබීමයි. ගල් වැනි බරින් වැඩි ආගන්තුක ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඩීස්ටෝනරය භාවිතා කරනු ලැබේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සහල් ඇඹරුම් කර්මාන්තයේ සහල්වල ගල් ඉවත් කිරීම සඳහා භාවිතා කරන ඩීස්ටෝනරය, වියළි ගම්මිරිස්වල ගල් ඉවත් කිරීම සඳහා භාවිතා කිරීමේ

යෝග්‍යතාව ඇගයීම සඳහා අධ්‍යයනයක් පවත්වන ලදී. තට්ටුවේ ආනතිය අංශක 13හි තබන ලද අතර සුළං ප්‍රවාහ වේගය උපරිම මට්ටමෙහි තබන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද 355.50 kg/h සාමාන්‍ය පරිමාවකින් යුත් ඩීස්ටෝනරයෙහි ඉවත් කරන ලද ගල් ප්‍රතිශතයෙහි සාමාන්‍යය 99.96ක් වුවද, යන්ත්‍රය මගින් හානියට ලක් වූ ගම්මිරිස් ඇට ප්‍රමාණයෙහි සාමාන්‍ය ප්‍රතිශතය 0.5% ක් බවද, වියළි ගම්මිරිස් කි.ග්‍රෑ.1ක් සඳහා බලශක්ති පරිභෝජනය $3.94 \times 10^{-3}$ kwh/kg බවද, නිෂ්පාදන පිරිවැය රු. 0.64ක් බවද ප්‍රතිඵල මගින් පෙනී ගොස් ඇත. එබැවින් මෙම වෙනස් කරන ලද ඩීස්ටෝනරය ගම්මිරිස් වල ගල් සහ වැලි ඉවත් කිරීම සඳහා භාවිතා කල හැක. සහල් ඇඹරුම් යන්ත්‍ර පිරිසැකසුම්කරුවන් මගින් වෙනස්කම් සිදු කල හැකි වේ. පසු අස්වනු තාක්ෂණ ආයතනයෙහි ව්‍යාප්ති යාන්ත්‍රණය මගින් සහ උපදේශන සහ පුහුණුව මගින් තාක්ෂණ ව්‍යාප්ත කරනු ලැබේ. එයට අමතරව කුළුබඩු බෝග පශ්චාත් අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රයෙහි කටයුතු කරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන හරහාද ගොවීන්ට තාක්ෂණය ව්‍යාප්ත කර ඇත.

## 2.1.4. පළතුරු සහ එළවළුවල පසු අස්වනු තාක්ෂණය

### 2.1.4.අ. කෙසෙල් සඳහා ප්‍රවාහන ඇසුරුමක් සකස් කිරීම

කෙසෙල් ශ්‍රී ලංකාවේ වඩාත් ජනප්‍රිය සහ වගා කරන පළතුර වේ. නමුත් අවිධිමත් පසු අස්වනු පරිහරණ ක්‍රියාකාරකම් හේතුවෙන් 30% ක පමණ පසු අස්වනු හානියක් සිදු වන බව වාර්තා වී ඇත. කෙසෙල් තොග වශයෙන් ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු ඇසුරුම් ක්‍රමවේදයක් නොමැති වීම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එබැවින්, ශ්‍රී ලංකාවේ තත්ත්වයන්ට ගැළපෙන තොග ප්‍රවාහන ඇසුරුම් ක්‍රමවේදයක් සැලසුම් සංවර්ධනය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කර ඇත.

කෙසෙල් සැපයුම් දාමයෙහි වර්තමාන තත්ත්වය ඇගයීම සඳහා සහ යෝග්‍ය ඇසුරුම් ක්‍රමවේදයක් හඳුනා ගැනීම සඳහා ගොවි මහතුන්, ප්‍රවාහනය කරන්නන් සහ සිල්ලර වෙළඳුන් සමඟ ප්‍රශ්නාවලි සමීක්ෂණයක් පවත්වන ලදී. ඇඹුල්, සීනි සහ කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේද වල භෞතික ගති ලක්ෂණ ඇසුරුම සැලසුම් කිරීමට අදාළ වේ. මාර්ග ප්‍රවාහන තත්ත්වයන්ට සමාන මි.මී. 6ක විස්තාරයක් සහ හර්ට්ස් 5ක සංඛ්‍යාතයකින් සහිත කම්පන තට්ටුවක් යොදා ගනිමින් ඇසුරුම් ක්‍රමවේද දෙකක් පරීක්ෂාවට ලක් කරන ලදී. මි.මී. 2, මි.මී. 3 සහ මි.මී. 5 ඝනකමින් යුත් ස්ටයිරොෆෝම් ඇතිරිල්ලක් යොදා ගනිමින් කෙසෙල් ඇවරි එතීම එක් ක්‍රමවේදයක් වූ අතර අනෙක් ක්‍රමවේදය වූයේ මි.මී.3, මි.මී.5, මි.මී.8 සහ මි.මී. 10 ආදි වූ එකිනෙකට වෙනස් ඝනකම් හතරකින් යුතු ස්ටයිරොෆෝම් ඇතිරිලි ස්ථර ලෙස ඇතිරීමයි.

ප්‍රවාහනය සහ විකිණීම පහසු වීම හේතුවෙන් කෙසෙල් කැන් වශයෙන් ප්‍රවාහනය කිරීමට ජනතාව වැඩි කැමැත්තක් දක්වන අතර අතිරික්ත පරිහරණය හේතුවෙන් ගොවියන් විසින්ද, ඉදීම පාලනය කිරීමට නොහැකි වීමේ හේතුවෙන් ප්‍රවාහනය කරන්නන් සහ සිල්ලර වෙළෙඳුන් විසින් ද ප්ලාස්ටික් කූඩ තුළ ප්‍රවාහනය ප්‍රතික්ෂේප කර ඇත.

මුළු කැනම මි.මී. 5ක ඝනකමින් යුත් ස්ටයිරොෆෝම් ඇතිරිල්ලකින් වැසීම මගින් පරීක්ෂණය තුළදී අවම යාන්ත්‍රික හානිය වාර්තා වුවද පවතින ක්‍රමවේදය හා සැසඳීමේදී ධාරිතාව මත සැලකිය යුතු බලපෑමක් ඇති නොවිණි. ඇසුරුම් පිරිවැය සහ පරිහරණය කිරීමේ කාර්යක්ෂමතාව සැලකූ විටදී, මි.මී.8 ස්ටයිරොෆෝම් ස්ථර වශයෙන් යොදා ගැනීම කෙසෙල් තොග ප්‍රවාහනය සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදයයි.

### 2.1.4.ආ.ලීක්ස් (*Allium porum*) ප්‍රවාහනය සඳහා තොග ඇසුරුම්වල යෝග්‍යතාව

ලීක්ස්, ශ්‍රී ලංකාවේ වැවෙන එළවළු අතර ප්‍රමුඛ තත්ත්වයක් දරන ආර්ථික වශයෙන් වැදගත් එළවළුවකි. බෝගයෙහි දිගෙහි ඇති වෙනස්කම් හේතුවෙන් වර්තමානයේ පවතින ඇසුරුම් යෝග්‍ය නොවන අතර වාර්තාගත වාර්ෂික පසු අස්වනු හානිය 15.7% කි. පසු අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය ලීක්ස් ප්‍රවාහනය සඳහා දැවමය තොග ඇසුරුම් නිර්මාණය කර ඇති අතර මෙම අධ්‍යයනය මගින් ලීක්ස් ප්‍රවාහනය සඳහා එම ඇසුරුම්වල යෝග්‍යතාව ඇගයීමට ලක් කෙරිණි. පරීක්ෂා කරන ලද ඇසුරුම් මාදිලි අතරින් සෙ.මී.100xසෙ.මී.45x සෙ.මී.35 මාදිලිය, මැලවීමේ ප්‍රතිශතය, භෞතික හානිය සහ බර අඩු වීම අවම කරමින් වඩා හොඳ කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. එබැවින් ඇසුරුම සඳහා යෝග්‍ය උස සහ පළල භාවිතා කිරීම හේතුවෙන් පත්‍ර කොටසෙහි විශාල ප්‍රමාණයක් ඉවත් නොකර සහ ප්‍රවාහනයේදී අවම හානියකින් යුක්තව ලීක්ස් ප්‍රවාහනය කළ හැකි වඩාත් යෝග්‍ය විකල්පය, පරීක්ෂාවට ලක් කරන ලද ඇසුරුම වනු ඇත.

### 2.1.4.ඇ. පැණිරි කුලයේ පළතුරුවල ගබඩා තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පරිභෝජනයට සුදුසු ඉටි මිශ්‍රණයක් සකස් කිරීම

දොඩම් කල් තබා ගැනීමේ සහ එහි ගබඩා ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා වෙනස් සාන්ද්‍රණයන්ගෙන් යුත් මී ඉටි, මඤ්ඤොක්කා පිටි, ඉරිඟු තෙල්, පොල් තෙල් සහ සෝඩියම් බයිකාබනේට් ආලේපවල සංසන්දනාත්මක බලපෑම අගයන ලදී. දින 10ක ගබඩා කිරීමක් සඳහා පළතුරුවල භෞතරසායනික සහ භෞතවේද ලක්ෂණ ඇගයීමට ලක් කළ අතර මී ඉටි, 0.5%, මඤ්ඤොක්කා පිටි 2%, ඉරිඟු තෙල් 1% සහ සෝඩියම් බයිකාබනේට් 1%, (T1), යෙදූ පළතුරු පරීක්ෂාවට ලක් කළ අනෙකුත් ආවරණ විසඳුම්වලට වඩා ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලදී. ඔවුන්ගේ නිෂ්පාදනයෙහි, තත්ත්වය ආරක්ෂා වන අතරම වෙළඳපළ ජීව කාලය දීර්ඝ වීම නිෂ්පාදකයින් සඳහා මෙන්ම වෙළඳුන් සඳහා ද ප්‍රයෝජනවත් වනු ඇත. දේශීය ප්‍රභේදයන්හි රාක්ක ජීව කාලය වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිකාරකය සුදුසු විසඳුමක් වනු ඇත.

### 2.1.4.ඇ. පාවිච්චියට ගත නොහැකි කෙසෙල් යොදා ගනිමින් පළතුරු විනාකිරි සෑදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම (ඇඹුල් ප්‍රභේදය)

ශ්‍රී ලංකාවේ ආසන්න වශයෙන් ටොන් 390,000ක පළතුරු සහ එළවළු හානියක් සිදු වන බව ඇස්තමේන්තු ගත කර ඇත. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේදී දිනකට පළතුරු සහ එළවළු මෙට්‍රික් ටොන් 1ක් කසල වශයෙන් බැහැර කරනු ලැබේ. එබැවින්, පළතුරු විනාකිරි නිෂ්පාදනය සංවර්ධනය කිරීම මගින් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයෙන් සහ අනුරාධපුර වෙළඳපළින් ඉවතලන පළතුරු අපද්‍රව්‍ය පාවිච්චියට ගැනීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් මෙම පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදී.

පොතු ඉවත් කරන ලද කෙසෙල් (ඇඹුල් ප්‍රභේදය), 10-11% එතනෝල් සාන්ද්‍රණයක් නිපද වීම සඳහා ඵලදායී ලෙස යොදා ගත හැකි වූ අතර පළමු පැසවීමෙන් දින 07කට පසු 20% ක මාතෘ රෝපිතයක් එක් කිරීම විනාකිරි නිෂ්පාදන ක්‍රියාවලිය ඉක්මන් කිරීමට ඉවහල් විය. පළතුරු විනාකිරි සාර්ථකව නිපදවීම සඳහා කෙසෙල් අපද්‍රව්‍ය යොදා ගත හැකි බවත් එමගින් වාණිජ පොල් විනාකිරි ආදේශනය කළ හැකි බවත් පර්යේෂණ ප්‍රතිඵල මගින් අනාවරණය වී ඇත. කෙසෙල් අධික කාලයේදී ඇති වන අලෙවිකරණ ගැටළුවලින් පීඩා විඳින ගොවීන් සඳහා මෙම පර්යේෂණ සොයා ගැනීම් ප්‍රයෝජනවත් වනු ඇත. එම නිසා අධික ලෙස ඉදුනු කෙසෙල් හොඳ තත්ත්වයේ ගති ලක්ෂණ (වර්ණය, රස, සුවඳ.. ආදී ) සහිත විනාකිරි නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැක. එබැවින්, මෙම තාක්ෂණය අධික ලෙස ඉදුනු කෙසෙල්වල වටිනාකම

ඉහළ නැංවීම සඳහා විශාල වශයෙන් ප්‍රයෝජනවත් වනු ඇත. ප.අ.පි.තා.ආ. පුහුණු සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් තුළින් මෙම තාක්ෂණය ප්‍රචලිත කෙරෙනු ඇත.

### 2.1.4.ඉ. ඩ්‍රැගන් ෆෘට් යොදා ගනිමින් ready to serve පානයක් සකස් කිරීම

ඩ්‍රැගන් ෆෘට් (*Hylocereus undathus)* පතොක් විශේෂයට අයත් ආරෝහක වැලකි. ශ්‍රී ලංකාවෙහි කැපී පෙනෙන වටිනාකම් එක්කළ ඩ්‍රැගන් ෆෘට් නිෂ්පාදන දක්නට නොලැබේ. පිළිගැන්වීමට සූදානම් ready to use (RTS) පානය මූලික පළතුරු බීම වර්ග අතරින් එකක් වන අතර සරල අඩු ආදායම් තාක්ෂණයක් මගින් නිෂ්පාදනය කළ හැක. මෙම අධ්‍යයනය මගින් ඩ්‍රැගන් ෆෘට් යොදා ගනිමින් RTS පානයක් සංවර්ධනය කිරීම සඳහා උත්සාහ දරනු ලැබිය. සුදුසු වට්ටෝරුවක් සංවර්ධනය කිරීම පිණිස RTS සඳහා ශ්‍රී ලංකා ප්‍රමිත (SLS:1985) පදනම් කර ගනිමින් මූලික පරීක්ෂණ සිදු කරන ලදී. පල්ප ප්‍රතිශතය 8%, 10%, 12% සහ 14% සමඟ සීනි 11% සහ සෝඩියම් මෙටාබයිසල්ෆේට් 0.01%කින් යුත් වට්ටෝරු 4ක් සකස් කරන ලදී. RTS පානය සංවර්ධනය කිරීම සඳහා හොඳම පල්ප සාන්ද්‍රණය නිශ්චය කර ගැනීම සඳහා නුපුහුණු මණ්ඩල සාමාජිකයින් 25 දෙනෙකු යොදා ගනිමින් සංවේදක ඇගයීමක් සිදු කරන ලදී. පසුව මට්ටම් හතරක සිට්‍රික් අම්ලය (0.6%, 0.7%, 0.8% සහ 0.9%) සහ කාබොක්සි මීතයිල් සෙලියුලොස් (CMC) එක් කිරීමෙන් වට්ටෝරුව තවදුරටත් වැඩිදියුණු කළ අතර RTS පානය සකස් කිරීම සඳහා එක් කළ යුතු හොඳම සිට්‍රික් අම්ල මට්ටම නිශ්චය කර ගැනීම සඳහා සංවේදක ඇගයීමක් සිදු කරන ලදී. තෝරා ගත් නිෂ්පාදනය සීල් තැබූ විදුරු බෝතල්වල අසුරා සාමාන්‍ය (27$^{O}$C, සා.ආ. 70%) සහ ශීතකරණ (5$^{O}$C, සහ සා.ආ.75%) ගබඩා තත්ත්වය යටතේ මාස තුනක කාලසීමවක් ගබඩා කර තැබූ අතර TSS, PH අගය, ආම්ලිකතාව, වර්ණය සහ ක්ෂුද්‍ර ජීවී සංඛ්‍යාව සති දෙකෙන් දෙකට නිර්ණය කරන ලදී. RTS ඩ්‍රැගන් ෆෘට් පානය සැකසීම සඳහා සුදුසුම වට්ටෝරුව ලෙස පළතුරු පල්ප 12% ක් සහ සිට්‍රික් ඇසිඩ් 0.08% ක් සහිත වට්ටෝරුව තෝරා ගැනිණි. මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකා ප්‍රමිතීන් (SLS729:1984) සමඟ අනුකූල වන බව ගබඩා දත්ත මගින් අනාවරණය වී ඇත. කෙසේ වුවද සාමාන්‍ය තත්ත්ව යටතේ ගබඩා කර තැබූ නියැදිවල ආම්ලිකතාවයෙහි සුළු ඉහළ යෑමක් සහ PH අගයෙහි පහළ යෑමක් නිරීක්ෂණය විය. මෙසේ RTS පානයක් නිෂ්පාදනය කිරීම සඳහා ඩ්‍රැගන් ෆෘට් යොදා ගත හැකි බවත් ඒවා සාමාන්‍ය සහ ශීතකරණ තත්ත්ව යටතේ මාස තුනක කාලයක් තත්ත්ව පිරිහීමකින් තොරව තබා ගත හැකි බවත් අවසන් වශයෙන් නිගමනය කළ හැක.

"ලංකා ජූස්" නමින් මොරටුව ප්‍රදේශයේ ආරම්භ කර ඇති කර්මාන්තශාලාවෙහි වෙළඳ පළ වටිනාකමක් නොමැති බැහැර කරන ලද පළතුරු (කුඩා ප්‍රමාණයේ) RTS පාන සකස් කිරීම සඳහා යොදා ගැනේ.

### 2.1.4.ඊ. නැවුම් නිපැයුමක් ලෙස දෙහිවල ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

විශේෂයෙන් වියළි කාලගුණ තත්ත්ව යටතේ ශ්‍රී ලංකාවේ බොහොමයක් වෙළඳ පළෙහි ඇති දෙහිවල තත්ත්වය පහළ මට්ටමක පවතින බව ආයතනය නිරීක්ෂණය කර ඇත. මාධ්‍යයක් තුළ ගබඩා කිරීම මගින් හැකිළීම සහ ඉක්මනින් ඉදීම වැනි පසු අස්වනු හානි වළක්වා ගැනීමට සිල්ලර වෙළඳුන් සමත් වනු ඇත.

2%ක සෝඩියම් බයිකාබනේට් ද්‍රාවණයක ගිල්වා ගත් දෙහි ඉන් අනතුරුව වැලි, දහයියා හෝ කොහුබත් මාධ්‍යයක් යට ගබඩා කළ හැක. කිසිදු තත්ත්ව හානියකින් තොරව පළතුරුවල හැකිළීම වළක්වා ගනිමින් ඒවායේ ජීව කාලය අවම වශයෙන් සති 2-4 දක්වා දීර්ඝ කර ගැනීමට ඉහත මාධ්‍යය සහාය දක්වනු ඇත.වැලි මාධ්‍යයෙහි සති 2ක්ද දහයියා සහ කොහුබත් මාධ්‍යයෙහි සති 3-4 කාලයක්ද පළතුරු ගබඩා කර තබා ගත හැක.

ඉහත පර්යේෂණ ප්‍රතිඵල යොදා ගැනීම තුළින් සිල්ලර වෙළෙඳුන්ට හොඳ තත්ත්වයේ නිෂ්පාදන අළෙවි කළ හැකි වන අතර පාරිභෝගිකයින්ට වෙළඳපළෙන් හොඳ තත්ත්වයේ නැවුම් දෙහි ලබා ගත හැක.

## 2.2. 2011 වර්ෂයේදී ප්‍රකාශයට පත් කර ඇති පර්යේෂණ ව්‍යාපෘති

2010/11 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පහත දක්වා ඇති පර්යේෂණ ව්‍යාපෘති පහත සඳහන් විවිධ විද්‍යාත්මක ජර්නල් මූලාශ්‍රයන්හි ප්‍රකාශයට පත් කර ඇත.

**අ) ජාත්‍යන්තර ජර්නල**

**කේ.පී.එල්.ආර්. ජයතුංග, එච්.යූ.කේ.ඩී. ප්‍රසාද්, එම්.ඩී. ප්‍රනාන්දු සහ කේ.බී.පලිපාන**

වෙනස් කරනලද වායු අසුරණයක් යොදා ගනිමින් නැවුම් ගස් ලබුවල පසු අස්වනු ජීව කාලය දීර්ඝ කර ගැනීම (2011). කෘෂිතාක්ෂණ ජර්නලය වෙළුම 7(2):507-518

**ආ) දේශීය ජර්නල**

**කේ.පී.එල්.ආර්. ජයතුංග,බී.එම්.කේ.එස්.තිලකරත්න සහ එම්.ඩී. ප්‍රනාන්දු**

ක්ෂණික "ඇඹුල් තියල්" කුළුබඩු මිශ්‍රණයක් සකස් කිරීම සහ නිෂ්පාදනයෙහි පිළිගැනීම අධ්‍යයනය කිරීම. (2011). රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ කාර්ය සටහන් පිටුව - 54.

**සෙනෙවිරත්න ජී.ඩී., විජේවර්ධන ආර්.එම්.එන්.ඒ. සහ ජයවර්ධන එන්.ඩබ්ලිව්.අයි.ඒ (2011)**

ලීක්ස් (*Alluim Porum*) ප්‍රවාහනය සඳහා තොග ඇසුරුම්වල යෝග්‍යතාව. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සම්මන්ත්‍රණයේ (2011) කාර්ය සටහන්.

**රත්නායක එච්.එම්.ඒ.පී., කුලතුංග ඒ.කේ., දිසානායක ටී.එම්.ආර්. (2011)**

පිරිසිදු නිෂ්පාදනය සහ කාර්මික පරිසර විද්‍යාත්මක සිද්ධාන්ත මගින් දේශීය සහල් ඇඹරුම්හල්වල සුනිත්‍යභාවය ඉහළ නැංවීම - "සුනිත්‍ය ඉදි කළ පරිසර" අන්තර් ජාතික සම්මන්ත්‍රණයේ කාර්ය සටහන් වෙළුම 2: පිටුව 310-311

**බණ්ඩාර ඩී.එම්.එස්.පී., රත්නායක ආර්.එම්.ආර්.එන්.කේ., දිසානායක ටී.එම්.ආර්.**

මිරිස් කුඩු නිෂ්පාදනය සඳහා විවිධ වර්ගයේ කුළුබඩු ඇඹරුම් යන්ත්‍රවල කාර්යසාධනය ඇගයීම, 2011වාර්තාව, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය.

**රත්නායක ආර්.එම්.ආර්.එන්.කේ., තිලකරත්න බී.එම්.කේ.එස්., ප්‍රනාන්දු එම්.ඩී. (2011)**

ඇඹුල් කෙසෙල් මත GRAS වල බලපෑම කෘෂි විද්‍යාව පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලය (ප්‍රසිද්ධ කිරීමට අනුමැතිය ලබා දී ඇත)

**ගුණතිලක ඩී.එම්.ඩී.ඩී., වාසල ඩබ්ලිව්.එම්.ඩී.බී.,තිලකරත්න බී.එම්.කේ.එස්., විජේරත්න ඩී.බී.ටී. (2011)**

පළතුරු සහ එළවළු අළෙවි කිරීම සඳහා වැඩිදියුණු කරන ලද ජංගම සිල්ලර වෙළඳසලක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම. රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ 3වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය.

## 2.3 දැනට ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති

### 2011 වර්ෂය සඳහා පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම

2011 වර්ෂය සඳහා පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා 2010.11.02 වැනි දින පර්යේෂණ නිලධාරීන් සහ කාර්මික ඉංජිනේරුවරුන් සහභාගි වූ රැස්වීමක් පවත්වන ලදී. අදහස් ලබා ගැනීම සඳහා, උනන්දුවක් දක්වන්නන්ගේ රැස්වීමක් ද පැවැත්විය යුතු බව යෝජනාවිය. ඒ අනුව ගොවීන්, රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරීන් සහ පසු අස්වනු තාක්ෂණය සමඟ කටයුතු කරන රාජ්‍ය අංශ සංවිධානවල විද්‍යාඥයින් සමඟින් 2010.12.06 වැනි දින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. සම්මන්ත්‍රණයේදී පර්යේෂණ ව්‍යාපෘති 15ක් යෝජනා විය.

යෝජනා පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සියළු ප.අ.පි.තා.ආ පර්යේෂණ නිලධාරීන් සහ කාර්මික ඉංජිනේරුවරුන්ගේ සහභාගිත්වයෙන් 2011.01.06 වැනි දින රැස්වීමක් පවත්වන ලදී. විද්‍යාඥ මණ්ඩලයක් ඉදිරියේ 2011.02.07 වැනි දින නව පර්යේෂණ යෝජනා ඉදිරිපත් කළ යුතු බව එහිදී යෝජනා විය. කෙසේවුවද, 2011 පෙබරවාරි 04, 05 සහ 06 දිනවල පැවති හදිසි ගංවතුර තත්ත්වය හේතුවෙන් රැස්වීම දින නියමයක් නොමැතිව කල් දැමිණි.

2011.03.11 දින ඉදිරිපත් කිරීම් නැවත සංවිධානය කරන ලද අතර මාස 3කට වරක් පර්යේෂණ ප්‍රගතිය වාර්තා කළ යුතු බව විද්‍යාඥ මණ්ඩලයේ අදහස විය. රැස්වීමේදී පර්යේෂණ යෝජනා 14ක් ඉදිරිපත් කරන ලද අතර පර්යේෂණ යෝජනා නැවත සංවිධානය කිරීම සඳහා වන වෙනස්කම් පිළිබඳ යෝජනා ලබා ගන්නා ලදී. ජාතික අවශ්‍යතාවය සඳහා සහ 2011.04.11 වැනි දින පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස, තෝරා ගත් පර්යේෂණ ව්‍යාපෘති කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ, පසු අස්වනු තාක්ෂණය පිළිබඳ ජාතික කමිටුව ඉදිරියේ නැවතත් ඉදිරිපත් කරන ලදී. ජාතික කමිටුව විසින් ව්‍යාපෘති 14න් ව්‍යාපෘති 12ක් ඇගයීමට ලක් කර 2011.05.17 වැනි දින අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පහත ව්‍යාපෘති 2011.06.01 දින ආරම්භ කර ඇත.

ජාතික කමිටුවෙහි සාමාජිකයින් වූයේ,

1. ආචාර්ය ශාන්ති විල්සන් මිය
2. ආචාර්ය එස්. තිලකරත්න මිය
3. ආචාර්ය කේ.එච්. සාරනන්ද මයා
4. ආචාර්ය නිමල් ධර්මසේන මයා
5. ආචාර්ය ඩී.බී.ටී. විජේරත්න මයා
6. ඩී.ඒ. පෙරේරා මයා
7. අයි.වී.ඩී.සී.එස්. ඉදිරුව මයා

8. ආචාර්ය රංජිත් එදිරිසිංහ මයා

9. මොහාන් රත්වත්තේ මයා

10. ආචාර්ය ජේ.ඩී. සමරසිංහ මයා

11. පී. විමල් කුමාර මයා

12. මහින්ද සකලසූරිය මයා

**2011 වර්ෂය සඳහා අනුමත ව්‍යාපෘති**

a) සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඇගයීම

b) සහල් පිටි කර්මාන්තය සඳහා බලශක්ති කාර්යක්ෂමතා "අංශු වෙන්කරණයක්" (particle grader) සංවර්ධනය කිරීම

c) කුඩා පරිමාණ වී වියළන යන්ත්‍රයක් සංවර්ධනය කිරීම

d) සහල් පිටිවල තත්ත්වය ඉහළ නැංවීම මත පූර්ව - ජෙලටිනීකරණයෙහි කාර්යභාරය

e) සහල් ඇඹරුම් කර්මාන්තයෙහි වී තැම්බීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

f) වාණිජ මට්ටමෙන් භාවිතා කිරීම සඳහා පරිභෝජනය කල හැකි පළතුරු ඉටි සකස් කිරීම

g) තක්කාලි පසු අස්වනු රෝගාබාධ පාලනය සඳහා GRAS රසායන ද්‍රව්‍ය යොදා ගැනීම, අධ්‍යයනය කිරීම

h) සුපිරි වෙළඳ සැල් සැපයුම් දාමය සඳහා ප්ලාස්ටික් කුඩ භාවිතය : විෂය අධ්‍යයනයකි

i) ශ්‍රී ලංකාවේ තිබෙන තෝරා ගත් ඖෂධීය ආහාර නිපැයුම් සංවර්ධනය කිරීම

j) මුරුංගා (*moringa oleifera*)පත්‍ර පදනම් කරගෙන පෝෂණ මිශ්‍රණයක් සහ පාන් තැවරුමක් සකස් කිරීම

k) සහල් ආශ්‍රිත නැවුම් රස කැවිලි නිෂ්පාදනය කිරීම

l) අඩු වශයෙන් ප්‍රයෝජනයට ගන්නා පලතුරු වල අගය වැඩි කිරීම මඟින් නැවුම් ready to serveපලතුරු නිෂ්පාදන සකස් කිරීම

m)කෙසෙල් සඳහා ඇසුරුම් පද්ධතියක් නිර්මාණය කොට සංවර්ධනය කිරීම

n) ගබඩා ජීවී කාලය සහ නිෂ්පාදන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා බී ලූණු වල දැනට කෙරෙන පසු අස්වනු පුරුදු වැඩිදියුණු කිරීම

o) කුරක්කන් නූඩ්ල්ස් සෑදීම සඳහා මධ්‍යම පරිමාණයේ ක්‍රියාත්මක පද්ධතියක් හඳුන්වාදීම

p) වසාවාසි වියලනයක් නිර්මාණය කිරීම

q) මැතකදී නිර්දේශ කරනු ලැබූ සම්ප්‍රදායක සහල් වර්ග වල භෞතික, සැකසුම්, පිසීමේ, පරිභෝජනය කිරීමේ සහ පෝෂණ තත්ත්වයන් ඇගයීම

r) දැනට (ප.අ.පි.තා.ආ.) පවතින නූඩ්ල්ස් සෑදීමේ ක්‍රියාදාමය වැඩිදියුණු කර නිෂ්පාදනය පිරිවැය අඩුකිරීම

## 2.4. ප.අ.පි.තා.ආ. කාර්ය මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ සිසුන් විසින් සම්පූර්ණ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති

2011 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයන්හි කෘෂිකර්ම පීඨවල සිසුන් ඔවුන්ගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති ප.අ.තා.ආ. පර්යේෂණ කාර්ය මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ සම්පූර්ණ කර ඇති අතර විස්තර පහත දක්වා ඇත.

1) දර්ශීය ජංගම වෙළඳ සැලෙහි ගබඩා තත්ත්වයන් තුළදී නැවුම් පළතුරු සහ එළවළුවල භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක වෙනස්කම් ඇගයීම

2) ගම්මිරිස්වල ගල් ඉවත් කිරීම සඳහා සහල් වල ගල් ඉවත්කරණයෙහි යෝග්‍යතාව පරීක්ෂා කිරීම සහ ඇගයීම

3) කැරට් මෘදු කුණුවීමට යොදා ගත හැකි පාලන ක්‍රමවේද අධ්‍යයනය කිරීම

4) විජලනය කරන ලද මුරුංගා පත්‍ර පාන් තැවරුමක් ලෙස යොදා ගැනීම සංවර්ධනය කිරීම සහ ගබඩා කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම

5) ලීක්ස් ප්‍රවාහනය සඳහා තොග ඇසුරුම් (ප.අ.පි.තා.ආ. විසින් සංවර්ධිත) වල ස්ථායිතාව ඇගයීම

6) සහල් ආශ්‍රිත රස කැවිලි

7) සාම්ප්‍රදායික සහල් ප්‍රභේද 3ක භෞතික සහ රසායනික ගති ලක්ෂණ ඇගයීම

8) මුරුංගා පදනම් කර ගත් පෝෂණ මුසුවක් සංවර්ධනය කිරීම

9) "මඩතවාලු" සහල් ප්‍රභේදයෙහි පෙඟවීමේ කාලය ඇගයීම

10) කරපිංචා සහ සහල් පිටි යොදාගනිමින් කැකර් නිෂ්පාදනය කිරීම

11) සහල් ආශ්‍රිත ක්ෂණික ඖෂධීය පානයක් නිෂ්පාදනය කිරීම

12) මුරුංගා සහ මුරුංගා ආශ්‍රිත නිෂ්පාදන

13) ඩ්‍රැගන් ෆෲට් යොදාගනිමින් අඩු සීනි ජෑම් වර්ගයක් සකස් කිරීම

14) ආසුතිකව විජලනය කල ඇඹුල් කෙසෙල් දුඹුරු පැහැ ගැන්වීම වැළැක්වීම සඳහා විවිධ පූර්ව ප්‍රතිකාර ඇගයීම

15) අවම සැකසීම සඳහා සුදුසු වම්බටු ප්‍රභේදයක් තේරීම පිළිබඳ අධ්‍යයන

16) *Erwinia carotovora* විසින් ඇති කරන කැරට් මෘදු කුණුවීම මත උෂ්ණත්වය, pH අගය සහ GRAS රසායන මගින් ඇතිකරන බලපෑම

17) ලීක්ස් ප්‍රවාහනය සඳහා ප.අ.තා.ආ. යෙහි සංවර්ධිත ඇසුරුමෙහි යෝග්‍යතාව ඇගයීම

## 3. තාක්ෂණ සම්ප්‍රේෂණය

තාක්ෂණික ක්‍රමවේද යෙදවීම සහ පසු අස්වනු කර්මාන්තය මත ඒවායේ බලපෑම සහතික කිරීම පිණිස 2011 වර්ෂය තුලදී ප.අ.පි.තා.ආ.මගින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති පහත විස්තර කර ඇත.

### 3.1. "අපි වවමු- රට නගමු" වැඩසටහන යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

### 3.1.1. සිල්ලර වෙළඳාම සඳහා පළතුරු සහ එළවළු ජංගම වෙළඳ සැලක් හඳුන්වා දීම

අවිධිමත් පසු අස්වනු ක්‍රියාකාරකම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ මුළු පළතුරු සහ එළවළු නිෂ්පාදනයෙන් 30-45% ක් වැනි අධික ප්‍රමාණයක් හානියට පත් වේ. සිල්ලර වෙළඳාමේදී 15% සිට 20% දක්වා හානියට පත් වන බව ඇස්තමේන්තු කර ඇත. එබැවින් සිල්ලර වෙළඳාමේදී අඩු උෂ්ණත්ව සහ සාපේක්ෂව වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාව වැනි සුදුසු තත්ත්වයන් පැවතීම පළතුරු සහ එළවළුවල තත්ත්වය සහ ජීව කාලය වැඩිදියුණු කිරීමට හේතු වේ.

ජංගම සිල්ලර අළෙවි සැලෙහි ප්‍රමාණය සෙ.මී.180xසෙ.මී.100x සෙ.මී.90 (දිග x පළල x උස) විය. එය වාත්තු යකඩ, මල නොබැඳෙන වානේ තහඩු, වීදුරු සහ ඇලුමිනියම් තහඩු යොදා ගනිමින් සැලසුම් කර ඇත. ගබඩා කර ඇති නිෂ්පාදන ඍජු හිරු එළියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වහළක් ඇති අතර එක් තැනකින් තවත් තැනකට රැගෙන යාම සඳහා පාදයට රෝද සවි කර ඇත. උෂ්ණත්වය අඩු කිරීම සඳහා අයිස් කැට යොදා ගෙන ඇති අතර එමගින් වෙළඳ සැළ තුළ සාපේක්ෂ ආර්ද්‍රතාවද ඉහළ නැංවේ. එබැවින්, ජංගම වෙළඳ සැලේ පවත්වා ගෙන යනු ලබන තත්ත්ව පළතුරු සහ එළවළුවල ජීව කාලය දීර්ඝ කර ගැනීම සඳහා සුදුසු වේ. නිෂ්පාදන ශීත කිරීම සඳහා අයිස් බඳුනක් යොදා ගැනිණි. ජංගම වෙළඳ සැල තුළ උෂ්ණත්වය සෙල්සියස් අංශක 23 -24C$^{O}$ අතර පවත්වා ගැනීම සඳහා දිනකට අයිස් කැට කි.ග්‍රෑ. 15ක් අවශ්‍ය විය. තවද, සාමාන්‍ය උෂ්ණතවය සෙල්සියස් 33C$^{O}$ සහ සාපේක්ෂ ආර්ද්‍රතාව 65% සිට 80% දක්වා වූ අගයක පවතින විටදී අලෙවි සැල තුළ සාපේක්ෂ ආර්ද්‍රතාව 85% සිට 95% දක්වා වූ පරාසයක පවත්වා ගන්නා ලදී. වෙළඳ සැලෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම සඳහා පළතුරු ලෙස පේර, ගස්ලබු සහ එළවළු ලෙස වම්බටු සහ තක්කාලි ද යොදා ගන්නා ලදී. පාලන ප්‍රතිකර්ම හා සැසඳීමේදී වැඩිදියුණු කළ ජංගම වෙළඳ සැල තුළදී තෝරා ගත් පළතුරු සහ එළවළුවල බර හානි වීමේ ප්‍රතිශතය සැලකිය යුතු ලෙස අඩු අගයක් ගන්නා බව ප්‍රතිඵල මගින් අනාවරණය වී ඇත.

පිළියම් කළ තත්ත්ව යටතේ තෝරා ගත් පළතුරු සහ එළවළු වල වර්ණය, TSS සහ දැඩි බව සැලකිය යුතු ලෙසින් වැඩිදියුණු විය. වැඩිදියුණු කළ වෙළඳ සල තුළ තත්ත්ව පිරිහීමකින් තොරව තෝරා ගත් පළතුරු සහ එළවළු දින 07ක් තබා ගත හැකි වූ අතර පාලන නියැදි තැබිය හැකි වූයේ දින 03ක් පමණි. අවසාන වශයෙන් දර්ශීය ජංගම සිල්ලර වෙළඳ සැල මගින් තෝරා ගත් පළතුරු සහ එළවළු වල ජීව කාලය දීර්ඝ කර ගත හැකි අතර පශ්චාත් අස්වනු හානි ද අවම කර ගත හැකි බව තීරණය කළ හැක.

වැඩිදියුණු කළ ජංගම වෙළඳ සැල් මහනුවර පළතුරු සහ එළවළු සිල්ලර වෙළෙන්දන්ට හඳුන්වා දී ඇත. මේ වන විට ඔවුන් නැවුම් තත්ත්වයේ පළතුරු සහ එළවළු අලෙවි කිරීම සඳහා මෙම අලෙවි සල් සාර්ථකව භාවිතා කර ඇත. වැඩිදියුණු කළ ජංගම වෙළඳ සැලෙහි පළතුරු සහ එළවළු ප්‍රදර්ශනයට තබන ස්ථානය වීදුරු ජනේල මගින් ආවරණය කර ඇති බැවින් එහි පළතුරු සහ එළවළු සඳහා දූවිල්ලෙන් තොර පිරිසිදු පරිසරයක් පවත්වා ගනු ලැබිණි. මෙය විශේෂයෙන් විදේශිකයන් සහ නාගරික පාරිභෝගිකයන්ගේ සිත් ඇද ගැනීම සඳහා තවත් හේතුවක් වී ඇත.

### 3.1.2. ග්‍රාමීය ප්‍රදේශයන්හි කෘෂි සැකසුම් ව්‍යාපාර (ධාන්‍ය සහ කුළුබඩු) ආරම්භ කිරීම

අනුරාධපුර පිහිටි සහල් සැකසුම් පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සඳහා අනුප්‍රාප්තිකයා වන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය දිවයින පුරා සහල් පිටි සැකසුම් තාක්ෂණික ක්‍රමවේදයන් ආරම්භ කර ඇත. ඉලක්කගත කණ්ඩායමෙහි ගෘහස්ථ ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා සහ මධ්‍යම මට්ටමේ ව්‍යවසායකයින් සඳහා ව්‍යාපෘති ප්‍රදේශය තුළ ධාන්‍ය සහ කුළුබඩු සැකසුම් පහසුකම් ව්‍යාප්ත කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ව්‍යාප්තිය සඳහා තෝරා ගෙන ඇති තාක්ෂණික ක්‍රමවේද වන්නේ ධාන්‍ය සහ කුළුබඩු පිරිසිදු කිරීම, ගල් ඉවත් කිරීම, පොතු ඉවත් කිරීම, පැළීම සහ ඇඹරීම වේ. අවුරුදු හතරක කාල පරිච්ඡේදයක් තුළ සහල් පිටි සැකසුම් ක්‍රියාකාරකම්හි සැලකිය යුතු වැඩිදියුණුවක් සාක්ෂාත් කර ගෙන ඇත. එබැවින්, ඉහළ තත්ත්වයෙන් යුත් කවුපි, මුං ඇට වැනි ධාන්‍ය නිෂ්පාදන සහ මිරිස් කුඩු, තුනපහ කුඩු වැනි කුළුබඩු නිෂ්පාදන නිෂ්පාදනය කිරීම ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ සාධ්‍ය ස්වයං රැකියාමය ක්ෂුද්‍ර - ව්‍යාපාර වනු ඇත.

පසු අස්වනු පද්ධතියෙහි කඩිනමින් වැඩිදියුණු කළ යුතු අනෙක් අංශය වන්නේ ග්‍රාමීය කෘෂි ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනයයි. වර්තමානයේදී කෘෂි යෙදවුම් පිරිවැය ඉහළ ගොස් ඇති බැවින් මෙම බෝග වගා කිරීමෙන් ගොවියා ලබන ප්‍රතිලාභය සීමාසහිත වී ඇත. ගොවිතැනින් ලබන මෙම අඩු ආදායම් ගැටලුව අවම කර ගැනීමේ ඵලදායී මාර්ගයක් වන්නේ ගොවිපළ මට්ටමින් කෘෂි සැකසුම් ක්ෂුද්‍ර - ව්‍යාපාර ආරම්භ කිරීම වේ. වර්තමානයේදී ගොවියන් විසින් ඔවුන්ගේ නිෂ්පාදන සකස් නොකළ ආකාරයෙන් අලෙවි කරන අතර ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශවලදී මෙම භෝග සකස් කිරීම සිදු කරනු ලැබේ. ගොවීන් විසින්ම ග්‍රාමීය මට්ටමේදීම සැකසීම කළ හැකි නම් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා අලෙවි වටිනාකම ඉහළ නංවා ගත හැකි බවද එමගින් ඔවුන්ගේ ආදායම සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගත හැකි බවද මේ වන විට අවබෝධ වී ඇත.

ව්‍යාපෘති අරමුණ වූයේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ සිටින කුඩා/මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ගොවීන් සහ රැකියා විරහිත තරුණ තරුණියන් හට හඳුනා ගත්, යෝග්‍ය කෘෂි-සැකසුම් කර්මාන්ත හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වටිනාකම් එක් කිරීම හරහා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමයි. එමගින්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනයේ ව්‍යාප්ති අංශයෙහි උපදේශකත්වය සමගින් කෘෂි ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන අනාගත කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයින්, ගොවි සංවිධාන,රැකියා විරහිත තරුණ තරුණියන්, ආයතනය විසින් හඳුනාගෙන ඇත. තවද, පුද්ගලයින් 120 කට වඩා වැඩි පිරිසක් සඳහා ධාන්‍ය / කුළුබඩු සැකසුම් තාක්ෂණික ක්‍රමවේද , නිෂ්පාදන කළමනාකරණය සහ අලෙවිකරණය පිළිබඳව පුහුණුවක් ලබා දී ඇත. ආයෝජනයෙන් 50% ක් කෘෂි කර්මාන්ත ආරම්භ කිරීමේ නියමය මත තැටි ඇඹරුම් යන්ත්‍ර 12 ක් ආයතනය විසින් ව්‍යවසායකයින්ට ලබා දී ඇති අතර ඒවා පිහිටුවීම සඳහා සහ කොමිෂන් කිරීම (commissioning) සඳහා අනුග්‍රහය දක්වා ඇත. මේ වන විට සියළු ප්‍රතිලාභීන් යන්ත්‍ර පිහිටුවීමෙහි යෙදී සිටින අතර සමහර දෙනෙක් නිෂ්පාදනය ආරම්භ කරමින් පවතී. අවශ්‍ය වූ ප්‍රතිලාභීන් සඳහා ප.අ.පි.තා.ආ. විසින් තාක්ෂණික සහායද ලබා දී ඇත. පසු විපරම් කාර්ය ව්‍යාප්ති සේවය මගින් සිදු කරනු ඇත.

### 3.1.3. ග්‍රාමීය ප්‍රදේශයන්හි පළතුරු ආශ්‍රිත ක්ෂුද්‍ර - ව්‍යවසාය ආරම්භ කිරීම

ශ්‍රී ලංකාවේ කෘෂි කාලගුණය, පුවල් පරාසයක නිවර්ථන, අර්ධ නිවර්තන සහ ඉහළ වෙළඳපළ විභවයක් සහිත සමශීතෝෂ්ණ පළතුරු සඳහා සුදුසු වේ. කෙසේ වුවද, අවිධිමත් සැපයුම් දාම සහ මිල දාම ක්‍රියාකාරකම් හේතුවෙන් 30-40% දක්වා වූ අස්වනු ප්‍රමාණයක් පසු අස්වනු අවධියේදී හානියට පත් වේ. මෙම ප්‍රමාණය දුප්පත්කම, බඩගින්න සහ මන්දපෝෂණය අවම කිරීම සඳහා යොදා ගත හැකි අතරම ඒවා දිවයිනෙහි අපනයන ආදායම ඉහළ නංවා ගැනීම සඳහා ද යොදා ගත හැකි වේ. අනෙක් අතට, ග්‍රාමීය වගා අංශයෙහි ආදායම් ඉපැයීමේ ක්‍රමවේද පිළිබඳ නොදැනුවත්වීම හේතුවෙන් ඇති වී තිබෙන අඩු ආදායම් මට්ටම ඉක්මනින් විසඳිය යුතුව ඇති ප්‍රධාන කාරණයකි.

මෙම තත්ත්වය තුළ ග්‍රාමීය ප්‍රදේශයන්හි නිෂ්පාදනය කරන පළතුරු පරිහරණය කිරීම සහ සැකසීම සඳහා සුදුසු ක්‍රමවේද සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ඉලක්ක වේ. එබැවින්, අවසානයේදී පළතුරුවල පසු අස්වනු හානිය අවම කරවීම සඳහා මඟ පෙන්වන පළතුරු පරිහරණය කිරීමේ සහ සැකසීමේ ක්‍රියාකාරකම් වැඩිදියුණු කරන අතරම ග්‍රාමීය මට්ටමින් ආදායම් ඉපැයීමේ කෘෂි ආශ්‍රිත ක්ෂුද්‍ර - ව්‍යාපාර ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

ආරම්භයේදී අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක 06කින් ගොවි ප්‍රජා තෝරා ගන්නා ලදී. පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර 50% ක සහන මිලකට පල්ප යන්ත්‍ර 03ක් සහ වියළන යන්ත්‍ර 02ක් ලබා දීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනිණි. කෙසේ වුවද, පල්ප යන්ත්‍ර 03ක් සැපයීමට තෝරා ගත් නිෂ්පාදකයා අවශ්‍ය තත්ත්වයෙන් ඒවා නොසැපයූ බැවින් ප්‍රතික්ෂේප විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අංක 05, බී කලාපය, කෝන් වැව පදිංචි රේණුකා ගීතාංජලී මහත්මියටත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අංක 05, “රත්නගිරිය”, ලිඳුල පදිංචි කේ.ඒ.අබේසේකර මහතාටත් වියළන යන්ත්‍ර 02ක් සපයා ඇති අතර ඔවුන් පිළිවෙළින් “ජය ඉසුරු” සහ “Sam Products” යන වෙළඳ නාමයන්ගෙන් ඔවුන්ගේම නිෂ්පාදනය සහ අලෙවිකරණය ආරම්භ කර ඇත. මෙම වැඩසටහන යටතේ පුහුණු කරන ලද අනෙක් ප්‍රතිලාභියා, සමගි උයන, අනුරාධපුර පදිංචි ඒ.එම්.පී. චින්තන මහතා “ Kings food Products” යන වෙළඳ නාමයෙන් පළතුරු ආශ්‍රිත නිෂ්පාදන ඒකකයක් ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ “අපි වවමු-රට නගමු” වැඩසටහන යටතේ මෙහෙය වන ලදී.

### 3.1.4. සහල් පිටි කර්මාන්තය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ සහල් නිපදවන ප්‍රධාන ප්‍රදේශයන්හි නව සහල් පිටි සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම සඳහා අනාගත ව්‍යවසායකයින් උනන්දු කරවීම සඳහා සහ පවතින කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා ප.අ.පි.තා.ආ. දිවයින පුරා වැඩසටහන් ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් සමාලෝචිත කාල පරිච්ඡේදයේදී ප්‍රතිලාභීන් 298 දෙනෙකු පුහුණු කර සහල් පිටි shifter යන්ත්‍ර 10ක් මිලදී ගෙන සුදුසු ප්‍රතිලාභීන් අතර බෙදා දී ඇත. ප්‍රතිලාභීන්ගේ නම් සහ ලිපිනයන් පහත දැක්වේ.

1. ඩී.පී. කරුණාසේන මහතා, අංක 67, රුහුණුගම, වෙහෙරගල
2. එම්. සූරසේන මහතා, නිදන්ගල, සොරබොර ජනපදය
3. පී. ප්‍රියන්ත මහතා, පී.එම්. සහල් මෝල, බෝගහ හන්දිය, අම්බලන්තොට
4. එච්.කේ. කලන්සූරිය මහතා, වඳුරඹගේ වත්ත, නාරාව, පෝද්දල
5. ඩබ්ලිව්. එස්. ප්‍රනාන්දු මහතා, අංක 80 ඒ, ජයන්ති මාවත, අනුරාධපුරය
6. රේණුක ප්‍රදීප කුමාර වර්ණකුලසූරිය මහතා, අංක 80/ඒ 2, ජයන්ති මාවත, අනුරාධපුරය

7. ඒ.පී.එල්. බණ්ඩාර මහතා, තරුෂ සහල් මෝල/ මධුර ලංකා සහල් පිටි මෝල, සිරිපුර

8. ආනන්ද පුංචිනිලමේ මහතා, රුවිනි සහල් පිටි මෝල, දඩයම්තලාව

9. ඩී.එම්. චන්දන ප්‍රසාද් දිසානායක මහතා, මයිල්ලෑව, තඹුත්ත, ගල්ගමුව

සහල් පිටි shifter යන්ත්‍ර බෙදා දීම තුළින් සහල් පිටි ඇඹරුම් හල් හිමියන් හට ඉතා සියුම් සහල් පිටි අංශු නිෂ්පාදනය කළ හැකි අතර ඔවුන් විසින් වඩාත් හොඳ තත්ත්වයෙන් යුත් සහල් පිටි වෙළඳ පොළට හඳුන්වා දී ඇත. විශේෂයෙන් සහල් පිටි නිෂ්පාදකයින් ඇල් ජලය එක්කර ඉඳි ආප්ප තැනිය හැකි ඉඳි ආප්ප සහල් පිටි හඳුන්වා දී ඇත. සහල් ආශ්‍රිත බේකරි නිෂ්පාදන සඳහා සුදුසු ජෙලටිනීකරණය නොවූ සියුම් අංශු සහිත සහල් පිටි, පිටි ඇඹරුම්හල් හිමියන් විසින් නිෂ්පාදනය කර ඇත. සහල් පිටි shifter යන්ත්‍ර භාවිතය ආරම්භ කිරීමෙන් පසුව මෙම පිටි ඇඹරුම්හල් හිමියන්ගේ සහල් පිටි සඳහා වන ඉල්ලුම ඉහළ ගොස් ඇත.

### 3.1.5. සහල් සැකසුම් ගම්මානයන්හි ක්‍රියාත්මක වන තෝරා ගත් මධ්‍යම හා කුඩා පරිමාණ සහල් ඇඹරුම්හල්වල පහසුකම් වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ විවෘත වෙළඳපළෙහි විකිණීමට ඇති විශාල සහල් ප්‍රමාණයක් විශේෂයෙන්ම මිල අඩු සහල්, බාල තත්ත්වයෙන් යුක්ත වන අතර ඉහළ දුර්වර්ණ මට්ටමකින් සහ ඉහළ කැඩුනු සහල් ප්‍රතිශතයකින්ද යුක්ත වන බව මෑතකදී කළ සමීක්ෂණයකින් අනාවරණය වී ඇත. වර්තමානයේදී, ප.අ.පි.තා.ආ. යෙහි අධීක්ෂණය යටතේ පසු ගිය වර්ෂවල පිහිටුවන ලද සහල් සැකසුම් පවුල්/ ගම්මාන මගින් මෙම ඇඹරුම්හල් සහල් නිෂ්පාදනය සඳහා භාවිතා කෙරේ. මෙම කුඩා පරිමාණ සහල් ඇඹරුම්හල්වල පවතින හඳුනා ගත් ප්‍රධාන අවාසිය වන්නේ ගල් ඉවත් කිරීම සඳහා සහ සහල්වලට ඇලී ඇති නිවුඩු ඉවත් කිරීම සඳහා පිළිවෙළින් ගල් ඉවත් කරන යන්ත්‍ර සහ නිවුඩු ඇස්පිරේටර් යන්ත්‍ර නොමැතිවීමයි. එවැනි නවීකරණ වැඩසටහනක් සඳහා ඇති ප්‍රධාන අවහිරය වන්නේ අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා සහල් ඇඹරුම්හල් හිමියන් හට ප්‍රාග්ධනය නොමැති වීමයි. එබැවින්, ගල් ඉවත් කරන යන්ත්‍ර, නිවුඩු ඇස්පිරේටර් යන්ත්‍ර වැනි වැඩිදියුණු කළ යන්ත්‍ර සහ උපකරණ එක් කර ගැනීම මගින් ඔවුන්ගේ ඇඹරුම්හල් වැඩිදියුණු කර ගැනීම සඳහා සහනාධාර ලබා දීම වැදගත් වේ. ප.අ.පි.තා.ආ. තාක්ෂණික මග පෙන්වීම යටතේ සහල් සැකසුම් පවුල් විසින් භාවිතා කරනු ලබන තෝරා ගත් කුඩා පරිමාණ සහල් ඇඹරුම්හල් 10ක් සඳහා ගල් ඉවත් කරන යන්ත්‍ර සහ නිවුඩු හලන ඇස්පිරේටරය සහිත shifter යන්ත්‍ර ලබා දීම මගින් ඒවායේ තත්ත්වය උසස් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් ඉලක්ක කර ඇත. මෙම වැඩිදියුණු කළ ඇඹරුම්හල් අවම වශයෙන් සහල් සැකසුම් පවුල් 15ක් සඳහා තැම්බූ වී ඇඹරීම සිදු කරනු ඇත. එබැවින්, මෙම වැඩිදියුණු කරන ලද ඇඹරුම්හල් භාවිතයෙන් උසස් තත්ත්වයේ සහල් නිපදවීමට හැකියාව ලැබීම තුළින් සහල් ඇඹරුම්හල් හිමියන් වෙත ලබා දුන් සහනාධාරය සහල් සැකසුම් පවුල් සඳහා ද වක්‍ර වශයෙන් ලැබෙනු ඇත. මේ සම්බන්ධයෙන් සහල් සැකසුම් පවුල් 139ක් පුහුණු කර ඇත. මෙම යන්ත්‍ර සවි කළ සහල් ඇඹරුම්හල් හිමියන් උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය කරන අතර ගම්මානයේ සහල් සැකසුම් පවුල් සඳහා ඔවුන්ගේ සේවාවන් ලබා දේ.

**ප්‍රතිලාභ බෙදා හැරීමේ සාරාංශය**

| දිස්ත්‍රික්කය | පුහුණු පාඨමාලා ගණන | පුහුණුලාභීන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| අනුරාධපුර | 02 | 45 | 03 |
| කුරුණෑගල | 01 | 27 | 02 |
| පොළොන්නරුව | 01 | 37 | 02 |
| අම්පාර | 01 | 30 | 03 |
| එකතුව | 05 | 139 | 10 |

ප්‍රතිලාභීන්ගේ නම් සහ ලිපිනයන් (යන්ත්‍ර බෙදා දුන්)

1. කේ.බී. විජයදාස මහතා, අන්දර වැව, නොච්චියාගම, අනුරාධපුරය (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
2. පී.බී. තිලකාවතී මහත්මිය, අංක 168, ජයන්ති ගම, සාලියපුර, අනුරාධපුරය (ඩිස්ටෝනරය පමණි)
3. ආර්.එම්. දිසානායක මහතා, සාර භූමි, 313/01/139, මහවැලිපැන්න, මීගලෑව, අනුරාධපුරය (ඇස්පිරේටරය පමණි)
4. එල්.එම්. රත්නබණ්ඩාර මහතා, පලුගස්වැව, නාගොල්ලාගම, කුරුණෑගල (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
5. ජී.පී.සී.එස්. දයාරත්න මහතා, චින්තක හාල් මෝල, මඩලන්ද වත්ත, කුරුණෑගල (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
6. ඩබ්ලිව්.එම්. ලාල් ධම්මික වික්‍රමසිංහ මහතා, යාය 06, අංක 110, හංසයා පාළම, පොළොන්නරුව (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
7. එම්.ජී. චිනී කුමාරතුංග මහතා, අංක 54, නිදන්විල, දම්මින්න, පොළොන්නරුව (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
8. ඒ.එම්.යූ.කේ. අත්තනායක මහතා, 26/3, විජයපුර, දඩයම් තලාව, අම්පාර (ඩිස්ටෝනරය සහ ඇස්පිරේටරය)
9. ඩබ්ලිව්.එල්.ඩී. ප්‍රියන්ත සම්පත් වික්‍රමසිංහ මහතා, අංක 06 බී/ 78, අඹගහ වෙල්ල, පරගහ කැලේ, අම්පාර (ඩිස්ටෝනරය පමණි)

### 3.1.6. පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම

වී, සහල් සහ අනෙකුත් ධාන්‍ය, මාෂ බෝග වෙනත් වගා බෝග පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගවල පසු අස්වනු තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම සඳහා සහ යාවත්කාලීන කිරීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි නිලධාරීන්, ගොවීන්, වෙළෙන්දන්, එක්රැස් කරන්නන්, සැකසුම්කරුවන් සහ ස්වයංරැකියා ප්‍රතිලාභීන් වෙනුවෙන් දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මත සංවර්ධන ව්‍යාපෘතියක් සහ පුහුණු වැඩසටහන් දියත් කර ඇත. පවතින සහ සුදුසු තාක්ෂණික ක්‍රමවේද සම්බන්ධයෙන් ප්‍රතිලාභීන් දැනුවත් කරනු ලබන බැවින් එමගින් පශ්චාත් අස්වනු හානිය අවම වීම, නිෂ්පාදන තත්ත්වය වැඩිදියුණු වීම තුළින් වගා කරන්නන්ගේ සහ නිෂ්පාදකයින්ගේ ලාභය ඉහළ නැංවීමට මග පෙන්වනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා පසු

අස්වනු තාක්ෂණ ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ. 1593 දෙනෙකු පුහුණු කරන ලද අතර පුහුණු පාඨමාලා 21ක් පවත්වා ඇත. ක්ෂේත්‍ර මට්ටමින් සිදු කරනු ලැබූ පසු විපරම් මගින් මෙම පුහුණු වැඩසටහන් තුළින් පුහුණුව ලැබූවන්ගේ පසු අස්වනු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම් මට්ටම වැඩිදියුණු වී ඇති බව අනාවරණය වී ඇත. හඳුන්වා දුන් තාක්ෂණ ක්‍රමවේද එනම්, අස්වනු නෙළීමට සුදුසු මේරූ අවස්ථා සහ ක්‍රියාකාරකම්, පශ්චාත් අස්වනු රෝග පාලන ක්‍රමවේද, ධාන්‍ය විශේෂයෙන් වී විධිමත් ලෙස වියළීම ආදිය ඔවුන් විසින් භාවිතා කරනු ලැබේ.

### 3.1.7. ගොවියාගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවිපළ මට්ටමේ වී ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම

ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අස්වනු නෙළන වාරය තුළදී ගොවිපළ මට්ටමේ මිල ගණන් පහළ අගයක පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වර්තමානයේදී වී වගා කිරීමෙන් ගොවියා ලබන පවුලේ ආදායම සතුටුදායක නොවේ. ගොවියාගේ ආදායම ඉහළ නැංවීම සඳහා එක් විසඳුමක් ලෙස, මාස කිහිපයකට වී ගබඩා කර තබා ගැනීම යෝජනා කළ හැක්කේ අවාරයේදී වී සඳහා වෙළඳපළ ඉල්ලුම සහ මිල ගණන් ද සාපේක්ෂව වැඩි අගයක් ගන්නා බැවිනි. නමුත් වී ගබඩා කර තැබීමේදී 4% සිට 6%දක්වා ප්‍රමාණාත්මක හානියක් සිදු වන බව හඳුනා ගෙන ඇති අතර අවිධිමත් ගබඩා ක්‍රියාකාරකම් හේතුවෙන් තත්ත්වයේ සිදු වන පිරිහීමද ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවලින් එකකි. විධිමත් ක්‍රියා පිළිවෙළකට අනුව වී ගබඩා කර තැබීමෙන් ඔවුන්ට දීර්ඝ කාලයක් නිෂ්පාදනයෙහි තත්ත්වය පවත්වා ගෙන යා හැකි වේ. එබැවින්, ගොවිපළ මට්ටමේ ගෘහස්ථ වී ගබඩා කිරීම සංවර්ධනය කළ යුතු වේ. ගෘහස්ථ මට්ටමේ වී ගබඩා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් සංවර්ධන ව්‍යාපෘතියක් මෙහෙයවා ඇත. ගොවි භාරකාර අරමුදලෙන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ "අපි වවමු- රට නගමු" වැඩසටහනෙන් මූල්‍යාධාර ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, මොණරාගල, හම්බන්තොට, කුරුණෑගල, මහනුවර, යාපනය, මාතර සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල ක්‍රියාවට නංවා ඇත. 2011 වර්ෂය තුළදී ග්‍රාමීය මට්ටමේ වී ගබඩා 124ක් සංවර්ධනය කර ඇති අතර ගෝනි බිස්ස (ධාරිතාව බුසල් 45) ඒකක 50ක් හඳුන්වා දී ඇත.

පවතින වී ගබඩා පහසුකම් වැඩිදියුණු කර ගන්නා ලද ගොවීන් විධිමත් පරිදි වී ගබඩා කර ඇත. මෙම වැඩිදියුණු කිරීම් හේතුවෙන් ඔවුන් විසින් ධාන්‍ය හානිය අවම කර ගෙන ඇති අතර ධාන්‍ය තත්ත්වය සංරක්ෂණය කර ගෙන ඇත. එවිට අවාරයේදී ඔවුන්ගේ වී අස්වැන්න වැඩි මිලකට අළෙවි කළ හැක.

### 3.1.8. ග්‍රාමීය ප්‍රදේශවල සහල් ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කරන ක්ෂුද්‍ර-ව්‍යාපාර ආරම්භ කිරීම

ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ කාබෝහයිඩ්‍රේට් අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් සහල් සහ තිරිඟු පිටි මගින් ලබා ගනී. සහල් ඉහළ පෝෂණ ගුණයෙන් යුතු වුවද, සහල් අංශය, තිරිඟු පිටි ආශ්‍රිත නිෂ්පාදන හේතුවෙන් ඉහළ තරඟකාරිත්වයකට මුහුණ දී ඇති අතර සහල් විශාල ප්‍රමාණයක් සැකසීමෙන් තොරව ප්‍රාථමික අවස්ථාවේදීම අළෙවි කිරීම සහ වානිජ මට්ටමෙන් සහල් පිටි රස කැවිලි ඉතාමත් සීමාසහිත වීම මෙයට එක් වී ඇත.

එබැවින්, ජනගහනයෙන් විශාල කොටසකට ප්‍රතිලාභ අත්පත් කර දීමට වටිනාකම් එක්කළ නිෂ්පාදනයන්හි ඕනෑම වැඩිවීමකට විභවයක් පවතී. තවද, ආනයනික තිරිඟු පිටි සහ තිරිඟු පිටි ආශ්‍රිත නිෂ්පාදන සඳහා ආදේශකයක් ලෙස සහල් පිටි නිෂ්පාදන යොදා ගැනීමෙන් වටිනා විදේශ විනිමය ඉතිරි කර ගත හැකි වන අතරම ජනතාවගේ මනා සෞඛ්‍ය තත්ත්වය පවත්වා ගැනීමට ද හැකි වේ.

එම නිසා, ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහතික කරමින් සහල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් අතර ජනප්‍රිය කරවීම සහ ඔවුන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, මහනුවර, අම්පාර, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි කුඩා පරිමාණ සහල් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් ඒකක 08ක් පිහිටුවීම සඳහා මෙම සංවර්ධන ව්‍යාපෘතිය

ක්‍රියාත්මක කරන ලදී. තවදුරටත්, ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා ස්වයංරැකියා අවස්ථා හඳුන්වා දීමත්, තාක්ෂණය සපයා දීම සහ 50%ක සහනාධාර මිලකට අවශ්‍ය උපකරණ ලබා දීමත් සිදු කර ඇත.

පළමු අදියරේදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 08කින් ගම්මාන 08ක් තෝරා ගත් අතර ආසන්න වශයෙන් පුද්ගලයින් 550දෙනෙකු සඳහා පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. පුහුණුවෙන් අනතුරුව සහල් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂුද්‍ර-ව්‍යවසාය ආරම්භ කළ සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගැනිණි. අවසානයේදී දිස්ත්‍රික්ක 03ක තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා විදුලි පෝරණු 03ක් බෙදා දෙන ලදී. කර්මාන්තය ආරම්භ කර මාස 03කට පසුව පෙර තත්ත්වය හා සැසඳීමේදී ඔවුන් මනා ආර්ථික තත්ත්වයක සිටී. ඔවුන්ගේ සහල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නොකඩවා ඉල්ලීම් ලැබෙමින් පවතී. විදුලි පෝරණු ලබා දුන් ප්‍රතිලාභීන්ගේ නම් සහ ලිපිනයන් :

1. ශ්‍රීමතී බාලසූරිය මහත්මිය, අංක 11, හඳවිරු ගම, දිවුලන්කඩවල
2. ඒ. ශාන්ති මහත්මිය, පල්ලන්කුලම, රඹෑව
3. ඩී.එම්. කීර්තිලතා මහත්මිය, අංක 21, හපුගල, ගාල්ල

## 3.2. "ගොවි භාරකාර අරමුදල" යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

### 3.2.1. ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවිපොළ මට්ටමින් ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම

ගෘහස්ථ මට්ටමේ වී ගබඩා කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් සංවර්ධන ව්‍යාපෘතියක් මෙහෙයවා ඇත. ගොවි භාරකාර අරමුදලෙන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ "අපි වවමු- රට නගමු" වැඩසටහනෙන් මූල්‍යාධාර ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, හම්බන්තොට, කුරුණෑගල, මහනුවර, යාපනය සහ මාතර සහ යන දිස්ත්‍රික්කවල ක්‍රියාවට නංවා ඇත. 2011 වර්ෂය තුළදී පුද්ගලයින් 186 දෙනෙකු පුහුණු කර ඇති අතර ගබඩා ව්‍යූහ 23ක් වැඩිදියුණු කර ඇත.

පවතින වී ගබඩා පහසුකම් වැඩිදියුණු කර ගන්නා ලද ගොවීන් විධිමත් පරිදි වී ගබඩා කර ඇත. මෙම වැඩිදියුණු කිරීම් හේතුවෙන් ඔවුන් විසින් ධාන්‍ය හානිය අවම කර ගෙන ඇති අතර ධාන්‍ය තත්ත්වය සංරක්ෂණය කර ගෙන ඇත. එවිට අවාරයේදී ඔවුන්ගේ වී අස්වැන්න වැඩි මිලකට අළෙවි කළ හැක.

## 3.3. ප.අ.පි.තා.ආ. මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති

### 3.3.1. ආදර්ශ ගම්මාන වැඩසටහන - 2011

මෙම ව්‍යාපෘතිය යටතේ ආදර්ශ ගම්මාන 08ක් පිහිටුවා ඇති අතර පහත ක්‍රියාකාරකම් ආරම්භ කර ඇත.

| ක්‍රියාකාරකම | ඒකක | දිස්ත්‍රික්කය | ගම |
|---|---|---|---|
| උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය | 4 | අම්පාර | ගෝනගල |
| | | අනුරාධපුරය | මහවිලච්චිය |
| | | පොළොන්නරුව | සමඟිපුර |
| සහල් පිටි ඒකක | 01 | අම්පාර | ගෝනගල |
| සහල් ඇඹරුම්හල් නවීකරණය | 02 | අනුරාධපුරය | මහවිලච්චිය |
| | | කුරුණෑගල | ගිරිබාව |
| විජලන ඒකක | 01 | ගාල්ල | වල්ලිපිටිමෝදර |
| සහල් ආශ්‍රිත නිෂ්පාදන | 06 | ගාල්ල | වල්ලිපිටිමෝදර |
| | | කුරුණෑගල | ගිරිබාව |
| | | හම්බන්තොට | සූරිය වැව |
| පළතුරු ආශ්‍රිත නිෂ්පාදන | 05 | හම්බන්තොට | සූරිය වැව |
| | | ගාල්ල | වල්ලිපිටිමෝදර |
| | | මහනුවර | බෝගහවැව |
| | | නුවරඑළිය | කඳපොළ |

මෙම සියලු ව්‍යාපෘති අතරින් අනුරාධපුරය, අම්පාර, පොළොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ග්‍රාමීය මට්ටමේ උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදන ඒකක පිහිටුවන ලදී. ප්‍රතිලාභීන් කණ්ඩායම් වශයෙන් සංවිධානය කර ඔවුන්ගේ ක්‍රියාකාරකම් සාමූහිකව කර ගෙන යන ලදී. ඔවුන්ගේ නිෂ්පාදන දුර බැහැර ප්‍රදේශ කරා ද යවනු ලබන අතර ඔවුන්ගේම ස්ථානවලදී ද අළෙවි කරනු ලැබේ. ප්‍රතිලාභීන් හට ඔවුන්ගේ ආදායම් ඉහළ නංවා ගැනීමට හැකි වී ඇති අතර එය ඔවුන්ගේ ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකම් පුළුල් කර ගැනීම සඳහා ද සහාය වී ඇත. ආරම්භ කිරීම සඳහා කාලය නොමැති වීම හේතුවෙන් අනිකුත් ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකම් ආරම්භ කර නොමැත.

### 3.3.2 පළතුරු සහ එළවළු වල පසු අස්වනු හානිය අවම කර ගැනීම සඳහා ඇසුරුම් ක්‍රමවේද සහ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම

ගොවියාගේ සිට පාරිභෝගිකයා දක්වා පශ්චාත් ක්‍රියාකාරකම් කාලය තුළ සිදු වන දැඩි හානිය, ප්‍රමාණාත්මකව වාර්ෂික නිෂ්පාදිතයෙන් 30% - 35% ක්, වැළැක්වීම සඳහා පළතුරු සහ එළවළු ප්‍රවාහනය සඳහා ගොවීන්, එක්රැස් කරන්නන් සහ තොග වෙළඳුන් හට සහන මිලකට ප්ලාස්ටික් කුඩ සැපයීම සඳහා භාණ්ඩාගාර මූල්‍යාධාර ලබන ව්‍යාපෘතියක් 2011 වර්ෂය තුළදී ක්‍රියාත්මක කෙරුනි. මෙම ව්‍යාපෘතිය යටතේ 50% ක සහනාධාරයකට ගොවීන්, වෙළෙන්දන් සහ එක්රැස් කරන්නන් අතර බෙදා හැරීම සඳහා තක්කාලි සහ අනෙකුත් එළවළු සහ ගස්ලබු, අන්නාසි වැනි පළතුරු ඇසිරීම සඳහා භාවිතා කළ හැකි මාදිලි 03කින් සමන්විත ප්ලාස්ටික් කුඩ 35,000ක් ප.අ.පි.තා.ආ. විසින් මිලදී ගෙන ඇත. මේ හා සම්බන්ධව නුවරඑළිය, බදුල්ල, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ගොවීන් සහ පළතුරු, එළවළු එකතු කරන්නන් සහ දඹුල්ල, තඹුත්තේගම, කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාර පවත්වා ගෙන යන වෙළෙඳුන් සඳහා ප්ලාස්ටික් කුඩ 17,921ක් සපයා ඇත. මීට අමතරව පළතුරු සහ එළවළු පරිහරණය සහ ප්‍රවාහනය සඳහා වැඩිදියුණු කළ අසුරන භාවිතය ප්‍රතිලාභ සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇති කිරීම සඳහා ගොවීන් සහ එක්රැස් කරන්නන් 7,312 දෙනෙකුට පුහුණුවීම් ලබා දී ඇත. සුපිරි වෙළඳසැල් සඳහා පළතුරු සහ එළවළු සපයන ගොවීන්ගෙන් 75% කට වඩා වැඩි දෙනෙක් මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ප්ලාස්ටික් කුඩ භාවිතා කළ අතර එමගින් එකතු කිරීමේ මධ්‍යස්ථානවලදී ප්‍රතික්ෂේප කිරීම 10-20% සිට 3-5% දක්වා අවම කර ගැනීමට සමත් විය. එමෙන්ම, පිටත වෙළඳපළට වඩා වැඩි මිලක් ද ගොවීන්ට ගෙවනු ලැබේ. සාමාන්‍ය සැපයුම්දාමයෙහි ප්ලාස්ටික් කුඩ මිලදී ගත් ගොවීන්, එක්රැස් කරන්නන් සහ ප්‍රවාහකයින් ප්ලාස්ටික් කුඩ භාවිතා කරමින් පළතුරු සහ එළවළු ප්‍රවාහනය

කරන අතර එමගින් තත්ත්වය ආරක්ෂා කර ගනිමින් හානිය අවම කර ගෙන ඇත. මෙම පුද්ගලයින් හට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් ලැබී ඇති අතර විශේෂිත වෙළඳ පොළවල් සමඟ සම්බන්ධතා ගොඩ නඟා ගෙන ඇත.

### 3.3.2. පසු අස්වනු තාක්ෂණ සම්බන්ධව දැනුවත්භාවය ඇති කිරීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම

දිවයිනෙහි වර්තමාන තත්ත්වය සැලකීමේදී, ගොවි ප්‍රජාව විසින් වගා සහ පෙර අස්වනු අවස්ථා සඳහා ඉහළ අවධානයක් යොමු කරන අතරම ඔවුන් ඉහළ ඵලදාවක් ද ලබා ගනී. නමුත් පශ්චාත් අස්වනු ක්ෂේත්‍රයේ අවිධිමත් ක්‍රියාකාරකම් හේතුවෙන් ඉහළ පශ්චාත් අස්වනු හානියකට මඟ පෙන්වා ඇති අතර මෙම ඵලදාව සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගත නොහැකිව පවතී. කල් තබා ගත හැකි බෝග සඳහා මෙම හානිය 12-13% වන අතර කල් තබා ගත නොහැකි බෝග සඳහා 30-40% පමණ වේ. මීට අමතරව මෙම පශ්චාත් අස්වනු හානිය හේතුවෙන් ගොවිපොළ මට්ටමේ මිල ගණන් පහළ ගොස් සිල්ලර මිල ගණන් ඉහළ යනු ලැබේ.

එබැවින්, ගොවියා අඩු ලාභයක් ලබන අතර පාරිභෝගිකයාට වැඩි මිලක් ගෙවීමට සිදු වී ඇත. තවද, මෙම අවිධිමත් ක්‍රියාකාරකම් හේතුවෙන් නිෂ්පාදනයන්හි තත්ත්වය ද පහළ යමින් පවතී. එවිට පාරිභෝගිකයා බාල තත්ත්වයේ නිෂ්පාදන සඳහා වැඩි මිලක් ගෙවනු ලබනවා ඇත. මෙම හානිය ඇති වීමේ ප්‍රධානතම හේතුව වන්නේ පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැති වීමයි. එමෙන්ම, නැවුම් නිෂ්පාදන නැවුම් තත්ත්වයෙන්ම අලෙවි කිරීමට ජනතාව හුරුපුරුදු වී ඇත. වටිනාකම් එක් කිරීම පිළිබඳව සහ ඔවුන්ගේ ලාභය ඉහළ නංවා ගැනීම පිළිබඳ දැනුමක් ඔවුන් සතුව නැත.

එබැවින් වී, සහල් සහ අනෙකුත් ධාන්‍ය, මාෂ බෝග වෙනත් වගා බෝග පළතුරු, එළවළු සහ කුළුබඩු බෝගවල පසු අස්වනු තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම සඳහා සහ යාවත්කාලීන කිරීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන්හි නිලධාරින්, ගොවීන්, වෙළෙන්ඳන්, එක්රැස් කරන්නන්, සැකසුම්කරුවන් සහ ස්වයංරැකියා ප්‍රතිලාභීන් වෙනුවෙන් දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මත සංවර්ධන ව්‍යාපෘතියක් සහ පුහුණු වැඩසටහන් දියත් කර ඇත. පවතින සහ සුදුසු තාක්ෂණික ක්‍රමවේද සම්බන්ධයෙන් ප්‍රතිලාභීන් දැනුවත් කරනු ලබන බැවින් එමඟින් පසු අස්වනු හානිය අවම වීම, නිෂ්පාදන තත්ත්වය වැඩිදියුණු වීම තුළින් වගා කරන්නන්ගේ සහ නිෂ්පාදකයින්ගේ ලාභය ඉහළ නැංවීමට මග පෙන්වනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් අරමුදල් සපයනු ලැබේ. ගොවිපළ මට්ටමින් සිදු කරනු ලැබූ පසු විපරම් මගින් මෙම පුහුණු වැඩසටහන් තුළින් පුහුණුව ලැබූවන්ගේ පසු අස්වනු තාක්ෂණ අංශය පිළිබඳ දැනුම් මට්ටම වැඩිදියුණු වී ඇති බව අනාවරණය වී ඇත. හඳුන්වා දුන් තාක්ෂණ විධි එනම්, අස්වනු නෙළීමට සුදුසු මේරූ අවස්ථා සහ ක්‍රියාකාරකම්, පසු අස්වනු රෝගාබාධ පාලන ක්‍රමවේද, ධාන්‍ය විශේෂයෙන් වී විධිමත් ලෙස වියළීම ආදිය ඔවුන් විසින් භාවිතා කරනු ලැබේ.

### 3.3.3. ග්‍රාමීය ප්‍රදේශ සඳහා කෘෂි පදනම් ක්ෂුද්‍ර-ව්‍යවසායන් හඳුන්වාදීම

මෙම ව්‍යාපෘතිය මගින් කෘෂි පදනම් නිෂ්පාදන සම්බන්ධයෙන් ප.අ.පි.තා.ආ.යේ සොයා ගැනීම් හඳුන්වා දී ඇත. ව්‍යාපෘතිය කුරුණෑගල, පොළොන්නරුව, හම්බන්තොට, අම්පාර, මහනුවර, නුවරඑළිය යන ප්‍රදේශවල ප.අ.පි.. ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. උදාහරණ වශයෙන් තක්කාලි ආශ්‍රිත නිෂ්පාදන, පළතුරු සහ එළවළු වියළීම, සියඹලා ආශ්‍රිත නිෂ්පාදන, ග්‍රාමීය මට්ටමේ වී තැම්බීම, සහල් පිටි සැකසීමේ ඒකක, තල ආශ්‍රිත නිෂ්පාදන, සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන දැක්විය හැක. පුද්ගලයින් 435 දෙනෙකු පුහුණු කර ඇති අතර පුහුණු වැඩසටහන් 18ක් පවත්වා නිෂ්පාදන ඒකක 12ක් ස්ථාපිත කර ඇත.

1. ග්‍රාමීය මට්ටමේ සහල් ඇඹරුම්හල් ආරම්භ කිරීම:-

අ) සුභසාධක සංගමය, නුගලන්ද

ආ) චින්තක මහතා, බමුණු ගෙදර, කුරුණෑගල

ඇ) මානෙල් මහේෂිකා මහත්මිය, සාලිය අසෝක පුර, රාජාංගනය

2. සහල් පිටි නිෂ්පාදනය :-

අ) සුභසාධක සංගමය, නුගලන්ද

ආ) පියල් පද්ම දර්ශන මහතා, සී/362/2, එරාගම පාර, අම්පාර

ඇ) ඩී.වී. ප්‍රේමරත්න මහතා, පුබුදු හාල් මෝල, රජගල තැන්න

3. දෙහි ආශ්‍රිත නිෂ්පාදන :- සේනාධීර මහතා, 2වැනි කනුව, සියඹලාන්ඩුව

4. සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන :- එච්.බී. සිරිමතී බාලසූරිය මහත්මිය, අංක 11, රසික ස්ටෝර්ස්, හදවිරුගම, දිවුලන්කඩවල

5. වියළන ලද එළවළු :- චින්තා ද වාස් ගුණවර්ධන මහත්මිය, අංක 395, වැල්පිටමෝදර, ගිංතොට

6. විජලනය කරන ලද නිෂ්පාදන :- කේ.ඒ. අබේසේකර මහතා - නො. 05, රත්නගිරියාව ලිඳුල

7. සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන :- නදීක සම්පත් තෙන්නකෝන් මහතා, "නිව් නුවරඑළිය ෆුඩ්ස්", අංක 37, මීපිලිමාන, නුවරඑළිය

ආරම්භ කිරීමෙන් පසුව, මෙම ව්‍යාපෘති ප්‍රතිලාභීන් ප.අ.පි.තා.ආ. මගින් හඳුන්වා දුන් තාක්ෂණය භාවිතයෙන් වටිනාකම් එක් කළ නිපැයුම් නිෂ්පාදනය කරනු ලැබේ. ඔවුන් ඉහළ තත්ත්වයේ නිපැයුම් නිෂ්පාදනය කරන අතර ඔවුන්ගේ ගම්මානයන්හි ගෘහස්ථ මට්ටමින්, අසල පිහිටි සිල්ලර වෙළඳ සැල් මගින් සහ ඔවුන්ගේ ගමින් පිටත මෙන්ම ප්‍රදේශයෙන් පිටතට ද අළෙවි කරමින් පවතී.

### 3.3.4. සහල් පිටි ඇඹරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීම

දිවයිනෙහි සහල් නිපදවන ප්‍රධාන ප්‍රදේශයන්හි නව සහල් පිටි සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම සඳහා අනාගත ව්‍යවසායකයින් උනන්දු කරවීම සඳහා සහ පවතින කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා ප.අ.පි.තා.ආ. දිවයින පුරා වැඩසටහන් ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් සමාලෝචිත කාලසීමාව තුළදී ප්‍රතිලාභීන් 22කු පුහුණු කර ඇති අතර ඒකක 25ක් නවීකරණය කර පිහිටුවා ඇත. ප්‍රතිලාභීන්, යෝග්‍ය යන්ත්‍රසූත්‍ර තෝරා ගැනීම, සහල් තෝරා ගැනීම, යෝග්‍ය පිටි ඇඹරුම් යන්ත්‍ර, සහල් පිටි ඇසුරුම් කිරීම සහ ගබඩා කිරීම ආදිය ඇතුළත් උසස් තත්ත්වයේ සහල් පිටි නිෂ්පාදනය සම්බන්ධයෙන් පුහුණු කර ඇත. පුහුණුවෙන් පසු තෙත් ක්‍රමය වෙනුවට වියළි ක්‍රමය භාවිතා කිරීමෙන් සහල් පිටි නිෂ්පාදනය ආරම්භ කර ඇති අතර ඔවුන්ගේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගෙන ඇත. තවද, සමහර ඇඹරුම්හල් හිමියන් ඔවුන්ගේ සහල් පිටි තොග සහ කුඩා පැකට් වශයෙන් වෙළඳ පොළට හඳුන්වා දීම ආරම්භ කර ඇත. එමෙන්ම, පෙර තිබූ තත්ත්වයට වඩා තත්ත්වයෙන් උසස් සහල් පිටි නිෂ්පාදනය ආරම්භ කර ඇත.

1. බී.එල්. ඇල්ෆ්‍රඩ් ලියනගේ මහතා, විජේරාම මාවත, දකුණු ඇළ, අඹන් ගඟ, පරාක්‍රම සමුද්‍රය

2. නිරංජලා රණවීර මහත්මිය, ශ්‍රියානන්ද වත්ත, සිංහාපිටිය, ගම්පළ

3. ආර්.එම්. පාලිත රනතුංග මහතා, අළුපොත, උස්සාපිටිය

### 3.3.6. සහල් ඇඹරුම්හල්වල ඵලදායීතාව ඉහල නැංවීම සහ දේශීයව නිෂ්පාදනය කරන සහල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සහල් ඇඹරුම් කර්මාන්තය යාන්ත්‍රීකරණය කිරීම

වාර්ෂිකව මෙට්‍රික් ටොන් 2.8ක් පමණ සැකසුම් කරන සහල් සැකසුම් කර්මාන්තය ශ්‍රී ලංකාවේ විශාලතම සහ පුළුල්ව ව්‍යාප්ත වී ඇති කෘෂි ආශ්‍රිත කර්මාන්තය වේ. එසේ වුවද, මෙම සාම්ප්‍රදායික කර්මාන්තය විශාල වශයෙන් අත හැර දමා ඇත්තේ එහි සාම්ප්‍රදායික ආකාරයන් සදාකල් පවතින්නට හරිමිනි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, නවිකරණය කළ සහල් ඇඹරුම් යන්ත්‍ර මගින් ලබා ගත හැකි සහල් ප්‍රමාණය වන 69-70% හා සැසඳීමේදී වර්තමානයේ වී ඇඹරීමෙන් ලබා ගන්නා සහල් ප්‍රතිශතය 60-65% තරම් අවම මට්ටමක පවතින අතර ඉහළ අපද්‍රව්‍ය මට්ටමක් පැවතීම, කැඩුනු, අවපැහැ ගැන්වුණු සහ හානියට ලක් වූ ධාන්‍ය පැවතීම හේතුවෙන් නිෂ්පාදිත සහල් බාල තත්ත්වයේ පවතී. එබැවින් සහල් ඇඹරුම් කර්මාන්තය නවීකරණය කිරීම තුළින් සහල් නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු මට්ටමකින් අවම කරගත හැකි වනු ඇති අතරම තත්ත්වය වැඩිදියුණු වීම තුළින් තරගකාරි මිලකට ඉතා හොඳ තත්ත්වයේ සහල් පැවතීම සහතික කරනු ඇත.

සහල් ලබා ගැනීමේ මට්ටම ඉහළ නැංවීම සහ සහල්වල තත්ත්වය වැඩිදියුණු කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් දිවයිනෙහි, විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල සහල් ඇඹරුම්හල්වල පවතින සැකසීමේ තාක්ෂණ විධි වැඩිදියුණු කිරීම සඳහා පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය වැඩසටහනක් දියත් කර ඇත. මෙම වැඩසටහන යටතේ, හම්බන්තොට, අම්පාර, පොළොන්නරුව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල යෝජිත සහල් අපනයන කලාපයන්හි සහල් ඇඹරුම්හල් හිමියන් සඳහා නවීන යන්ත්‍රසූත්‍ර සහ නවතම තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීමට අපේක්ෂිතය.

දිවයිනෙහි පවතින සහල් ඇඹරුම්හල්වල සැකසීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා 2001 වර්ෂයේදී ආරම්භ කරන ලද සහල් ඇඹරුම්හල් නවීකරණය කිරීමේ වැඩසටහන පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් කරෙගන යනු ලැබිණි. ප්‍රතිලාභීන් 139 දෙනෙකු පුහුණු කර ඇති අතර ඒකක 10ක් නවීකරණය/ යාන්ත්‍රීකරණය කර ඇත.

### 3.3.7. සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම

දිවයිනෙහි ප්‍රධාන සහල් නිෂ්පාදන ප්‍රදේශයන්හි සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම 2011 වසරේ සිට සිදු කර ඇත. ග්‍රාමීය ගොවීන් සහල් සැකසුම්හි යෙදුන හොත් ඔවුන්ගේ නිෂ්පාදනයන්හි වෙළඳපළ වටිනාකම ඉහළ නංවා ගත හැකි වන අතරම එමගින් ඔවුන්ගේ ආදායම ද සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගත හැකි වේ. එසේම ග්‍රාමීය ගොවි අංශයෙහි ස්වයංරැකියා ද ඇති වේ. මේ සම්බන්ධයෙන්, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ප්‍රතිලාභීන් පුහුණු කර ඇත. ප්‍රදේශයේ පවතින සංවර්ධන බැංකුවලින් ලබා ගත් සහන ණය මගින් සහල් සැකසුම් ගම්මාන සාමාජිකයන් විසින් වී තැම්බීමේ සහ ඇඹරීමේ පහසුකම් අත්පත් කර ගෙන ඇත. එක් පවුලක වී තැම්බීමේ ධාරිතාව දිනකට කි.ග්‍රෑ. 150-200ක් වේ. වර්තමානයේදී, ප.අ.පි.තා.ආ. විසින් වැඩිදියුණු කරන ලද සහල් සැකසුම් තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් සහල් සැකසුම් ගම්මාන සාමාජිකයින් විසින් ඉහළ තත්ත්වයේ සහල් නිෂ්පාදනය කරනු ලබන අතර ඒවා ග්‍රාමීය අංශයෙහි මෙන්ම නාගරික වෙළඳපළෙහි ද අළෙවි කරනු ලැබේ. වී වෙනුවට සහල් විකිණීම මගින් එක් පවුලක් රු.10,000 – 15,000 දක්වා වූ සැලකිය යුතු ශුද්ධ ආදායමක් උපයා

ගනී. 2011 වර්ෂය තුළදී සහල් සැකසුම් ගම්මාන 24ක් පිහිටුවන ලදී. ගොවි පවුල් සාමාජිකයින් 275 දෙනෙකු පුහුණු කර ඇත. ප්‍රතිලාභීන් සමහරක් වන්නේ:-

1. එම්.ජී. විමල් කුමාර මහතා, සමගිපුර, මින්නේරිය
2. ඩබ්ලිව්.ජී. නන්දාවතී මහත්මිය, සමගිපුර, මින්නේරිය
3. ආරියවතී වික්‍රමනායක මහත්මිය, සමගිපුර, මින්නේරිය
4. ලසන්ත උදලාගම මහතා, දේවාල පාර, මින්නේරිය
5. පී. ප්‍රේමා වනසිංහ මහත්මිය, සමගිපුර, මින්නේරිය
6. ලක්මිණී විජයබණ්ඩාර මහත්මිය, 9 වැනි ඇළ, මින්නේරිය
7. එස්.එම්. දීපිකා සංජීවනී මහත්මිය, 9 වැනි ඇළ, මින්නේරිය
8. ටී.එම්. කෝදාගොඩ මහතා, සමගිපුර, මින්නේරිය
9. ඩී.එම්. අබේකෝන් බණ්ඩාර මහතා, 9 වැනි ඇළ, මින්නේරිය
10. ටී.ඩී. චමින්ද ජයලත් මහතා, සමගිපුර, මින්නේරිය
11. කල්‍යාණී ගුණරත්න මහත්මිය, පලුගස්වැව, නාගොල්ලාගම
12. ජයන්ති නිල්මිණී මහත්මිය, 233, යාය 03, සෝලේපුර

මෙම ගම්මාන සාමාජිකයින් වර්තමානයේ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය විසින් හඳුන්වා දුන් තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් සිටී. ඔවුන් වී තැම්බීමේ යන්ත්‍රෝපකරණ මිලදී ගෙන ඇති අතර ඔවුන්ගේ ගෘහස්ථ මට්ටමින් ඉහළ තත්ත්වයේ තැම්බු සහල් නිෂ්පාදනය ආරම්භ කර ඇත. ඔවුන්ගේ නිෂ්පාදන ඔවුන්ගේ ගම්මාන තුළදී නිවසේදී, ගමේ පොළේදී සහ අසල සිල්ලර වෙළඳසැලේදී අලෙවි කරනු ලැබේ.

## 3.4. ලෝක ආහාර වැඩසටහනෙහි මූල්‍යාධාර ලබන සංවර්ධන ව්‍යාපෘති

### 3.4.1. ශ්‍රී ලංකා උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම සහ සහල් පිටි ඇඹරුම්හල් වැඩිදියුණු කිරීම (ලෝක ආහාර වැඩසටහන)

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා ගම්මාන 10ක් තෝරා ගෙන ඇති අතර තෝරා ගත් ප්‍රතිලාභීන් 912 දෙනෙකු පුහුණු කර ඇත. උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය සඳහා ප්‍රතිලාභීන් 120 දෙනෙකු තෝරා ගෙන ඇත.

### 3.4.6. වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම

2011 වර්ෂයේ ක්ෂේත්‍ර ව්‍යාප්ති වැඩසටහන් තුළින් පහත සඳහන් වැඩිදියුණු පශ්චාත් අස්වනු තාක්ෂණික ක්‍රම හඳුන්වා දී ඇත.

| වැඩිදියුණු කළ පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද | දිස්ත්‍රික්කය | ගණන |
|---|---|---|
| අ. ප.අ.තා.ආ. සහල් තැම්බීමේ යන්ත්‍රය | අම්පාර, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මහනුවර, රත්නපුර, හම්බන්තොට, කුරුණෑගල | 602 |
| ආ. අතින් ක්‍රියා කරන බඩඉරිඟු පොතු ඉවත් කරන යන්ත්‍රය | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය | 01 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ කෘෂිකර්ම, බිඳුනුවැව, බණ්ඩාරවෙල | 01 |
| | ඊ. මොහොමඩ් මහතා, ඇෆ්ගනිස්ථානය | 02 |
| | ලසන්ත කුමාර මහතා, ලංකා කෙමිකල් ඉන්ඩස්ට්‍රීස්, කොළඹ 02 | 01 |
| | දසුන් ජයමාන්න සෝමරත්න මහතා, දකුණු ඉවුර, යාය 05, රාජාංගණය (දකුණු අප්‍රිකාවට යැවීමට නියමිතය) | 06 |

### 3.5. 100%ක රතු කැකුළු සහලින් නිපදවූ නූඩ්ල්ස් ජනප්‍රිය කරවීම

අගය එක්කළ සහල් ආශ්‍රිත නිෂ්පාදන, දේශීය වෙළඳපළෙහි ජනප්‍රිය කරවීම පිණිස, චීන රජයේ ආධාර වැඩසටහන යටතේ පිහිටවූ ප.අ.පි.තා.ආ.යේ සහල් ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ සහ ප්‍රදර්ශනය කිරීමේ කර්මාන්තශාලාවේ පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් 100%ක රතු කැකුළු සහලින් නිපදවූ සහල් නූඩ්ල්ස් නිෂ්පාදනය කර අළෙවි කර ඇත.

2011 වර්ෂය තුළදී රතු කැකුළු සහල් නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීම සඳහා ප.අ.පි.තා.ආ. විසින් වී කි.ග්‍රෑ. 8260.5ක් සහ 3260.5ක් අලන්කුලම, විමලසේන මහතාගෙන්ද ඉතිරි වී ප්‍රමාණය වී අළෙවි මණ්ඩලයෙන් ද මිලදී ගෙන ඇත. 2011 වර්ෂයේ වාර්ෂිකව රතු සහල් නූඩ්ල්ස් නිෂ්පාදනය කි.ග්‍රෑ. 4989.5ක් වූ අතර ග්‍රෑම් 200 පැකට්ටු 22,683ක් ප.අ.පි.තා.ආ. වෙළඳසැලෙන් අළෙවි කර ඇත. නෙස්ලේ සමාගමේ පිරිසක් 2011 ජනවාරි 26 වැනි දින නූඩ්ල්ස් කර්මාන්තශාලාව නිරීක්ෂණ චාරිකාවකට සහභාගී වූහ.

## 4.0 පුහුණු වැඩ සටහන්

සමාලෝචිත වර්ෂය තුළදී පුහුණුව සඳහා වන ඉල්ලුම, විශේෂයෙන්ම පෞද්ගලික සහ සමුපකාර අංශයේ සංවිධානවලින් නොකඩවා වර්ධනය විය. ආයතනය මඟින් පැවැත්වූ පුහුණු පාඨමාලා, නිෂ්පාදනය/ව්‍යාප්තිය දිශානත කොටගෙන, පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම්හි නියැලෙන පුද්ගලයින් උදෙසා තාක්ෂණය ලබා දීම ඉලක්ක කර ගත් ඒවා විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, රාජ්‍ය නොවන සංවිධාන

සහ මහවැලි ආර්ථික නියෝජිතායනය යන ආයතන සමඟ සහයෝගිත්වයෙන් ගොවීන් සහ ගෙවිලියන් විශාල සංඛ්‍යාවක්ද පුහුණු කර ඇත.

## 4.1. පැවැත් වූ පුහුණු වැඩසටහන් වල විස්තර

පවත්වන ලද පුහුණු වැඩසටහන් 304න් 65ක්, දින 1-6 දක්වා වූ නේවාසික කෙටි කාලීන පුහුණු පාඨමාලා සහ අධ්‍යයන චාරිකා ද 43ක්, ආයතනයෙන් බැහැර පුහුණු පාඨමාලා ද 239ක් අම්පාර, නුවරඑළිය, මහනුවර, අඹන්පොල, අනුරාධපුර සහ මයුරපුර ස්ථානගත කර ඇති ක්ෂේත්‍ර මධ්‍යස්ථානයන්හි ගොවීන්, වෙළෙන්දන් සහ සුළු හා මධ්‍ය පරිමාණ සැකසුම්කරුවන් සඳහා පවත්වන ලද ක්ෂේත්‍ර පුහුණු / ආදර්ශන ද විය.

***අ) යන්ත්‍රාගාර පුහුණුව***

2011 ජුනි සිට ජුලි දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපාධි අපේක්ෂකයින් 04 දෙනෙකු යන්ත්‍රෝපකරණ සහ පශ්චාත් අස්වනු තාක්ෂණය සම්බන්ධයෙන් පුහුණු කර ඇත.

***ආ) නේවාසික පුහුණුව***

2011 වර්ෂය තුළදී, කෙටි කාලීන පුහුණු පාඨමාලා 65ක් පැවැත් වූ අතර පුද්ගලයින් 1929 දෙනෙකු පශ්චාත් අස්වනු තාක්ෂණයෙහි විවිධ විෂයයන්හි පුහුණු කර ඇත. විස්තර 01 රූපයෙන් දැක්වේ.

රූපය 01 ප.අ.පි.තා.ආ. නේවාසික පුහුණුලාභීන්

මුළු පුහුණුලාභීන් ගණන-1929

මුළු පුහුණු වැඩසටහන් ගණන – 165




***පුහුණුවන්නන් කාණ්ඩ***

A) ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් - 664 (34%)

B) ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් - 240 (12%)

C) සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසුම්කරුවන් - 67 (4%)

D) රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් - 360 (19%)

E) ද්විතීයික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් - 598 (31%)

රූපය 02 ප.අ.තා.ආ. අනේවාසික පුහුණුවන්නන්

මුළු පුහුණුවන්නන් ගණන- 5239

මුළු පුහුණු වැඩසටහන් ගණන – 239




A) ගොවීන්, ගෙවිලියන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් - 3242 (62%)

B) ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් - 722 (14%)

C) සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසුම්කරුවන් - 799 (15%)

D) රාජ්‍ය, සමුපකාර, පෞද්ගලික සහ රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාප්ති නිලධාරින් - 182 (3%)

E) ද්විතීයික පාසල්, විශ්වවිද්‍යාල, කෘෂි සහ කාර්මික විශ්වවිද්‍යාල සිසුන් - 83 (2%)

F) බේකරි හිමිකරුවන් - 211 (4%)

***ඇ) ආයතනයෙන් බැහැර පුහුණු, ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු / ආදර්ශන***

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ආයතනය එහි තාක්ෂණය ලබාදීමේ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස විශේෂයෙන්ම ප්‍රධාන බෝග නිෂ්පාදන ප්‍රදේශයන්හි එනම්, අම්පාර, නුවරඑළිය, අඹන්පොල (කුරුණෑගල දිස්ත්‍රික්කය), මහනුවර, මයුරපුර (හම්බන්තොට දිස්ත්‍රික්කය), අනුරාධපුරය සහ පොළොන්නරුව ක්ෂේත්‍ර මධ්‍යස්ථාන හරහා සිදු කර ඇත. 2011 වර්ෂය තුළදී ආයතනයෙන් බැහැර ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් සහ

ආදර්ශන 239ක් පවත්වා පුද්ගලයින් 5239ක් පුහුණු කර ඇත. 2011 වර්ෂය තුළදී දිවයින පුරා සිදු කරන ලද ක්ෂේත්‍ර පුහුණු ක්‍රියාකාරකම්වල විස්තර පහත දක්වා ඇත.

1 වගුව - 2011 වර්ෂය තුළදී පැවැත්වූ ආයතනයෙන් බැහැර පුහුණු, ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු/ ආදර්ශන

| පුහුණුවන්නන් කාණ්ඩය | විෂය පථය | සහභාගිවූවන් ගණන |
|---|---|---|
| i අනුරාධපුරය, පොළොන්නරුව, වව්නියාව, මන්නාරම, අම්පාර, මොණරාගල, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවල ගොවීන් සහ ගෙවිලියන් | වැඩිදියුණු කළ පසු අස්වනු ක්‍රියාකාරකම්, ග්‍රාමීය මට්ටමින් සහල් තැම්බීම සහ සැකසීම | 2029 |
| iiඅනුරාධපුරය,ගාල්ල,පොළොන් නරුව, අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් | ග්‍රාමීය මට්ටමේ සහල් තැම්බීම සහ සැකසීම, ධාන්‍ය පිටි සැකසීම, සහල් විස්කෝතු නිෂ්පාදනය, පළතුරු ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීම | 296 |
| iii අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, මොණරාගල, නුවරඑළිය, බදුල්ල, මහනුවර, කුරුණෑගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි පළතුරු, එළවළු වගා කරන්නන් සහ එක්රැස් කරන්නන් | පළතුරු සහ එළවළු පරිහරණය, සංරක්ෂණ ක්‍රමවේද | 1662 |
| iv අනුරාධපුරය, පොළොන්නරුව සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි සහ උතුරු නැගෙනහිර ප්‍රදේශවල සහල් සහ වෙනත් ධාන්‍ය සැකසුම්කරුවන් | සහල් සහ අනෙකුත් ධාන්‍ය සැකසීම | 303 |
| v ගොවීන්, වෙළෙන්දන්, අම්පාර දිස්ත්‍රික්කයේ සහල් ගබඩා කරනු ලබන සහල් ඇඹරුම්හල් හිමියන් | සහල් ගබඩා කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම | 568 |
| vi පොළොන්නරුව, අනුරාධපුරය, නුවරඑළිය, හම්බන්තොට, ගාල්ල, අඹන්පොළ සහ අම්පාර ප්‍රදේශයන්හි කෘෂි ආශ්‍රිත නිෂ්පාදන සකස් කරන්නන් | දෙහි, තක්කාලි, සියඹලා සහ වෙනත් අඩු භාවිතයක් ඇති පළතුරු සහ එළවළු සැකසීම | 381 |
| එකතුව | | 5239 |

## 4.3. ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය

පහත දක්වා ඇති පරිදි 2011 වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ. දිවයින පුරා පවත්වන ලද ප්‍රදර්ශන සඳහා සහභාගි වී ඇත.

i. 2011 පෙබරවාරිඅ 04 දින සිට 10 දක්වා මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල "දැයට කිරුළ" ප්‍රදර්ශනය.

ii. 2011 අගෝස්තු 01 දින සිට 05 දක්වා වව්නියාව ගොවිපළෙහි "ගොවි සතිය" ප්‍රදර්ශනය.

iii. 2011 ජූනි 28 දින සිට ජූලි 02 දින දක්වා කුරුණෑගල "ඉසුරු සවිය" ප්‍රදර්ශනය.

iv. 2011 ඔක්තෝබර් 05 දින සිට 09 දින දක්වා "තිරුනෙල්වෙලි" හි පැවති උතුරු පළාත් කෘෂිකර්ම ප්‍රදර්ශනය.

v. 2011 ඔක්තෝබර් 12 දින සිට 13 දක්වා අනුරාධපුරය "වලිසිංහ හරිස්චන්ද්‍ර" විද්‍යාලයේදී පැවැති ලෝක ළමා දින ප්‍රදර්ශනය.

vi. අනුරාධපුරය "නිවන්තකචේතිය මහා විද්‍යාලයේ" පැවැති "දිවි නැඟුම" ප්‍රදර්ශනය.

## 5. උපදේශන සහ උපදේශක සේවාවන්

### 5.1. ප.අ.පි.තා.ආ. කාර්ය මණ්ඩලය විසින් සිදු කර ඇති උපදේශන ගණන

2011 වර්ෂය තුළදී, ආයතනය නව පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේදයන් සොයා ගැනීමට ලක් කළ අතර එම තාක්ෂණ ක්‍රමවේදයන්ට අනුව ඔවුන්ගේ තාක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කර ගැනීම සඳහා ඒවා ව්‍යවසායකයින් හට ලබා දීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නව ඇඹරුම්හල් ආරම්භ කිරීම, දැනටමත් පවතින ඇඹරුම්හල් නවීකරණය කිරීමට, ආහාර සැකසීමේ කර්මාන්තශාලා පිහිටුවීමට, වියළුම් ඒකක පිහිටුවීමට, නව ගබඩා ව්‍යුහයන් ඉදි කිරීමට සහ වෙනත් පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම් හා බැඳුනු තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීමට නව ආයෝජකයන් 111 දෙනෙකු, පෞද්ගලික සහල් ඇඹරුම්කරුවන්, ඇඹරුම්හල් හිමියන්, සමුපකාර සංගම්, පෞද්ගලික වෙළෙන්දන්, රාජ්‍ය නොවන සංවිධාන සහ දිවයිනෙහි පශ්චාත් අස්වනු ක්‍රියාකාරකම්වල නියුතු පුද්ගලයින් ප.අ.පි.තා.ආ.යේ මඟ පෙන්වීම ලබා ගන්නට යෙදුණි. 2011 වර්ෂයේදී ප.අ.පි.තා.ආ. විසින් සම්පූර්ණ කරන ලද උපදේශන පිළිබඳ විස්තර 03 වන රූප සටහනෙහි දක්වා ඇත.

03 රූප සටහන. 2011 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද උපදේශනයන් පිළිබඳ විස්තර




**උපදේශන ක්ෂේත්‍ර:**

| | |
|---|---|
| a) සහල් සැකසුම් කර්මාන්තශාලා පිහිටුවීම | 23 |
| b) පවතින සැකසුම් කර්මාන්තශාලා ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීම | 03 |
| c) සහල් සහ වෙනත් පිටි සැකසුම් | 06 |
| d) සහල්/ ධාන්‍ය/ කුළුබඩු සැකසුම් තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ තොරතුරු | 09 |
| e) ධාන්‍ය ගබඩා කිරීම සහ ගබඩා ඉදි කිරීම | 04 |
| f) තත්ත්ව පාලනය සහ ධාන්‍ය මිලදී ගැනීම | 02 |
| g) මිරිස්, පළතුරු සහ එළවළු, කුළුබඩු, ධාන්‍ය/ ඖෂධ බෝග වියලීම | 13 |
| h) RPRDC/ IPHT පශ්චාත් අස්වනු යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 05 |
| i) ග්‍රාමීය මට්ටමේ සහල් සැකසුම් | 01 |
| j) සහල්/ ධාන්‍ය ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය සහ කිරිවරණ ලද/ ළදරු ආහාර | 07 |
| k) යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ඇගයීම | 02 |

l) පළතුරු සහ එළවළු සැකසීම 03

m) බෝග වප පසු අස්වනු තාක්ෂණික තොරතුරු 21

n) නූඩ්ල්ස් නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික තොරතුරු 03

o) ආහාර ඇසුරුම් කිරීම 06

p) ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු 03

## 5.2. ධාන්‍ය නියැදි විශ්ලේෂණය

| නම | නියැදි වර්ගය | නියැදි සංඛ්‍යාව | කරන ලද විශ්ලේෂණය |
|---|---|---|---|
| එස්.ඒ. සිල්වා සහ පුත්‍රයෝ, ගිරිඋල්ල | ආහාර නියැදි ඇසුරුම | 01 | ඔක්සිජන් ප්‍රමාණය මැනීම |
| ශ්‍රී ලංකා යුද හමුදාව | සහල් | 13 | තත්ත්ව විශ්ලේෂණය |
| රූපසිංහ සහල්මෝල, පොල්ගහවෙල | සහල් පිටි | 01 | අංශු ප්‍රමාණය සහ තත්ත්ව විශ්ලේෂණය |
| ටෙස්කො ලංකා සහල් මෝල, ශ්‍රාවස්ථි පුර | වී | 03 | තත්ත්ව විශ්ලේෂණය |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | සෝයා බෝංචි | 10 | තත්ත්ව විශ්ලේෂණය |
| සමූපකාර සංගමය, හෝමාගම | සහල් | 02 | තත්ත්ව විශ්ලේෂණය |

## 6. විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යයන ආයතන සමඟ අනුබද්ධව කටයුතු කිරීම

ප.අ.පි.තා.ආ. පශ්චාත් අස්වනු තාක්ෂණයට සම්බන්ධිත සහයෝගිත්ව පර්යේෂණ, පුහුණු සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විශ්වවිද්‍යාල සහ වෙනත් අධ්‍යයන ආයතන සමඟ සමීපව කටයුතු කර ඇත.

### 6.1. ප්‍රථම උපාධිය පාර්ශවික වශයෙන් සම්පූර්ණ කිරීමක් ලෙස ප.අ.තා.පි.ආ.යේදී විශ්වවිද්‍යාල සිසුන් විසින් පැවැත් වූ පර්යේෂණ ව්‍යාපෘති

| | විශ්වවිද්‍යාලයේ නම | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| අ) | කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 09 |
| ආ) | කෘෂිකර්ම පීඨය, රජරට විශ්වවිද්‍යාලය | 05 |
| ඇ) | ආහාර තාක්ෂණ පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය | 01 |
| ඈ) | කෘෂිකර්ම සහ වැවිලි පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 01 |
| ඉ) | විවෘත විශ්වවිද්‍යාලය | 01 |
| | එකතුව | 17 |

## 7. ප්‍රකාශන සහ ප්‍රචාරක කටයුතු

### 7.1. පසු අස්වනු තාක්ෂණය හා සම්බන්ධ ප්‍රචාරක වැඩසටහන්

1) 2011.04.26 දින පස්වරු 10.00ට ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ පර්යේෂණ නිලධාරින් ස්වාධීන රූපවාහිනියේ "රන් අටුව" වැඩසටහනට සහභාගී වූහ.

2) පර්යේෂණ නිලධාරින් සහ යාන්ත්‍රික ඉංජිනේරුවන් 2011.05.05 දින පෙරවරු 10.30ට අනුරාධපුර, රජරට සේවය මගින් විසුරුවා හරිනු ලැබූ "සරු කෙත" ගුවන්විදුලි වැඩසටහනට සහභාගී වූහ.

3) සෑම මාස තුනකට වරක් බ්‍රහස්පතින්දා පස්වරු 6.30 සිට පස්වරු 7.30 දක්වා "මහ ගෙදරින් ගොවි ගෙදරට" ගුවන්විදුලි වැඩසටහන විසුරුවා හරිනු ලැබේ. ප.අ.පි.තා.ආ. පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් වැඩසටහන් 04ක් පවත්වන ලදී.

4) "ගොවි ගෙදර" පෞද්ගලික ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන "ගොවි ගෙදර" සඟරාව සඳහා දැන්වීම් 04ක් ලබා දෙන ලදී.

### 7.2. පුවත්පත් ලිපි/ ප්‍රවෘත්ති

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ප.අ.පි.තා.ආ.යේ ක්‍රියාකාරකම් ජනමාධ්‍ය තුළින් ප්‍රචාරය කරන ලද අතර විස්තර පහත දක්වා ඇත.

1) වී තැම්බීමේදී යොදා ගන්නා ජලයෙහි අඩංගු "රසායන සහල් තත්ත්වය මත ඇති කරන බලපෑම" පිළිබඳ ලිපියක් දිනමිණ පත්‍රයෙහි පළ විය.

2) "පළතුරු සහ එළවළු ජංගම සිල්ලර අළෙවිසැල" පිළිබඳව "දිනමිණ" සහ "ඩේලි නිවුස්" පුවත්පත්වල ලිපි 02ක් පළ විය.

### 7.3. ප.අ.පි.තා.ආ.යේ ප්‍රකාශන බෙදා හැරීම

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පසු අස්වනු තාක්ෂණය ප්‍රවර්ධනය පිළිබඳ අත් පත්‍රිකා, පත්‍රිකා සහ වෙනත් තොරතුරු සඟරා පිටපත් 25,333ක් සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවා ආයතනයේ ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ලදී. ප.අ.පි.තා.ආ. ප්‍රවෘත්ති සඟරාව "පසු අස්වනු පුවත්" පිටපත් 438ක් විවිධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ අවශ්‍ය පුද්ගලයන් වෙත නිකුත් කර ඇත.

## 8. විශේෂ කටයුතු

මාතර "කොක්මාදුව" පන්සල ප්‍රදේශයේදී 2011.03.13 දින ප්ලාස්ටික් කුඩ පරිහරණය පිළිබඳ වැඩසටහනක් පවත්වන ලදී. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් කෘෂිකර්ම අමාත්‍ය, ගරු මහින්ද යාපා අබේගුණවර්ධන මහතා සහභාගී විය. මිරිස්ස ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රතිලාභීන් 40 දෙනෙකු සඳහා එක් පුද්ගලයෙකුට ප්ලාස්ටික් කුඩ 03 බැගින්ද, දෙණිපිටිය සති පොළෙහි වෙළෙන්දන් 75 දෙනෙකු සඳහා එක් පුද්ගලයෙකුට ප්ලාස්ටික් කුඩ 05 බැගින්ද, මාතර නගරයේ පළතුරු වෙළෙන්දන් 10 දෙනෙකු සඳහා එක් පුද්ගලයෙකුට ප්ලාස්ටික් කුඩ 10 බැගින්ද නොමිලයේ ලබා දෙන ලදී. සියලුම කුඩ නොමිලයේ බෙදා දුන් අතර පුද්ගලයින් 152ක් මෙම වැඩසටහනට සහභාගී වූහ.

## 9. 2011 වර්ෂයේ ගංවතුර තත්ත්වය

මෙම වර්ෂයේදී, අධික වර්ෂාව හේතුවෙන් මල්වතු ඔය පිටාර ගැලීම නිසා ගොඩනැගිලි සහ වෙනත් දේපළ විනාශයට පත් විය. සහල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවේ ගංවතුර මට්ටම අඩි 3-4 පමණ මට්ටම විය. පහත සඳහන් ගොඩනැගිලි සහ දේපළ ගංවතුර හේතුවෙන් විනාශයට පත් විය.

1) නූඩ්ල්ස් ගබඩාව සහ නූඩ්ල්ස් තොග

2) සහල් ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ කර්මාන්තශාලාවේ ගොඩනැගිලි

3) ආහාර තාක්ෂණ රසායනාගාරය සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරය

4) පර්යේෂණ නිලධාරි කාර්යල කාමර 03ක් සහ ගොඩනැගිල්ල

5) ආයතනයෙහි පොකුණ

6) ආරක්ෂක කුටිය

7) ප.අ.පි.තා.ආ.යේ වගාව

8) නිල නිවාස 14

9) නිල නිවාස කරා ගමන් මාර්ගය සහ බෝක්කුව

10) අඩි 135ක තාප්පය

ගංවතුරෙන් සිදු වූ හානි හේතුවෙන් රසායනාගාර උපකරණ නැවත භාවිතා කළ නොහැකි තත්ත්වයට පත් වී ඇත. පරිගණක, සමහර පුස්තකාල පොත් සහ පර්යේෂකයින්ගේ පොත් සහ ලියකියවිලි ද හානියට පත් වී ඇත. නූඩ්ල්ස් ගබඩාවට ඇතුළු වූ ගංවතුර හේතුවෙන් ගබඩාවේ තිබුණු සියළු නූඩ්ල්ස් සහ පැකට්ටු හානියට පත් වී ඇත. මෝටරය සහ යන්ත්‍රසූත්‍ර ධාවන තත්ත්වයට පත් කර ගැනීම සඳහා අළුත්වැඩියා කළ යුතුව ඇත. නිල නිවාස පිරිසිදු කර හානියට පත් වූ ස්ථාන අළුත්වැඩියා කළ යුතුව තිබේ. සිදු වූ දේපළ හානිය වාර්තා කිරීම සඳහා කමිටු 03ක් පත් කරන ලද අතර මුළු හානිය රුපියල් 12,823,415.64ක් බව වාර්තා කර ඇත.

## 10. වෘත්තිය කමිටු/ සම්මන්ත්‍රණ/ වැඩමුළු නියෝජනය කිරීම

- පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂවරිය රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

- අධ්‍යක්ෂවරිය කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) ජාතික පශ්චාත් අස්වනු කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

- අධ්‍යක්ෂවරිය ජාතික විද්‍යා පදනමේ සහල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පූර්ව අධ්‍යයන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

- අධ්‍යක්ෂවරිය ලෝක ආහාර අරමුදල මගින් මූල්‍යාධාර සැපයූ පශ්චාත් අස්වනු ව්‍යාපෘතියේ ජාතික මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ලදී.

- 2011.01.10 දින කොළඹ පැවති ලෝක ආහාර වැඩසටහනේ රැස්වීමට අධ්‍යක්ෂවරයා සහභාගී විය.

- 2011.01.13 දින CARPහි පැවති ජාතික පශ්චාත් අස්වනු කමිටු රැස්වීමේ සාමාජිකයෙකු ලෙස අධ්‍යක්ෂවරිය සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය සහ කාර්ය මණ්ඩලය 2011.01.31 දින සූරියවැව පැවති ප්ලාස්ටික් කුඩ බෙදා දීමේ වැඩසටහනට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය සහ කාර්ය මණ්ඩලය 2011.02.01 දින වැල්ලවායේ පැවති ප්ලාස්ටික් කුඩ බෙදා දීමේ වැඩසටහනට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය 2011.02.22 දින අමාත්‍යාංශයේ පැවති සහල් ආශ්‍රිත නිෂ්පාදන ජනප්‍රිය කිරීමේ රැස්වීමට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය 2011.02.02 දින මාකොළ බේකරියේ පැවති සහල් ආශ්‍රිත නිෂ්පාදන ජනප්‍රිය කිරීමේ වැඩසටහනට උපදේශකවරයෙකු ලෙස සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය 2011.02.03 දින අරලියගහ මන්දිරයේදී ප්ලාස්ටික් කුඩ සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය CARPහි 2011.03.10 දින පැවති ජාතික පශ්චාත් අස්වනු කමිටු රැස්වීමට කමිටු සාමාජිකයෙකු ලෙස සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය අලුතින් බඳවා ගත් කෘෂිකර්ම නිලධාරින් සඳහා කල් තබා ගත හැකි බෝගවල පශ්චාත් අස්වනු හානිය පිළිබඳ දේශනයක් 2011.03.22 දින මඩකලපුවේදී පවත්වන ලදී.

- අධ්‍යක්ෂවරිය අලුතින් බඳවා ගත් කෘෂිකර්ම නිලධාරින් සඳහා කල් තබා ගත හැකි බෝගවල පශ්චාත් අස්වනු හානිය පිළිබඳ දේශනයක් 2011.03.31 දින ත්‍රිකුණාමලයේදී පවත්වන ලදී.

- අධ්‍යක්ෂවරිය 2011.04.08 දින ස්වාධීන රූපවාහිනියේ "රන් අටුව" වැඩසටහනින් ප්ලාස්ටික් කුඩ භාවිතය පිළිබඳ වැඩසටහනකට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරිවරයා 2011.04.27 වැනි දින ට්‍රාන්ස් ඒෂියා හෝටලයේ පැවති පෝෂණය පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වූහ.

- අධ්‍යක්ෂවරිය 2011.05.17 වැනි දින නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ පැවති දන්සල විවෘත කිරීම සඳහා සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කළ 2011.05.20 වැනි දින ගල්කිස්ස මහ හෝටලයේ පැවති ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය වෙළඳ අමාත්‍යාංශයේදී පැවති ප්ලාස්ටික් කුඩ හඳුන්වාදීමේ රැස්වීමට 2011.05.23 දින සහභාගී විය.

- අධ්‍යක්ෂවරිය 2011.05.23 දින CARPහි පැවති ජාතික පශ්චාත් අස්වනු කමිටු රැස්වීමට කමිටු සාමාජිකයෙක් ලෙස සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.06.17 දින කොළඹදී පැවති ලෝක ආහාර වැඩසටහනේ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කළ 2011.06.21 වැනි දින කොළඹ ගලදාරි හෝටලයේ පැවති ආහාර සුරක්ෂිතතා පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.07.04 දින HARTIහි පැවති කෘෂිකර්ම ප්‍රතිපත්ති පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරියෙකු පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.07.27 දින දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේදී පැවති ප්ලාස්ටික් කුඩ පිළිබඳ රැස්වීමට සහභාගි වූහ.

- අධ්‍යක්ෂවරිය 2011.06.17 දින ලෝක ආහාර වැඩසටහනේ නිලධාරීන් සමඟ ගන්නෝරුව PGRC හිදී රැස්වීමකට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.08.09 වැනි දින වෙළඳ අමාත්‍යාංශයේ පැවති ප්ලාස්ටික් කුඩ හඳුන්වා දීමේ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.08.12 දින පේරාදෙණියේ ජෛව තාක්ෂණික මධ්‍යස්ථානයේදී ජාන වෙනස් කරන ලද ආහාරවල ජෛව තාක්ෂණය පිළිබඳ වැඩමුළුවකට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.08.17 වැනි දින නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයෙහිදී පැවති ප්ලාස්ටික් කුඩ පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරයා පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.08.18 වැනි දින මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙහිදී පැවති ප්ලාස්ටික් කුඩ පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සංවිධානය කළ 2011.08.22 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි පැවති ජාතික රාමුව පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරියෙකු පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.08.23 දින වැලිසර ආර්ථික මධ්‍යස්ථානයෙහි පැවති ප්ලාස්ටික කුඩ පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරයා 2011.08.25 වැනි දින BMICHහිදී පැවති CARP තිලිණ ප්‍රධානෝත්සවයට සහභාගි විය.

- අධ්‍යක්ෂවරයා වයඹ විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කළ 2012.09.03 වැනි දින පැවති කෘෂිකර්ම වැඩමුළුවේදී සහල් පශ්චාත් අස්වනු තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ දේශනයක් පවත්වන ලදී.

- අධ්‍යක්ෂවරිය පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.09.05 වැනි දින පිළියන්දල ආර්ථික මධ්‍යස්ථානයෙහිදී පැවති ප්ලාස්ටික් කූඩ පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය පාරිභෝගික අධිකාරිය මගින් සංවිධානය කළ 2011.09.06 වැනි දින ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයෙහිදී පැවති ප්ලාස්ටික් කූඩ පිළිබඳ රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.09.19 වැනි දින මාතර ශ්‍රීලන් කම්හලෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

- අධ්‍යක්ෂවරිය 2011.09.15 වැනි දින ගන්නෝරුව PGRCහිදී ASDA රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.09.31 වැනි දින පේරාදෙණියේදී ජෛව තාක්ෂණ සම්මන්ත්‍රණයකට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය 2011.10.18 වැනි දින ගන්නෝරුවේදී පැවති ලෝක ආහාර වැඩසටහනෙහි රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය සහ කාර්ය මණ්ඩලය කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සංවිධානය කළ 2011.10.29 - 2011.10.30 දක්වා ගන්නෝරුව සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේදී පැවති ප්‍රසම්පාදන කාර්යපටිපාටි පිළිබඳ රැස්වීමට සහභාගි වූහ.

- අධ්‍යක්ෂවරිය NSF මගින් සංවිධානය කළ 2011.11.02 – 03 දක්වා කොළඹ ගලදාරි හෝටලයේ පැවති ජාතික නව්‍යකරණ පද්ධති පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය2011.04.11 දින ජාතික පශ්චාත් අස්වනු කමිටු රැස්වීමට සහභාගි විය.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරීන් 2011.11.16 දින අමාත්‍යාංශයේදී පැවති ඒකාබද්ධ සැලැස්ම සකස් කිරීමේ අවසාන රැස්වීමට සහභාගි වූහ.

- අධ්‍යක්ෂවරිය 2011.11.17 දින PGIA සංගමයේ පර්යේෂණ රැස්වීමට සහභාගි වූ අතර තාක්ෂණික සැසිවාරවලදී විනිසුරුවරයෙකු ලෙස කටයුතු කරන ලදී.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරීන් සහ ඉංජිනේරුවරුන් ජාතික පශ්චාත් අස්වනු කමිටුව CARP මගින් සංවිධානය කළ 2011.11.23 දින HARTIහි පැවති පළතුරු ඉදවීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි වූහ.

- සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරිය 2011.12.01 වන දින පාර්ලිමේන්තු අය වැය රැස්වීමට සහභාගි වූහ.

- අධ්‍යක්ෂවරිය සහ පර්යේෂණ නිලධාරීන් 2011.12.17 වැනි දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ ගන්නෝරුවේදී පැවති "ප්ලාස්ටික් අසුරනයන්හි නව ක්ෂේත්‍ර අත්හදා බැලීම් ක්‍රියාත්මක කිරීම" පිළිබඳ රැස්වීමට සහභාගි වූහ.

## 11. පර්යේෂණ හා පුහුණු / ව්‍යාප්ති සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම

1. නේවාසිකාගාරයෙහි මුළුතැන් ගෙය බිම් උළු අතුරා "පැන්ට්‍රි කබඩ්" සවි කර අළුත්වැඩියා කිරීම.
2. නූඩ්ල්ස් කර්මාන්තශාලාවේ කොන්ක්‍රීට් වහලය අළුත්වැඩියා කිරීම.
3. අංක 06 දරන රාජකාරි නිල නිවසෙහි ජල ටැංකියක් ඉදි කිරීම.
4. නුවරඑළිය ක්ෂේත්‍ර මධ්‍යස්ථානයෙහි දැන්වීම් පුවරුවක් සවි කිරීම.
5. තත්ත්ව පාලන, ආහාර රසායන විද්‍යා සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාව සඳහා රසායනාගාර සඳහා පහත උපකරණ ලබා දීම.

| | | |
|---|---|---|
| i. | පිටි මිශ්‍ර කරන උපකරණ | 01 |
| ii | මිශ්‍ර කිරීමේ යන්ත්‍රසූත්‍ර | 01 |
| iii | ඉදිආප්ප සෑදීමේ උපකරණ | 01 |

6. කාර්යාල උපකරණ මිලදී ගැනීම.
7. පරිගණක මේස 2ක් මිලදී ගැනීම
8. මහනුවර ක්ෂේත්‍ර මධ්‍යස්ථානය සඳහ නාම පුවරුවක් සවි කිරීම.
9. ලේසර් ප්‍රින්ටරයක් මිලදී ගැනීම.
10. නිල නිවාස 4ක් සඳහා පොදු ගරාජයක් ඉදි කිරීම.
11. අංක 08 දරන නිල නිවස අළුත්වැඩියා කිරීම.
12. අධ්‍යක්ෂවරියගේ නිල නිවස සඳහා බිත්ති පංකාවක් මිලදී ගැනීම.
13. ආරක්ෂක කුටිය සඳහා දුරකථනයක් මිලදී ගැනීම.
14. පැරණි පුස්තකාල අංශයෙහි කාමර වෙන් කිරීම.
15. අංක 01 දරන නිල නිවස අළුත්වැඩියා කිරීම.
16. හානියට පත් වූ අඩි 135ක තාප්පය නැවත ඉදි කිරීම.

## 12. ප.අ.පි.තා.ආ.යේ කාර්ය මණ්ඩලයේ වෘත්තිය සංවර්ධනය

2011 වර්ෂය තුළදී ප.අ.පි.තා.ආ.යේ පර්යේෂණ සහ පුහුණු කාර්ය මණ්ඩලයේ පහත නම් සඳහන් නිලධාරින් පශ්චාත් අස්වනු තාක්ෂණ හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා ඇත.

අ) **පශ්චාත් උපාධි වැඩසටහන්**

| | |
|---|---|
| 1) ඩබ්ලිව්.ඒ.එච්. චම්පා මිය<br>පර්යේෂණ නිලධාරි | උද්‍යාන විද්‍යා ආචාර්ය උපාධිය<br>පන්ජාබ් කෘෂි කාර්මිකවිශ්වවිද්‍යාලය<br>ලුධියානා, පන්ජාබය 2011.01.11 -2014.01.11 |
| 2) පී.ජී.එල්. වසන්ත මහතා | පශ්චාත් අස්වනු තාක්ෂණ විද්‍යාපති උපාධිය<br>තායිලන්තය<br>2011 අප්‍රේල් සිට 2013 මාර්තු |

ආ) **කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

| | |
|---|---|
| 1) ආර්.එම්.ආර්.එන්.කේ.රත්නායක මහත්මිය පර්යේෂණ නිලධාරි | ආසියා පැසිෆික් කලාපයේ ආරක්ෂාකාරි, තරගකාරි උද්‍යාන විද්‍යා දාම ගොඩ නැගීම, ක්ෂේත්‍රය - පළතුරු සහ එළවළු- පකිස්ථානය 2011.03.07 – 2011.03.12 |
| 2) පී. ජනක සුභසිංහ මහතා<br>පරිපාලන නිලධාරි | ආහාර සුරක්ෂිතතාව: තෝරාගත් කෘෂි-කර්මාන්ත නිෂ්පාදනයන්හි පශ්චාත් අස්වනු සහ තත්ත්ව සහතික - තායිලන්තය 2011 ජුනි 01 සිට 30 දක්වා |
| 3) බී.ඩී.එම්.පී. බණ්ඩාර මහතා<br>යාන්ත්‍රික ඉංජිනේරු | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ආහාර කළමනාකරණය, චීනය, 2011.06.23 සිට 2011.07.20 |
| 4) එන්.එච්.එම්. සුමිත්‍රා මිය<br>ක්ෂේත්‍ර නිලධාරි | කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම පිළිබඳ නව තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ අන්තර්ජාතික පාඨමාලාව - චීනය. 2011.04.06 – 2011.04.25 |
| 5) එම්.එම්. හේරත් මහතා<br>ව්‍යාප්ති නිලධාරි | පළතුරු සහ එළවළු පිළිබඳ පශ්චාත් අස්වනු තාක්ෂණ අන්තර්ජාතික පුහුණුව - ඉන්දුනීසියාව, 2011.04.07 – 2011.04 21 දක්වා |

## 13. 2011. 12.31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය

| තනතුර | නම |
|---|---|
| වැඩබලන අධ්‍යක්ෂ | ආචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මිය<br>BSc.Sp.(Agric. Food Sci.& Tech.) Sri Lanka,<br>MSc.(Food Sci.& Tech.), Sri Lanka<br>PhD.( Postharvest Tech. Horticulture), India<br>Dip.in rice sciences(China)<br>Dip.in Post harvest biologyof fruit and veg.(Israel) |
| වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ සංවර්ධන) | ඩී.පී.සී. ස්වර්ණසිරි මයා<br>BSc. (Agric), Sri Lanka<br>Dip. in Agric.(China)<br>MSc. (Agric), Sri Lanka<br>PGDM, Sri Lanka |
| ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු | ඩී.පී. සේනානායක මිය<br>B.Sc. Mech. Eng.  (Sri Lanka)<br>M. Phil.Chem. Eng (Sri Lanka) |
| වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන සහ මූල්‍ය) සහ ගණකාධිකාරි | ආර්.කේ.ජ්.පී. රාමනායක මයා<br>B.Sc. Management (Sri Lanka), Licentiate Certificate ICA, MIPFDA |
| වැඩබලනජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු | එච්.එම්.ජ්.පී. රත්නායක මයා<br>BSc. (Eng.), Sri Lanka |

| | |
|---|---|
| | M.Tech (Agric. Process Eng.), india |
| වැඩබලන ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි | ආචාර්ය ඩී.එම්.සී.සී ගුණතිලක මයා |
| | BSc.Sp.(Agric.Eng), Sri Lanka |
| | MSc. (Agric. Eng.), Sri Lanka |
| | PhD. (Process & Food Eng.), India |
| | NDT (Agric), Sri Lanka, ASAE (USA) |
| පර්යේෂණ නිලධාරි | ඩබ්ලිව්.ඒ.එච්. චම්පා මිය |
| | BSc. Sp. (Horticulture), Sri Lanka |
| | M.Phil (Crop Sci.), Sri Lanka |
| පර්යේෂණ නිලධාරි | ඩබ්ලිව්.එම්.සී.බී. වාසල මයා |
| | B.Sc. Sp. Agric. ( Sri Lanka) |
| යාන්ත්‍රික ඉංජිනේරු | බී.ඩී.එම්.පී. බණ්ඩාර දිසානායක මයා |
| | BSc. (Eng.) Sri Lanka, |
| | M.Eng.(Processing & Food Eng.) India, AMIE(Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | කේ.ජී.එල්.ආර්. ජයතුංග මිය |
| | B.Sc. Sp. Agric. ( Sri Lanka) |
| | M.Phill. Food Sci.& Tech. ( Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | ආර්.එම්.ආර්.එන්.කේ. රත්නායක මිය |
| | BSc.Sp. (Botany),Sri Lanka |
| | MSc. (Postharvest Tech. of Fruit & Vegetables), Sri Lanka |
| පර්යේෂණ නිලධාරි | සී.ආර්. ගුණවර්ධන මයා |
| | B.Sc. Special Chemistry (Sri Lanka) |
| පර්යේෂණ නිලධාරි | ආචාර්ය ආර්.එම්.එන්.ඒ. විජේවර්ධන මිය |

| | |
|---|---|
| | BSc. (Agric.) Sri Lanka, |
| | MSc. (Agric.) Sri Lanka, |
| | PhD. (Horticulture postharvest Technology), India |
| පර්යේෂණ නිලධාරි | එච්.එස්. ජයවර්ධන මිය |
| | BSc. (Applied Sci.), Sri Lanka. |
| | MSc. (Food Sci. & Tech.) |
| යාන්ත්‍රික ඉංජිනේරු | ටී.එම්.ආර්. දිසානායක මයා |
| | BSc. (Eng.), Sri Lanka |
| | MEng.(India), AMIE (Sri Lanka) |
| ව්‍යාප්ති නිලධාරි | පී.ජී. ලලිත් වසන්ත මයා |
| | B.Sc. Sp.Agric. ( Sri Lanka) |
| ව්‍යාප්ති නිලධාරි | සී.ඒ.කේ. දිසානායක මිය |
| | B.Sc.Sp. Agric. (Sri Lanka) |
| | PGDipl. Agric.(Sri Lanka) |
| යාන්ත්‍රික ඉංජිනේරු | ඩී.එම්. ශ්‍රීමා ප්‍රියංගිකා බණ්ඩාර මිය |
| | B.Sc. Chem. Eng.(Sri Lanka), |
| | MEng Manf. Syst. Eng (Sri Lanka) |
| ව්‍යාප්ති නිලධාරි | එම්.එම්. හේරත් මයා |
| | B.Sc Sp. Agric. ( Sri Lanka), Dip. in Counselling |
| පර්යේෂණ නිලධාරි | යූ.ජී. චන්ද්‍රජිත් මයා |
| | B.Sc.(Sp.)Botany |
| | MSc.Food Sc.& Tech. |
| පරිපාලන නිලධාරි | ඩී. ඉලංගරත්න මයා |

| | |
|---|---|
| රසායනාගාර තාක්ෂණවේදී | පී.ර්.එම්.ආර්. පලිපාන මයා |
| සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර | එච්.ඩී.කේ.ඩී. වික්‍රමසිංහ මිය |

**සහායක කාර්ය මණ්ඩලය:**

| | |
|---|---|
| කාර්මික නිලධාරි | 01 |
| සැලසුම්කරු | 01 |
| ගොඩනැගිලි පරීක්ෂක | 01 |
| කළමනාකරණ සහකාර (ලඝුලේඛක/යතුරු ලේඛක) | 01 |
| කළමනාකරණ සහකාර (සිංහල/ ඉංග්‍රීසි යතුරු ලේඛක) | 03 |
| ක්ෂේත්‍ර නිලධාරි | 03 |
| රසායනාගාර සහායක | 03 |
| කළමනාකාර සහායක | 08 |
| නේවාසිකාගාර භාරකරු | 01 |
| සහල් මෝල් ක්‍රියාකරු | 02 |
| බොයිලේරු ක්‍රියාකාරු | 02 |
| විදුලි කාර්මික | 01 |
| වැද්දුම්කරු | 01 |
| රියදුරු | 08 |
| වැඩපොළ ක්‍රියාකරු | 01 |
| නඩත්තු සහායක | |
| කාර්මික ශිල්පි | 05 |
| සූපවේදී | 01 |
| ආරක්ෂක නියාමක | 01 |
| රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 06 |

| | |
|---|---|
| ආපනශාලා කම්කරු | 01 |
| සේවා සහායක | 01 |
| සනීපාරක්ෂක කම්කරු | 01 |
| | 01 |

# විගණන කමිටු වාර්තාව – 2011

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ විගණන කමිටුව පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| | |
|---|---|
| සුමනා යාපා මහත්මිය | - ප.අ.පි.තා.ආ. යේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (භාණ්ඩාගාර නියෝජිත) විගණන කමිටුවේ සභාපති |
| ගුණරත්න ගාල්ලගේ මහතා | - උප සභාපති - ප.අ.පි.තා.ආ. |
| අචාර්ය බී.එම්.කේ.එස්. තිලකරත්න මහත්මිය | - වැ.බ. අධ්‍යක්ෂ – ප.අ.පි.තා.ආ. |
| ආර්.කේ.ඒ.පී. රාමනායක මහතා | - වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරි. සහ මූල්‍ය)/ගණකාධිකාරී – ප.අ.පි.තා.ආ. |
| ආර්.එම්.ඩී. රත්නායක මහතා | - අභ්‍යන්තර විගණක - ප.අ.පි.තා.ආ. විගණන කමිටුවේ කැඳවුම්කරු |

අදාල වර්ෂයේදී පහත දක්වා ඇති දිනවලදි රැස්වීම් තුනක් පැවැත්විණි,

2011 මැයි මස 25 වැනි දින

2011 ඔක්තෝබර් මස 06 වැනි දින

2011 දෙසැම්බර් මස 22 වැනි දින

මෙම රැස්වීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයින් ලෙස සහභාගී වූහ. ආයතනයේ අභ්‍යන්තර විගණකවරයා මෙන්ම රජයේ විගණක නිලධාරීන් විසින්ද ඔවුන්ගේ විගණන විමසුම් සහ වාර්තා වලින් පෙන්වා දී තිබූ පද්ධති දූර්වලතා සහ කළමනාකරණ දූර්වලතා පිළිබඳව කමිටුව සමාලෝචනය කරන ලදී. එම දූර්වලතා සහ අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා නිර්දේශයන් සහ යෝජනා ලබා දීමටත් එම නිර්දේශ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පසු විපරම් සිදු කිරීමටත් පියවර ගනු ලැබිණි.

කමිටුව සිය අවධානය යොමු කල කරුණු සම්බන්ධයෙන්, පවතින පරිපාලන පද්ධති සහ ප්‍රතිපත්ති ඇගයීම පදනම් කරගත් වඩාත් ඵලදායී පරිපාලන පද්ධතියක් පිහිටුවීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය මඟපෙන්වීම සහ නිර්දේශයන් ලබා දීමට පියවර ගන්නා ලදී.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුලදී පහත සඳහන් ක්ෂේත්‍ර සහ පද්ධති වල කළමනාකරණ සම්බන්ධයෙන් කමිටුව සිය විශේෂ අවධානය යොමු කරන ලදී.

- සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන කාර්යසාධනය.

- ස්ථාවර වත්කම් කළමනාකරණය, අනුරාධපුර මධ්‍යස්ථානයෙහි ස්ථාවර වත්කම් අංකනය කිරීමේ ක්‍රියාපටිපාටිය අධීක්ෂණය කිරීම සහ වාර්ෂික තොග සමීක්ෂණය, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ඉටුකිරීම.

- වී අළෙවි මණ්ඩලයෙන් පවරන කරන ලද වත්කම් තක්සේරු කිරීමෙන් පසු ගිණුම්ගත කිරීමේ ක්‍රියාපටිපාටිය.

- පර්යේෂණ මාර්ගෝපදේශයන් හඳුන්වාදීම තුලින් පර්යේෂණ ක්‍රියාවට නැංවීමට විධිමත් කිරීම

- දීර්ඝ කාලයක සිට හිඟව පවතින ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ලබාදීම.

- උපදේශන ක්‍රියාවලිය විධිමත් කිරීම පිණිස මාර්ගෝපදේශ සකස් කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවීම.

- පර්යේෂණ සහ පුහුණු සහ ව්‍යාප්ති අංශයන් අතර වඩාත් හොඳ සම්බන්ධීකරණයක් ඇති කරලීමේ අවශතාව සහ ගත යුතු පියවර සම්බන්ධයෙන් සහ ආයතනය මඟින් හඳුන්වා දුන් තාක්ෂණික ක්‍රමවේද ඒකාකාර ලෙස ක්ෂේත්‍රයට ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරවීම.

- බාහිර ආයතන සමඟ සහයෝගීත්වයෙන් මෙහෙයවන ලද ව්‍යාපෘති විධිමත්ව ක්‍රියාවට නැංවීම.

- ආයතනයේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම.

- ආයතනයේ මූල්‍ය සහ පරිපාලන අංශයන්හි කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීමේ සැලසුම් සහ ප්‍රතිපත්ති කෙටුම්පත් සකස් කිරීම.

- ලේඛනාගාරය වැඩිදියුණු කිරීම සහ පාලන පද්ධති හඳුන්වා දීම.

- විනය ක්‍රියාමාර්ග විධිමත්ව යොදා ගැනීම

විගණන කමිටුව වෙනුවෙන්,

සුමනා යාපා
සභාපති,
විගණන කමිටුව,
පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය,
කොළඹ.

2012.07.31

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / துலைவா / My No - එන්සී/ඒපී/ඊ/2012/28

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date - 2012 නොවැම්බර් 16 දින

සභාපති,

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය.

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ සභාපති වෙත 2012 අගෝස්තු 15 දින නිකුත් කරන ලදි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone - 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. - 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. - oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 උසස් ගිණුම්කරන පරිචයන්

සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනයට ගෙන තිබුණු පිරිවැය රු.31,831,759 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 07 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පුහුණු පාඨමාලා ආදායම් සහ නේවාසිකාගාර ගාස්තු ආදායම් යනාදිය මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් විය.

(අ) අයිතම 02 කට අදාල වියදම් රු.194,006 කින් වැඩියෙන්ද, අයිතම 06 කට අදාල වියදම් රු.189,925 කින් අඩුවෙන්ද අයිතම 02 කට අදාල ආදායම් රු.230,662 කින් අඩුවෙන්ද රු.158,677 ක් ආදායම් වැඩියෙන්ද අයිතම 02 කට අදාල වත්කම් රු.73,852 කින් අඩුවෙන්ද උපචිත පොළී ආදායම රු3,206 කින් වැඩියෙන්ද, ණයහිමියන් රු.68,100 කින් අඩුවෙන්ද පොළී ආදායම් මත උපචිත රඳවා ගැනීමේ බදු රු.24,258 කින් වැඩියෙන් ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් විෂයයන් 05 ක් අත්පත් කර ගැනීම සඳහා දරා තිබුණු රු.1,294,640 ක් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් වශයෙන් අනුචිතව දක්වා තිබුණි.

2.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් ලැබිය යුතු ශේෂයන් විය.

(අ) ලැබිය යුතු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කෙරෙන වර්ෂ 15 කට වඩා පැරණි රු.1,484,985 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියා මාර්ගයන් ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන වල අවිනිශ්චිත ගිණුම - පොදු ලෙස අනාවරණය කර තිබුණු වර්ෂ 09 කට වඩා අධික කාලයක සිට පැවති විවිධ පාර්ශවයන්ගෙන් අය කර ගත යුතු රු.219,376 ක ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සුභ සාධක සමිතියෙන් අයකර ගත යුතු, වර්ෂ 05 කට වඩා පැරණි රු.59,551 ක ශේෂය අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේදීද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2006 හා 2010 වර්ෂවලදී ආයතනයේ සේවකයින් දෙදෙනෙකු වෙත ලබාදී තිබුණු නුඩ්ල්ස් හා ප්ලාස්ටික් ඇසුරුම්වල රු.14,925 ක් වූ වටිනාකම සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

(ඊ) වර්ෂ 04 කට වඩා පැරණි රු.177,961 ක් වූ ණයගැති ශේෂයන් සමාලෝචිත වර්ෂයේදීද අයකර ගෙන නොතිබුණි.

(උ) වර්ෂයකට අධික කාලයක සිට පැවති විවිධ පාර්ශවයන්ට ගෙවිය යුතු රු. 157,176 ක්ද රඳවා ගැනීම් මුදල් රු.2,203,699 ක්ද, ටෙන්ඩර් ඇප තැන්පත් රු.133,600 ක්ද සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් නොවී පැවතුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

ණයගැති ලේඛනය, ණයහිමි ලේඛනය, විස්තරාත්මක උපලේඛන සහ ශේෂ සනාථ කිරීම් යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් රු.11,596,741 ක් වූ වත්කම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2.2.7 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2011 මාර්තු 07 දිනැති දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක IRD/PAYE/Reg /01 දරන උපදෙස් මාලාව | උපයන විට ගෙවීමේ බද්දට යටත් නිලධාරින්ගේ වැටුපෙන් 2011 අප්‍රේල් මස සිට අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වූ, රු.32,386 ක් වූ උපයන විට ගෙවීමේ බදු ආයතනය විසින් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 13.5 වගන්තිය | ලබා ගෙන වාරික 10 කින් ගෙවා නිමකළයුතු රු.31,594 ක උත්සව අත්තිකාරම් ශේෂයක් වර්ෂ 01 සිට 11 දක්වා කාලයකදී අය නොවී පැවතුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයි.ඒ.අයි/2002/02 | ආයතනය සතු පිරිවැය රු.5,311,171 ක් වූ පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2.2.8 දෘෂ්‍ය අක්‍රමිකතා /අවිධිමත් ගණුදෙනු

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිරිවැය රු.11,450 ක් වූ කුබෝටා අත්ට්‍රැක්ටරයක් ආයතනය තුළ භෞතිකව දක්නට නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් රු.16,726,883 ක ඌණතාවයක් ඇතිව තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.6,584,695 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.10,142,188 ක පිරිහීම සඳහා, ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය, ගංවතුර හානි ලෙස කපා හැරීම්, "අපි වවමු රට නගමු" ව්‍යාපෘතියේ ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම යන කරුණු විශේෂයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ එකතුව රු.72,683,130 ක් වූ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු මුදල ඇතුළු ආදායමින් වර්ෂයේ වියදම් දැරීමෙන් පසු අතිරික්තය රු.4,633,242 ක් විය. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ එකතුව රු.54,930,693 ක් වූ භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු මුදල ඇතුළු ආදායමින් වියදම් දැරීමෙන් පසු අතිරික්තය රු.2,158,996 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය සහ පාර්තෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය, ගංවතුරින් සිදු වූ තොග හානි සහ " අපි වවමු රට නගමු" ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු අක් මුදලට වැඩියෙන් දරා තිබුණු වියදම ඇතුළු රු.18,358,305 ක් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය වැඩි වීමට හේතු වී තිබුණි. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපාදනය සහ පාර්තෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය ඇතුළු රු.7,132,010 ක් ලියා හැරීම ඉකුත් වර්ෂයේ ඌණතාවයට හේතු වී තිබුණි.

3.3 මූල්‍ය පාලනය

---------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ප්ලාස්ටික් ඇසුරුම් අලෙවියෙන් ලැබෙන මුදල් කෘෂිකර්ම අමාත්‍යාංශයට ප්‍රේෂණය කළයුතු වුවද වර්ෂ කිහිපයක සිට ප්ලාස්ටික් ඇසුරුම් අලෙවියෙන් ලද රු.36,772,290 ක් අමාත්‍යාංශයට ප්‍රේෂණය නොකර රඳවා තබාගෙන තිබුණි.

(ආ) බැංකු ගිණුමට බැර කෙරෙන සෘජු ප්‍රේෂණ හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ පාලන ක්‍රියාවලියේ පැවති දුර්වලතාවය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසය දක්වා වූ එකතු වටිනාකම රු.247,560 ක් වූ සෘජු ප්‍රේෂණ හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් විය.

(අ) එළවළු හා පළතුරු ප්‍රවාහනයේදී ප්ලාස්ටික් ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන ආරම්භ කර අවුරුදු 06 ක් ගත වී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිකුත් කර ඇති ඇසුරුම් ප්‍රමාණය 161,314 ක් වූ අතර, එය අපේක්ෂිත ඉලක්කයෙන් 40% කට වඩා අඩු මට්ටමක පැවතුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයේ 6,323,105 ක් වූ වර්ග 04 කට අයත් ඇසුරුම් උපකරණ 12,067 ක් බෙදා නොහැර ඉතිරි තොග වශයෙන් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ අලෙවිය සඳහා රු.1,628,970 ක් වූ නූඩ්ල්ස් කි.ග්‍රෑම් 8409 ක් ගබඩාවේ පැවති අතර, ඉන් රු.1,163,506 ක් වූ කි.ග්‍රෑ. 6006 ක තොගයක් ගංවතුර හානි ලෙස රු.120,721 ක මුදලකට අලෙවි කර තිබුණි. වර්ෂය තුල රු1,550,507 ක් වටිනා නූඩ්ල්ස් නිෂ්පාදනය කර තිබුණු නමුත් වර්ෂය අවසානයේදී ඉන් 54% ක් වූ රු.837,829 ක් වටිනා නූඩ්ල්ස් තොග ගබඩාවේ ඉතිරි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී නූඩ්ල්ස් අලෙවි ආදායමද 52% කින් පහත වැටී තිබුණි.

(ඇ) කෙටි කාලීන බෝග වගාවෙන් වර්ෂයකට රු.589,000 ක අපේක්ෂිත ආදායමක් සහිතව 'අපි වවමු රට නගමු' තේමාව යටතේ 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණු ආයතනය සතු අක්කර 06 ක පමණ භූමිය වගා කිරීමේ ව්‍යාපෘතිය අධික නඩත්තු වියදම, නිසි පාලනයක් නොමැති වීම හා අපේක්ෂිත ආදායම් ලබාගත නොහැකි වීම මත අඛණ්ඩව අලාභ ලබමින් ක්‍රියාත්මක වන අතර සමාලෝචිත වර්ෂයේදී ලබා තිබුණු ආදායම රු.84,719 ක් විය.

(ඈ) ආයතනය ආරම්භයේ සිටම විවිධ පර්යේෂණ ව්‍යාපෘති යටතේ නිර්මාණය කරන ලද විශාල ප්‍රමාණයේ සියඹලා පල්ප යන්ත්‍රය, බඩඉරිඟු ඇට ගලවන විශාල ප්‍රමාණයේ යන්ත්‍රය, ධාන්‍ය ඇට පියලි කිරීමේ ග්‍රේඩරය යනාදී 20 ට අධික යන්ත්‍ර සූත්‍ර වලින් බහුතරයක් තවමත් ප්‍රදර්ශන තත්ත්වයේම පවතින බව නිරීක්ෂණය වූ අතර, ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමට සහ නිර්මාණ අයිතියෙහි සුරක්ෂිත භාවය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම පර්යේෂණ වල ප්‍රතිඵල ඉලක්කගත පාර්ශවයන්ට ලබාදීමට සහ වෙළෙඳපල හඳුනාගෙන අදාල තාක්ෂණයන් ප්‍රචලිත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. ආයතනය විසින් පර්යේෂණ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර අනුමත කරගෙන ඇති මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන මහින් පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා විධිමත් සහ වඩාත් ඵලදායි වූ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ පශ්චාත් අස්වැන්නට සිදුවන හානිය අවම වන ලෙස ප්‍රවාහනය හා ගබඩා කිරීම සම්බන්ධයෙන් ඵලදායිතාවයෙන් වැඩි ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව නිශ්චිත කාල රාමුවක් ආයතනය තුල අනුමත වී ඇතත්, අදාල කාල රාමුව පිළිබඳ නොසලකා කටයුතු කිරීම හේතුවෙන් 2011 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණ පර්යේෂණ ව්‍යාපෘති 04 ක් නිසි කලට අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

iii. 2011 වර්ෂයේදී නිම කිරීමට යෝජිත වූ 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 21 කින් ව්‍යාපෘති 04 ක් 2011 දෙසැම්බර් 31 දින වන විටද නිම කර නොතිබුණු අතර, ව්‍යාපෘති 02 ක් 2011 වර්ෂයේදී අත්හැර දමා තිබුණි. එසේම "ලොකු ළූණු නිෂ්පාදනයේ පසු අස්වනු තාක්ෂණ ක්‍රමෝපායන් දියුණු කිරීම සඳහා වූ පර්යේෂණ" වාර්තාව නිකුත් කර තිබුණද, එයට අදාල අත්‍යවශ්‍ය ගබඩා පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

(ඊ) සංවර්ධන ව්‍යාපෘති

---

දිස්ත්‍රික් 07 ක ගොවි මහතුන් 120 කු දැනුවත් කිරීම හා පුහුණු කිරීම සිදු කර ජංගම වෙළෙඳ කුටි 15 ක් බෙදාදීම අරමුණු කරගෙන "අපි වවමු රට නගමු" ජාතික මෙහෙයුම යටතේ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද එළවළු හා පළතුරු අලෙවිය සඳහා ජංගම වෙළෙඳ කුටි හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් වෙළෙඳ කුටි 10 ක් පමණක් ලබාදී තිබුණු අතර ප්‍රතිලාභින් සියලු දෙනාම මහනුවර දිස්ත්‍රික්කයෙන් පමණක් තෝරා ගෙන තිබුණි. එසේම 2011 වර්ෂයේදී අවසන් කළයුතු වූ ව්‍යාපෘතිය 2012 මැයි 21 වන විටද අවසන් කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියමිත දිනයන් හිදී වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර අළුත් නොකිරීම මත රු.4,800 ක් ආයතනය විසින් ප්‍රමාද දඩ වශයෙන් ගෙවා තිබුණි. එසේ වුවද, ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල් රෙගුලාසි 210(2) ප්‍රකාරව එකී මුදල අයකර ගෙන නොතිබුණි.

(ආ) අති විශේෂ අයිතමයක් වශයෙන් 2011 වර්ෂයේදී ගංවතුරෙන් වූ හානි ලෙස රු.2,390,645 ක් කපා හැර තිබුණු අතර, ඒ තුළ වර්ෂ කිහිපයක සිට භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවති රු.569,530 ක් වූ සහල් පැකට් තොගයක් ද විය.

4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

---

ආයතනය සතුව පැවති වටිනාකම රු.931,458 ක් වූ වාහන 06 ක් අවුරුදු 02 ත් 10 ත් අතර කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 153 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු පුරප්පාඩු 77 ක් පැවතුණි. දීර්ග කාලයක සිට පවතින මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ආයතනයේ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය මගින් හඳුනාගනු ලබන නව තාක්ෂණික ක්‍රමවේද ක්ෂේත්‍රයේ නිෂ්පාදකයන් සහ ව්‍යාපාරිකයන් අතර ප්‍රචලිත කිරීමේ කාර්යය සඳහා අනුරාධපුර පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සේවයට ආයතනය විසින් ව්‍යාප්ති නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් දෙදෙනෙකු යොදවා සමාලෝචිත වර්ෂයේදී රු.752,000 ක වැටුපක් ගෙවා තිබුණද, උක්ත නිලධාරීන්ගෙන් අපේක්ෂිත රාජකාරි ඉටු කර ගෙන ඇති බවට සාක්ෂි නොතිබුණි.

4.5 වාහන උපයෝජනය

කෘෂිකර්ම අමාත්‍යවරයාගේ රාජකාර් වෙනුවෙන් 2011 අගෝස්තු 01 දින සිට තාවකාලිකව අනුයුක්ත කර තිබුණු ආයතනය සතු මෝටර් රථයක් විගණිත දිනය වූ 2012 මැයි 29 දින වන විටද ආපසු ලබා ගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දින හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් කටයුතු පිළිබඳව සහ ඉදිරි වර්ෂ 05 ක ක්‍රියාකාරකම් එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් ඇතුලත් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාර් සැලැස්ම

ඉදිරිපත්කර තිබුණු ක්‍රියාකාර් සැලැස්මේ භෞතික ඉලක්කයන් දක්වා නොතිබීම නිසා සපුරාගෙන තිබුණු මූල්‍ය ඉලක්කයන් වලට ගැලපෙන භෞතික තථ්‍ය මට්ටම් කරා ළඟා වී තිබේ දැයි පරීක්ෂා කිරීමට නොහැකි වූ අතර, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්ම අනුව රුපියල් මිලියන 2.4252 ක් වෙන් කර තිබුණු සංවර්ධන ව්‍යාපෘතීන් 04 ක් සහ රු.352,800 ක් වෙන් කර තිබුණු ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම සහ එයට අදාල දෘෂ්‍යමාන සංයුක්ත තැටි සකස්කිරීම සිදු කර තිබුණු බවට සාක්ෂි නොවීය.

5.3 අභ්‍යන්තර විගණනය

ආයතනයේ විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර වාර්තා නිකුත් කර තිබුණද, එකී වාර්තා කිරීම් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් උචිත ප්‍රතිචාර දක්වා නොතිබීමෙන් අභ්‍යන්තර විගණනය සඵල පාලන උපක්‍රමයක් ලෙස භාවිතයට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.4 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දිනැති අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව යටත් පිරිසෙයින් මාස 03 කට වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, 2011 වර්ෂයේදී පවත්වා තිබුණු රැස්වීම් ගණන 03 ක් පමණ වූ අතර, 2009 හා 2010 වර්ෂවලදී ද චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ආයතනය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

5.6 අයවැය පාලනය

------------------

අයවැය ගත හා තථ්‍ය අගයන් අතර සියයට 31 සිට සියයට 6443 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ප්‍රමාණවත් පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5.7 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2008,2009 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2012 ජුනි 07 දින සභාගත කර තිබුණු නමුත් 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනය

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ගිණුම්කරණය
(ඇ) සේවක මණ්ඩල පාලනය හා අභ්‍යන්තර වැඩ බෙදීම.
(ඈ) ණයගැති හා ණයහිමි
(ඉ) පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඊ) වාහන පරිපාලනය

එච්.ඒ.එස්. සමරවීර,
විගණකාධිපති.

# පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය
# අවසාන ගිණුම්
# 2011

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 වැනි දිනෙන්
අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| | සටහන | 2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය රු. | 2010 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබූ අරමුදල් | 02 | 41,572,683.00 | 43,900,000.00 |
| වෙනත් ආයතන වලින් ලැබූ අරමුදල් | 03 | 21,768,268.36 | 1,624,951.70 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 04 | 9,342,179.36 | 9,405,745.94 |
| සහල් ආශ්‍රිත ආහාර නිෂ්පාදන දියුණු කිරීමේ කර්මාන්තශාලාව නූඩ්ල්ස් ලාභ/අලාභ ගිණුම | 05 | (527,103.93) | (1,501,994.79) |
| | | **72,156,026.79** | **53,428,702.85** |
| පරිපාලන සහ ආයතන වියදම් | 06 | 86,408,192.62 | 59,903,711.69 |
| **මූල්‍ය පිරිවැයට පෙර ශුද්ධ මෙහෙයුම් ආදායම** | 07 | **(14,252,165.83)** | **(6,475,008.84)** |
| මූල්‍ය වියදම් | 08 | (84,072.13) | (109,686.19) |
| **බදු වලට පෙර ශුද්ධ ආදායම** | | **(14,336,237.96)** | **(6,584,695.03)** |
| බදු | 09 | - | - |
| **බදු පසු අති විශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ආදායම** | | **(14,336,237.96)** | **(6,584,695.03)** |
| අති විශේෂ අයිතම | 10 | (2,390,644.60) | - |
| **ශුද්ධ ආදායම/(අලාභ)** | | **(16,726,882.56)** | **(6,584,695.03)** |

අත්.කලේ
සභාපති

අත්.කලේ
අධ්‍යක්ෂ

අත්.කලේ
ගණකාධිකාරී

පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2011.12.31 දිනට ශේෂය රු. | 2010.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ස්ථාවර වත්කම් | 11 | 93,582,198.05 | 83,608,866.26 |
| ආයෝජන | 12 | 62,748,000.00 | 62,748,000.00 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 13 | 7,475,341.61 | 7,240,108.84 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **163,805,539.66** | **153,596,975.10** |
| **ජංගම වත්කම්** | 14 | 41,213,523.19 | 36,096,337.48 |
| **මුළු වත්කම්** | | 205,019,062.85 | 189,693,312.58 |
| **ස්කන්ධය සහ බැරකම්** | | | |
| **මූලික ප්‍රාග්ධනය** | 15 | 69,907,594.42 | 69,907,594.42 |
| **රජයේ ප්‍රධාන** | | 72,750,229.02 | 72,750,229.02 |
| **විදේශ ණය** | | 8,368,214.00 | 8,368,214.00 |
| **මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබීම්** | 16 | 30,509,250.00 | 15,809,250.00 |
| **සමුච්චිත ආදායම්** | | (36,405,955.83) | (19,911,412.11) |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **145,129,331.61** | **146,923,875.33** |
| **ජංගම බැරකම්** | 17 | 59,889,731.24 | 42,769,437.25 |
| **මුළු බැරකම්** | | 205,019,062.85 | 189,693,312.58 |

අත්.කලේ
සභාපති

අත්.කලේ
අධ්‍යක්ෂ

අත්.කලේ
ගණකාධිකාරී

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

**පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය**

2011 දෙසැම්බර් 31 වැනි දිනට ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

| | | ප්‍රාග්ධනය | සමුච්චිත ආදායම | මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබීම් | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 2011.01.01 දිනට ශේෂය | J | 69,907,594.42 | (19,911,412.11) | 15,809,250.00 | 65,805,432.31 |
| 2011 වසරේ අරමුදල් ලැබීම් | | | | 14,700,000.00 | 5,537.29 |
| ලාභ අලාභ ගිණුම | | | (16,726,882.56) | | (16,726,882.56) |
| ගොඩනැගිලි සහ ව්‍යුහ | 10 | | (5,225.00) | | (5,225.00) |
| ස්ථාවර වත්කම් | 20 | | 191,816.00 | | 191,816.00 |
| පොළිය | 52 | | 5,537.29 | | 5,537.29 |
| රඳවාගත් බදු | 54 | | (553.73) | | (553.73) |
| පොළිය | 58 | | 5,537.29 | | 5,537.29 |
| රඳවාගත් බදු | 60 | | (553.73) | | (553.73) |
| පොළිය | 70 | | 4,429.84 | | 4,429.84 |
| රඳවාගත් බදු | 72 | | (442.98) | | (442.98) |
| පොළිය | 88 | | 1,034.96 | | 1,034.96 |
| පොළිය | 90 | | (103.50) | | (103.50) |
| වාහන ධාවන වියදම් | 104 | | (24,658.00) | | (24,658.00) |
| යන්ත්‍රෝපකරණ | 128 | | 77,040.00 | | 77,040.00 |
| දිරිදීමනා | 134 | | 2,000.00 | | 2,000.00 |
| නූඩ්ල්ස් විකුණුම් | 135 | | (720.00) | | (720.00) |
| ක්ෂය වීම් | | | (22,799.60) | | (22,799.60) |
| **එකතුව** | | 69,907,594.42 | (36,405,955.83) | 30,509,250.00 | 64,010,888.59 |

## පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය

| 2011 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | සටහන | 2011.12.31 දිනට ශේෂය රු. | 2010.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | | |
| බදු සහ අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ ලාභය | | (16,726,882.56) | (6,584,695.03) |
| **ගැලපීම් සඳහා :** | | | |
| ක්ෂය : පවත්නා වර්ෂය | | 9,223,202.24 | 6,396,239.21 |
| පාරිතෝෂික | | 1,272,454.50 | 975,047.50 |
| පොළී ආදායම් | | (6,445,044.33) | (7,305,322.44) |
| පොළී වියදම් | | 594,010.11 | 699,954.58 |
| බැංකු ගාස්තු | | 84,072.13 | 109,686.19 |
| පෙර වර්ෂයේ ගැලපීම් - ලාභ/අලාභ ගිණුම | | 232,338.84 | (263,907.69) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | | **(11,765,849.07)** | **(5,972,997.68)** |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම** | | | |
| (වැඩිවීම )/අඩුවීම ජංගම නොවන වත්කම් | 18 | (235,237.77) | (2,933,124.31) |
| (වැඩිවීම )/අඩුවීම ජංගම වත්කම් | 19 | (12,045,456.19) | (3,357,102.18) |
| වැඩිවීම /(අඩුවීම) ජංගම නොවන බැරකම් | | | |
| වැඩිවීම /(අඩුවීම) ජංගම බැරකම් | 20 | 17,120,293.99 | 5,334,826.73 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල්** | | **(6,926,249.04)** | **(6,928,397.44)** |
| **මෙහෙයුම් නොවන ක්‍රියාකාරකම්** | | | |
| පසුගිය වර්ෂයේ ගැලපුම් - විදේශ ණය | | | |
| බැංකු ගාස්තු | | (84,072.13) | (109,686.19) |
| පාරිතෝෂික ගෙවීම් | | (1,272,454.50) | (975,047.50) |
| අදායම් බදු ගෙවීම් | | | |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)** | | **(8,282,775.67)** | **(8,013,131.13)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම | | (19,027,517.64) | (1,290,234.36) |
| පසුගිය වර්ෂයේ ගැලපීම් - ස්ථාවර වත්කම් | | (169,016.39) | (11,775.00) |
| ශුද්ධ පොළී ලැබීම් | | 5,851,039.22 | 6,605,367.86 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)** | | **(13,345,494.81)** | **5,303,358.50** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | | |
| පසුගිය වර්ෂයේ ගැලපීම් - ප්‍රාග්ධන | | | |
| පසුගිය වර්ෂයේ ගැලපීම් - රජයේ ප්‍රධාන | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධනය | | 14,700,000.00 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ( ඇ)** | | **14,700,000.00** | **0.00** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) (අ)+(ආ)+(ඇ)** | | **(6,928,270.48)** | **(2,709,772.63)** |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ වල ආරම්භක ශේෂය** | 21 | **7,844,274.11** | **10,554,046.74** |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ වල අවසාන ශේෂය** | 22 | **916,003.63** | **7,844,274.11** |

# 1. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය.

## 1.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1.1 ආයතනයේ ප්‍රසිද්ධ කර ඇති ප්‍රතිඵල සහ මූල්‍යමය තත්ත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කර ඇත.

### 1.1.2 බදුකරණය

අදායම් බදු සඳහා වගකීම් වලට යටත් වේ.

## 1.2 වත්කම් සහ වත්කම් ඇගීමේ පදනම

### 1.2.1 ලැබිය යුතු ගිණුම්

බොහොමයක් ශේෂ වත්කම් සහ බැරකම් ආදිය මාරු කරන අවස්ථාවේදී තිබූ පරිදි වී අළෙවි මණ්ඩලයේ ගිණුම් වලින් ඉදිරියට ගෙන එනු ලැබ ඇති බැවින් ලැබිය යුතු ගිණුම්, බොල් සහ අවිනිශ්චිත ණය සඳහා වෙන් කිරීම් නොමැතිව සටහන් කර ඇත.

### 1.2.2. තොග

FIFO ක්‍රමවේදය අනුව තොග අගය කිරීම සිදු කර ඇත.
අවම පිරිවැය හෝ උපලබ්ධි අගයට අනුව තොග අගය කර ඇත.

### 1.2.3 ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් පිරිවැය යනු අත්පත් කර ගැනීම් හො ඉදිකිරීම් පිරිවැය සහ ඒ සඳහා වූ අනුෂංගික වියදම්ද ඇතුලත් පිරිවැය වේ. පහත සඳහන් පදනම මත සමුච්චිත ක්ෂය අඩුකර ස්ථාවර වත්කම් අගය දක්වා ඇත. ස්ථාවර වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම සිදුකල වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ක්ෂය වෙන්කිරීම් කරනු ඇත. ලියාහරින ලද හො බැහැර කරන ලද වත්කම් ක්ෂය වර්තමාන වර්ෂයේ සම්පූර්ණයෙන් වෙන් කරනු ඇත. වත්කම් ක්ෂය කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලැබේ..

### 1.2.4 ක්ෂය කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව 2011 වසරෙන් ක්ෂය වෙනස් කර ඇත. මිලදී ගත් වසරේ හෝ ඉදිකිරීම සිදු කල වසරේ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. ලියාහරින ලද හෝ බැහැරකල වසරේ වත්කම් ක්ෂය කිරීම් සිදු කර නැත. ක්ෂය අනුපාත පහත පරිදි වේ.

| | **ඵලදායී ජීව කාලය (වර්ෂ)** | **අනුපාතිකය වර්ෂයකට %** | **නව අනුපාතිකය % වර්ෂයකට %** |
|---|---|---|---|
| 1. ගොඩනැගිලි | 40 | 2.5% | 2.5% |
| 2. පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 13.3 | 7.5% | 7.5% |
| 3. උපකරණ | 10 | 10% | 10% |
| 4. ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10 | 10% | 10% |
| 5. විදුලිය සහ සවිකිරීම් | 10 | 10% | 10% |
| 6. පුස්තකාල පොත් | 10 | 10% | 10% |
| 7. වාහන | 5 | 20% | 20% |
| 8. දුරකථන සහ සවිකිරීම් | 5 | | 20% |
| 9. පරිගණක | 4 | | 25% |
| 10. කෘෂි - ගොවිපළ | 4 | | 25% |

ක්ෂය පදනම සෑම විටම පසුගිය වර්ෂය සමඟ අනුරූප වේ. ඉඩම් සඳහා ක්ෂය වෙන් කර නොමැත.

2005.01.21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, (මණ්ඩල පත්‍ර අංක 172) පර්යේෂණ, වාණිජ සහ සංවර්ධන අරමුණු සඳහා ගොඩනැගිලි , යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ භාවිතය වර්ගීකරණය කර ඇත. එකී තීරණයට අනුව, 2005 වර්ෂයේ සිට යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ සහ ගොඩනැගිලි ක්ෂය කිරීම ගණනය කර ඇත.

වර්තමාන වර්ෂ සඳහා මුළු ගොඩනැගිලි ධාරිතාවය 33%ක සහ යන්ත්‍ර 45% ක ක්ෂය අනුපාතිකයකින් සලකා බැලීමට නියමිතය. කෙසේවෙතත්, වාණිජ අරමුණු සඳහා භාවිතා කරන ලද තත්‍ය දින ගණන පදනම් කරගනිමින් ක්ෂයවීම් ගණනය කර ඇති අතර ශේෂ ධාරිතාවය පර්යේෂණ සහ සංවර්ධන අරමුණු සඳහා අන්තර්ග්‍රහණය කර ඇත.

### 1.3. වගකීම

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත අනුව, 2011.12.31 දින දක්වා පාරිතෝෂිත අරමුදල රු. 12,418,347.00 ක් වේ.

## 2. ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය භාණ්ඩාගාර අරමුදල් වේ.

2011 වර්ෂය සඳහා මහා භාණ්ඩාගරයෙන් ලැබූ අරමුදල් පහත පරිදි වේ.

පුනරාවර්තන – රු. 41,572,683.00

| | සටහන | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය රු. | 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය රු. |
|---|---|---|---|
| **මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල් - පුනරාවර්තන** | | | |
| ආදායම් සහ වියදම් ගිණුම | | 41,572,683.00 | 43,900,000.00 |
| **වෙනත් ආයතන වලින් ලද අරමුදල්** | | | |
| අපි වවමු රට නගමු ව්‍යාපෘතිය | | 20,359,952.21 | 1,624,951.70 |
| ගොවි භාර ව්‍යාපෘතිය | | 1,340,751.05 | |
| ලෝක ආහාර ව්‍යාපෘතිය | | 67,565.10 | |
| | | 21,768,268.36 | 1,624,951.70 |

| | | රු. | රු. |
|---|---|---|---|
| **වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සහල් අලෙවි ලාභ | 4.1 | (185,130.00) | (53,662.86) |
| යන්ත්‍ර විකුණුම් | 4.3 | 107,608.52 | 251,792.97 |
| නේවාසිකාගාර ආදායම් | 4.4 | 1,202,130.07 | 854,120.88 |
| පුහුණු පාඨමාලා | 4.5 | 1,011,079.79 | 1,133,196.40 |
| දේශනශාලා ගාස්තු | | 334,800.00 | 153,600.00 |
| ගෙවල් කුලී | | 230,121.64 | 83,650.00 |
